# අත්දැකීම් කිහිපයක්

රෝහණ විජේවීර

# අත්දැකීම් කිහිපයක්

*රෝහණ විජේවීර*

නියමුවා ප්‍රකාශන

අත්දැකීම් කිහිපයක් - රෝහණ විජේවීර

© නියමුවා ප්‍රකාශන

ISBN 978-955-8696-25-5

පළමු මුද්‍රණය - 2011 නොවැම්බර්

දෙවන මුද්‍රණය - 2011 දෙසැම්බර්

ප්‍රකාශනය - නියමුවා ප්‍රකාශකයෝ
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

දුරකතන - 011-2785612
ෆැක්ස් - 0112786050

විද්‍යුත් තැපෑල - niyamuwanews@gmail.com
වෙබ් - www.jvpsrilanka.com

මුද්‍රණය - ටී.ඩී.එල්. ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්,
43/43, වලව්වත්ත පාර,
ගංගොඩවිල,
නුගේගොඩ.

# වචනයක්

1971 ධවල භීෂණයෙන් අනතුරුව සිර ගෙවල්වලට සීමා කරන ලද ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය පංති සතුරා ඉදිරියේ පාවාදීම සඳහා පක්ෂයේ සිටි ද්‍රෝහීහු කටයුතු කළහ. එහෙත් ඔවුන්ගේ ද්‍රෝහී ක්‍රියාකාරිත්වය මර්දනයෙන් පසුව බිහිවුණක් නොව 71 අරගලයට පෙර සිටම පක්ෂය තුළ වර්ධනය වෙමින් පැවති බවත් එය මර්දනයට පාර කැපූ බවත් ජ.වි.පෙ. නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයා මෙම ලේඛනයෙන් පෙන්වා දෙයි.

කණ්ඩායම්වාදය පිළිබඳ ඔහුගේ සජීවී අත්දැකීම් ලේඛනයකට ගොනුකළ මෙම ලිපිය කණ්ඩායම්වාදය හඳුනාගැනීම හා එහි විකාශනය පිළිබඳ හැදෑරීම සඳහා වන අත්පොතක් බඳුය. ඓතිහාසික වැදගත්කමක් ඇති මෙම ලේඛනය මුද්‍රණය කර ජනතාව අතට පත්කළ යුතු යැයි අපි තිරණය කළේ, එහි කාලීන වැදගත්කම සලකාය. එසේම මෙම මුද්‍රණයේදී මුල් ලියවිල්ලේ ව්‍යාකරණ රීතියම පවත්වා ගැනීමට කටයුතු කෙරිණි. මාසයකටත් වඩා අඩු කාලයක් තුළ දෙවැනි මුද්‍රණය නිකුත් කිරීමට සිදුවීම මෙම කෘතිය පිළිබඳ පාඨක උනන්දුව කෙතරම්ද යන්න ප්‍රකට කරවා ඇත.

***නියමුවා ප්‍රකාශකයෝ***

2011 නොවැම්බර් 25

# පළමු මුද්‍රණයේ පෙරවදන

ජනතා විමුක්ති පෙරමුණ සිය නායකයන් තෝරාගනු ලබන්නේ, අන් කිසිදු පක්ෂයකට වඩා ප්‍රජාතන්ත්‍රවාදී ලෙසින්ය. ජනතා විමුක්ති පෙරමුණේ ව්‍යවස්ථාවට මුළුමනින්ම අනුකූලව වසර පහකට වරක් පවත්වනු ලබන මහ සමුළුවකදී එයට සහභාගි වන පක්ෂ සාමාජිකයෝ, ජනතා විමුක්ති පෙරමුණට ඊළඟ වසර පහ තුළදී නායකත්වය දී එය මෙහෙයවීම සඳහා මධ්‍යම කාරක සභාව තෝරා පත්කර ගනිති. එකී මධ්‍යම කාරක සභාව තෝරාගනු ලබන්නේ, පක්ෂ සාමාජිකයන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීම මගින්ය. මහ සමුළු හැරුණුවිට අවශ්‍යවූ විට විශේෂ මහ සමුළු හෝ නියෝජිත සමුළුද පැවැත්වීමට පක්ෂ ව්‍යවස්ථාව තුළ ප්‍රතිපාදන ඇතුළත්කර ඇත. එවැනි සමුළුවලදීද අවශ්‍යතාව පැනනැඟුණ විට ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභාව තෝරා පත්කර ගත හැක. මහ සමුළු, විශේෂ මහ සමුළු, නියෝජිත සමුළුවලදී හැර අන් කවර අවස්ථාවකදීවත් ජනතා විමුක්ති පෙරමුණට මධ්‍යම කාරක සභාවක් පත්කරගැනීමට නොහැකිය.

ජනතා විමුක්ති පෙරමුණට නිලධාරී මණ්ඩලයක් එනම් දේශපාලන මණ්ඩලයක් තෝරා පත්කරගනු ලබන්නේද එහි මධ්‍යම කාරක සභාව විසින්ය. පක්ෂ සමුළුවකදී ව්‍යවස්ථානුකූලව තෝරා පත්කරගනු ලබන මධ්‍යම කාරක සභාව එහි පළමු කටයුත්ත ලෙස කළ යුත්තේ, පක්ෂයට නිලධාරී මණ්ඩලයක් නොහොත් දේශපාලන මණ්ඩලයක් තෝරා පත්කරගැනීමය. එය තෝරා පත් කරගත යුතු වන්නේද මධ්‍යම කාරක සභිකයන්ගේ ඡන්දයෙනි. මධ්‍යම කාරක සභියන් අතරින් කිහිපදෙනෙක් පමණක් දේශපාලන මණ්ඩල සභිකයන් ලෙස තෝරා පත් කරගනු ලැබේ. කිසියම් මධ්‍යම කාරක සභිකයෙකු දේශපාලන මණ්ඩලයට තෝරා පත්කර ගනු ලැබීමට නම් ඔහු හෝ ඇය සමස්ත මධ්‍යම කාරක සභාවේ සාමාජිකයන් අතරින් අඩකට වැඩිදෙනෙකුගේ ඡන්දය ලබාගත යුතුය.

ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව පිළිබඳ සීමාවක් පැනවී ඇත. ඒ අනුව ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව කිසිදු විටෙක එහි මධ්‍යම කාරක සභාවේ සාමාජික සංඛ්‍යාවෙන් හරි අඩකට වඩා වැඩි නොවිය යුතුය.

ඉහත සඳහන් පැහැදිලි කිරීම මෙම පෙරවදනේ ආරම්භය ලෙස එකතු කළේ හේතු සහිතවය. ජනතා විමුක්ති පෙරමුණ සිය 6 වැනි සමුළුව පවත්වා නව මධ්‍යම කාරක සභාව පත්කර ගත්තේ, 2011 පෙබරවාරි 10 වෙනිදාය. එතැන්සිට ගතවූයේ මාස 8ක් පමණි. මේ මොහොතේ ජනතා විමුක්ති පෙරමුණ යළිත් වතාවක් කණ්ඩායම්වාදී ප්‍රශ්නයකට මුහුණදී සිටියි. වසර 46ක අභිමානවත් ඉතිහාසය තුළ අතීතයේදීද ජනතා විමුක්ති පෙරමුණට කිහිපවරක් කණ්ඩායම්වාදී ප්‍රශ්නවලට මුහුණ දෙන්නට සිදුවිය. ඒ කිනම් අවස්ථාවකදීවත් ජනතා විමුක්ති පෙරමුණ කණ්ඩායම්වාදී ප්‍රශ්නවලට යටවූයේ නැත. ඒ හැම විටම කණ්ඩායම්වාදී ප්‍රශ්නද ඒවා දියත්කළ නායකයන්ද මුළුමනින්ම පරදවාලීමට සමත්විය. ඒ අයුරින්ම වර්තමාන කණ්ඩායම්වාදී ප්‍රශ්නයද, එය දියත්කළ අයද නිසැක වශයෙන්ම පරාජය කර ජනතා විමුක්ති පෙරමුණද එහි ව්‍යවස්ථාවද එහි අභිමානයද ශක්තියද ආරක්ෂාකරන බව අපි සහතික කරමු.

ජනතා විමුක්ති පෙරමුණ මේ මොහොතේදී මුහුණදී ඇති කණ්ඩායම් ප්‍රශ්නය ඉස්මතු වූයේ, පක්ෂය තුළ සිටි කිහිප දෙනෙක් පක්ෂ ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් ජනතා විමුක්ති පෙරමුණේ ''බලය ඇල්ලීමට'' කණ්ඩායමක් ලෙස කුමන්ත්‍රණය කළ නිසාය.

පක්ෂයේ නායක මණ්ඩලය එනම් දේශපාලන මණ්ඩලය වෙනස් කිරීමට මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකුට සාමාජිකාවකට හෝ සාමාජිකයන් කිහිපදෙනෙකුට අවශ්‍ය වන්නේනම් එසේ කිරීම සඳහා පක්ෂ ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන තිබේ. ඒ ප්‍රතිපාදන අනුව දේශපාලන මණ්ඩල සභිකයෙකු හෝ සභිකයන් දේශපාලන මණ්ඩලයෙන් ඉවත් කිරීමට හෝ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයන් අතරින් එක් අයෙකු හෝ වැඩිදෙනෙකු දේශපාලන මණ්ඩලයට පත් කළහැක්කේ ඒ සඳහා මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කෙරෙන යෝජනාවක් ස්ථිරවීමෙන් පසු එම යෝජනාව මධ්‍යම කාරක සභාවේ ඒකමතිකව සම්මත කිරීමෙන් හෝ මධ්‍යම කාරක සභාවේ බහුතරය විසින් සම්මත කිරීමෙනි.

නමුත් එසේ කරනු වෙනුවට සිදුවූයේ ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභාවේ හා දේශපාලන මණ්ඩලයේ සාමාජිකයන් අතරින් කිහිපදෙනෙක් පක්ෂයේ ''බලය ඇල්ලීමේ'' අරමුණ ඇතිව ''කුමන්ත්‍රණකාරී කණ්ඩායමක්'' ගොඩනගා එය පුළුල් කිරීමේ යුහුසුළු වීමකි. ඔවුහු ඒ සඳහා පක්ෂයේ මතවාදී ඒකාග්‍රතාවය උල්ලංඝනය කළහ. එසේම ජනතා විමුක්ති පෙරමුණේ සංවිධාන විනය උල්ලංඝනය කළහ.

පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ හෝ මධ්‍යම කාරක සභාවේ අනුදැනුම අනුමැතිය නොමැතිව දෙමළ බෙදුම්වාදී මතවාදයට පක්ෂ මතයක් හොර රහසේම පක්ෂයේ ප්‍රකාශන තුළට රිංගවීමට මොවුහු කටයුතු කළහ. (අවුරෝරා පෙබරවාරි-මාර්තු කලාපයේ 'ඊලාම් වෙනුවට චිල්ලාම් ලිපිය.') එසේ කරමින් ජනතා විමුක්ති පෙරමුණේ ජාතික ප්‍රශ්නය පිළිබඳ නිවැරදි ස්ථාවරය අභියෝගයට ලක්කර ඇත. ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයා විසින් ඉදිරිපත් කළ නිවැරදි මතවාදයට පිටුපා ඇත. එසේම පොදු ජන මානසිකත්වය නොසලකා පොදු ජනතාව සංවිධානය කිරීමට බාධා කරන හුදු විප්ලවීය වාග් පාඨ දොඩවන හා නිදහස්වාදී ලෙස කටයුතු කරන ට්‍රොට්ස්කිවාදී කල්ලියක ලක්ෂණ පෙන්වා ඇත. එම නිසාද මොවුහු රෝහණ විජේවීර සහෝදරයාගේ ඉගැන්වීම්වලට මෙන්ම භාවිතයටද පිටුපා සිටිති. අනික් අතට මේ කණ්ඩායම්වාදීන් විසින් පක්ෂයේ සංවිධාන ජාලය අවුල් කරමින් හරස් සම්බන්ධතා පවත්වා පක්ෂ සාමාජිකත්වය නොමග යවා ඇත; රවටා ඇත; බොරුබේගල් අවලාද පතුරවා ඇත. එමගින් පක්ෂයත් පක්ෂයේ අවංක නායකයන් හා සාමාජිකයනුත් පක්ෂය හා රට ඉදිරියේ හෑල්ලුකර ඇත.

අපි මුලදීම සඳහන් කළ පරිදි පක්ෂය මෙවැනි ද්‍රෝහීකම්වලට මුහුණ දුන් පළමු අවස්ථාව මෙය නොවේ.

රෝහණ විජේවීර සහෝදරයා පක්ෂය ගොඩනගද්දී, ධර්මසේකර කණ්ඩායම, ලොකු අතුල කණ්ඩායම, ජනතා සංගම් කණ්ඩායම සහ හතරදෙනාගේ කල්ලිය බිහිවිය. එයට වගකිව යුත්තේ රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු පක්ෂය නොවේ. කණ්ඩායම්වාදීන්ය. රෝහණ විජේවීර සහෝදරයා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ පූර්ණ මෙහෙයවීම පිට මිනීමරු කණ්ඩායම් විසින් ඝාතන කරනු ලැබූවාට පසු පක්ෂය තුළ කණ්ඩායම්වාදය හිස එසවීය. ඒ කමල් දේශප්‍රියගේ කණ්ඩායම විමල් වීරවංශගේ කණ්ඩායම හා වර්තමානයේ බිහිවී ඇති කණ්ඩායමයි.

විප්ලවවාදී පක්ෂ වේගවත් වර්ධනයක් අත්පත් කරගන්නා විටද අනෙක් අතට පසුබෑම්ද අත්පත්කරගන්නා විටද එම පක්ෂ තුළ කණ්ඩායම්වාදීන්ද කණ්ඩායම්ද බිහිවන බවට අපට ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ හා අපේම ඉතිහාසය තුළින්ද ඕනෑතරම් සාක්ෂි සොයාගත හැකිය.

''අත්දැකීම් කිහිපයක්'' නමින් අප ඔබ අතට පත්කරන කණ්ඩායම්වාදය හා පාවාදීම් පිළිබඳ තම අත්දැකීම් විස්තර කරමින් රෝහණ සහෝදරයා විසින් ලියන ලද මෙම පොත් පිංච වර්තමානයේ මතුව ඇති කණ්ඩායම්වාදයේ ස්වභාවය එහි හානිකර බවත් තේරුම්ගැනීමට ප්‍රයෝජනවත් වනු ඇත.

71 අප්‍රේල් නැගිටීමට පෙර පක්ෂය තුළ පැවති කණ්ඩායම් අප්‍රේල් නැගිටීමෙන් පසුව පක්ෂය පිළිබඳවත් රෝහණ විජේවීර සහෝදරයා පිළිබඳවත් සිරගෙවල් තුළත් සිරගෙවල්වලින් පිටතත් ගෙනගිය මහාපරිමාණ බේගල්, නින්දා අපහාස, සත්‍ය කරුණු විකෘතිකිරීම් හා චරිත ඝාතන පිළිබඳවත් එදා පැවති ජාතික හා ජාත්‍යන්තර දේශපාලනය පිළිබඳවත් විග්‍රහ කරමින් රෝහණ සහෝදරයා අප්‍රේල් නැගිටීමේ සිට කෙටි කලක් ඇතුළත බන්ධනාගාරය තුළදී ඉතා දුෂ්කර තත්වයන් තුළ ලිපියක් ලිව්වේය. සිය අත්දැකීම් සහිත එම ලිපිය ලියා බන්ධනාගාරවල, සිරකඳවුරු තුළ හා ජනතාව අතර හා වනයේ විසිරී සිටි සහෝදර සහෝදරියන් අතට පත්කළේ එදා බොරුබේගල්, විකෘතිකිරීම්, අපහාස කිරීම් ඉදිරියේ, වික්ෂිප්තව සිටි පක්ෂයේ අවංක සහෝදර සහෝදරියන්ට සත්‍ය හෙළිකිරීමටත්, සතුරන්ගේ සැබෑ ස්වභාවය තේරුම්ගැනීමට පහසු කිරීමටත් විශේෂයෙන්ම කණ්ඩායම් ප්‍රශ්න පංති සතුරා විසින් සිය වාසියට යොදාගන්නා සැටිත් පැහැදිලි කිරීමටත්ය. මෙම පොත් පිංච තුළ අඩංගු වන්නේ, රෝහණ විජේවීර සහෝදරයා විසින් එදා ලියන ලද එම වටිනා ලිපියයි.

රෝහණ විජේවීර සහෝදරයා විසින් එම ලිපිය තුළ ගොනුකරන ලද ජාතික හා ජාත්‍යන්තර අත්දැකීම් ගොන්න, මේ මොහොතේ ජනතා විමුක්ති පෙරමුණ විනාශකළ හැකියැයි සිතන දේශපාලන අඳබාලයන් විසින් දියත් කරනු ලැබ ඇති කණ්ඩායම්වාදයත් ඔවුන් විසින් ජනතා විමුක්ති පෙරමුණටත් දිවිහිමියෙන් ජනතා විමුක්ති පෙරමුණ ආරක්ෂා කිරීමට ඇප කැපවී සිටින එහි නායක නායිකාවන්ට එහි සාමාජික සාමාජිකාවන්ට, හිතවතුන්ට හා හිතවතියන්ටත් එරෙහිව වපුරන සාහසික අවලාද බොරු බේගල් ව්‍යාපාරයත් තේරුම්ගැනීමට දැවැන්ත පහසුවක් වනවාට සැක නැත. ඔබ කළ යුත්තේ ලොකු අතුල, ටී. ඩී. සිල්වා, කුමානායක, පියතිලක, පොඩි අතුල, සුනන්ද, කුලරත්න

බණ්ඩා, ධර්මසේකර යනාදී නම් වෙනුවට අද ජනතා විමුක්ති පෙරමුණ තුළ කණ්ඩායම්වාදය දියත්කර ඇති ද්‍රෝහීන්ගේ නම් ආදේශ කිරීම පමණකි.

රෝහණ සහෝදරයා මෙම විග්‍රහය මගින් ඉදිරිපත්කර ඇති පරිදිම පක්ෂයේ වර්තමාන ද්‍රෝහීන් මේ මොහොතේ කරමින් ඇත්තේ, ''ජාත්‍යන්තර වශයෙන්ද ජාතික වශයෙන්ද කාලාන්තරයක් මුළුල්ලේ අත්හදා බලන ලද මතුපිටින් හඳුනාගත නොහැකි සංකීර්ණ ද්‍රෝහීකම්ය, විප්ලවයේ නමින් විප්ලවයට හතුරුකම් කිරීමත් නිර්ධනපංති විප්ලවවාදී පක්ෂය ඇතුළතින් බිඳදැමීමත් ඇදහිය නොහැකි මහා පච, බේගල්, නින්දා, අපහාස, අවලාද නැගීමත් සත්‍ය කැරුණු විකෘති කොට ඉදිරිපත්කිරීමත්ය.

අතීතයේදී අපේ පක්ෂය කණ්ඩායම්වාදය හේතුකොටගෙන ලැබූ පරාජයන් පිළිබඳව රෝහණ විජේවීර සහෝදරයා විසින් ලියන ලද මෙම ලිපියෙන් මනා අවබෝධයක් ලබාගත හැකි බවට අපි විශ්වාස කරමු.

ඒ අනුව අපේ පක්ෂය මුහුණදී ඇති කණ්ඩායම් හා එයට වගකිවයුතු කණ්ඩායම්වාදීන් පක්ෂය විනාශකරන්නටත් ලාංකේය වාමාංශික ව්‍යාපාරයේ ගමන බාල කරන්නටත් ගන්නා ප්‍රයත්නය ඉතා මැනෙවින් තේරුම් ගත යුතුය. ඒ අවබෝධය ඇතිව පක්ෂයට එරෙහිව ඉස්මතුවී ඇති කුමන්ත්‍රණකාරී කණ්ඩායමත් ඔවුන් දියත් කර ඇති විනාශකාරී කණ්ඩායම්වාදයත් මුළුමනින්ම පරාජය කිරීමට පෙරට එන්න, සටන්වදින්න, නියත ජයග්‍රහණය කරා එලඹෙන්න, සමාජවාදී ශ්‍රී ලංකාවක් බිහිකරන්න.

**අධිරාජ්‍යවාදයට විනාශය! - ජනතාවට විමුක්තිය!!**
**ධනවාදයට විනාශය!!! - සමාජවාදයට විජයග්‍රහණය!!!!**

සෝමවංශ අමරසිංහ
නායක
ජනතා විමුක්ති පෙරමුණ

සහෝදරවරුනි,

ඔබේ ප්‍රශ්න ගැන දැනගන්න ලැබුණා. අවස්ථාවේ හැටියට ඒ පිළිබඳව ඉතාමත් ලුහුඬින් සත්‍ය තොරතුරු සැපයීම බලාපොරොත්තුවයි. අප්‍රේල් සිද්ධියෙන් පසුව ව්‍යාපාරය පිළිබඳවත් මා පිළිබඳවත් කඳවුරු තුළත් සිරගෙවල් තුළත් පිටතත් විශාල ප්‍රමාණයෙන් සත්‍ය කරුණු විකෘති කිරීම්, මහා පරිමාණ බේගල් ඇදබෑම්, නින්දා, අපහාස, අවලාද කිරීම්, පමණක් නොව චරිත ඝාතන පවා කරගෙන ගොස් තිබෙන බවත් කරගෙන යමින් සිටින බවත් හොඳින් දනිමි. ඒවායේ කැත අරමුණු මොනවාද? ඒවාට හේතු මොනවාද? ඒවා කවුරුන් විසින් කුමන ඵල ප්‍රයෝජනයක් සඳහා කරනු ලබන්නක්ද? ඒවායේ යථාර්ථය කුමක්ද? යන්න මාක්ස් ලෙනින්වාදියෙකු වශයෙන් මට නම් රහසක් නොවේ. මේවා ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයට අලුත් දේවල් නොවේ. එබැවින් අපි එවැනි අවලාද අපහාස ගැන පුදුම නොවෙමු. පුදුමය නම් පංති සතුරන් විසින් විප්ලවවාදීන්ට එරෙහිව, විප්ලවවාදී ව්‍යාපාරයනට එරෙහිව ඔවැනි කැත නින්දා සහ අපහාස, අවලාද නොනගා සිටීවි යැයි සිතීමය. මේ තත්වයන් අපට උරුම වූ හෝ ආවේණික වූවක් නොවේ. ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ මුල් උපතේ පටන්ම සකලවිධ ප්‍රතිගාමී සූරාකන්නන් විසින් නොයෙකුත් බාධක, මැඩලීම් කරමින් ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය විනාශ කිරීමට දැරූ ප්‍රයත්නයන් කිසිවෙකුටත් රහසක් නොවේ.

මුලදී එය ගණන් නොගනිමින්ද, පසුව එම ක්‍රියාදාමය අවලංගු බව පෙනෙනු විට ධනේශ්වර රාජ්‍ය යන්ත්‍රය යොදවා කුරිරු ලෙස විප්ලවවාදී ව්‍යාපාරයේ ඇපකැප වූවන් ඝාතනය කිරීම මගින්ද, සිරගත කිරීම මගින්ද, ඇතැම් තැන්හි මුළුමහත් විප්ලවීය ජන සමූහයා සමූල ඝාතනය කිරීම මගින්ද, ධනේශ්වර පංති අරමුණු ඉටු නොවන අවස්ථාවල කුලියට ගත් ධනේශ්වර පංති චින්තකයින් ලවා නිර්ධන පංති විප්ලවවාදී ව්‍යාපාරයට ධනේශ්වර පංතියේ පැත්තෙන් ''න්‍යායාත්මකව'' ප්‍රහාර එල්ල කිරීමේ සූක්ෂ්ම යටිකූට්ටු ක්‍රියාමාර්ගවලින්ද, පසුව ධනේශ්වර පංතියේ ඔත්තුකරුවන් සහ බැලමෙහෙකරුවන් නිර්ධන පංති ව්‍යාපාරය තුළට රිංගවා ඔවුන් මගින් නිර්ධන පංති ව්‍යාපාරය ඇතුළතින් බිඳ දමා, අභ්‍යන්තරයෙන් පිරිහවා, ධනේශ්වර පංතිය හමුවේ හීලෑ කරගැනීමටත්, උත්සාහ කර මේ සියල්ල ඵල රහිත වූ විට වියරු වැටී සියල්ල දැවීමේ, සියල්ල විනාශ කිරීමේත් සියල්ල ඝාතනය කිරීමේ ම්ලේච්ඡ ක්‍රියාමාර්ගයටත් අවතීර්ණ වී එයිනුදු බලාපොරොත්තු වූ අරමුණ විප්ලවීය ව්‍යාපාරය සමූල ඝාතනය කිරීමේ අරමුණ මුළුමනින්ම සාක්ෂාත් කරගැනීමට නොහැකි වූ තැන්හි විප්ලවීය ව්‍යාපාරය කෙරෙහි බහුජන සමූහයාගේ ඇති පක්ෂපාතීත්වය හා භක්තිය විනාශ කිරීමටත් විප්ලවාදී ව්‍යාපාරයේ ඇපකැප වූවන් වගකිවයුත්තන් කෙරෙහි ජනතාවගේ ආදරය හා විශ්වාසය පළුදු කර නැතිභංග කර දැමීමේ නින්දිත චේතනාවෙන් විප්ලවවාදී ව්‍යාපාරයට විරුද්ධවත් එහි පුරෝගාමීන්ටත් විරුද්ධව කැත නින්දිත පිළිකුල්සහගත අසත්‍ය චෝදනා, නින්දා අපහාස, අවලාද, අවමාන කරමින් චරිත ඝාතනයන්හි පවා යෙදෙනවා.

විප්ලවයට එරෙහිව, විප්ලවවාදී ව්‍යාපාරයන්ට එරෙහිව, විප්ලවවාදීනට එරෙහිව, ධනේශ්වර පංතිය මුළුමහත් පංති සටන් ඉතිහාසය පුරා ක්‍රියාවේ යෙදූ ප්‍රතිවිප්ලවවාදී ක්‍රියාමාර්ග ඔන්න ඔය ආකාරයි. ධනේශ්වර පංතියේ චෝදනාවට ලක් නොවූ එකදු සැබෑ විප්ලවවාදී ව්‍යාපාරයක් ලොව මෙතෙක් තිබුණාද? ධනේශ්වර පංතියේ නින්දා අපහාස අවලාදවලට ගොදුරු නොවූ එකදු විප්ලවවාදී නායකයෙක් ලොව මෙතෙක් සිටියාද? ධනේශ්වර පංතිය සහ ඔවුන්ගේ සකලවිධ විවෘත ආවෘත ගැත්තෙක්, ඒජන්තවරයෙක් විසින්ම අවමන් කරනු නොලැබූ, පරිභවයට පත්කරනු නොලැබූ, විප්ලවීය ක්‍රියාමාර්ගයක් ලොව මෙතෙක් තිබුණාද? ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ අසමසම අසහාය නායකයින් වන මාක්ස්, එංගල්ස්, ලෙනින්

ඇතුළු ජාත්‍යන්තර විප්ලවවාදී ව්‍යාපාරයේ ප්‍රගමනයට උර දුන් සෑම සියලු කීර්තිමත් විප්ලවවාදීයෙක්ම ප්‍රතිගාමී සූරාකන පංතීන්ගේත් උන්ගේ මිතුරන්ගේ සහ ගැත්තන්ගේ අවලාද අපහාසවලට පාත්‍ර වූ බව මුළුමහත් පංති සටන් ඉතිහාසයම අපට හොඳාකාරවම පෙන්නුම් කරනවා. එවැනි තත්වයන් යටතේ ජනතා විමුක්ති පෙරමුණටත් එය ගොඩනැගීමේ අවංකව කැපවුණ අයටත් පෞද්ගලිකව මටත් එරෙහිව සකලවිධ පංති සතුරන් විසින්ම ඔවුන්ගේ වෙස් වළාගත් වෛවාරණ මිතුරන් සහ ඒජන්තලා විසින් අවලාද අපහාස නින්දා ගැරහීම් කිරීම ගැන මම පසුතැවිලි නොවෙමි. මම එය ඔවුන්ගෙන් බලාපොරොත්තු නොවූවක් නොවෙමි. සෑම අව්‍යාජ විප්ලවවාදියෙක්ම, විප්ලවවාදී ව්‍යාපාරයක්ම වත්මන් තත්වයන් යටතේ ධනේශ්වර පාලක පංතීන්ගෙන්, කෝප වී වියරු වැටුණු සූරාකන්නන්ගේ නිර්ධන පංති ව්‍යාපාරයට ද්‍රෝහි වී සතුරන් අතට පැන ගියවුන්ගෙන් වෙස් වලාගත් සතුරු ඒජන්තවරුන්ගෙන්, කිසිම පැකිලීමකින් තොරව සිය පෞද්ගලික ලාභාපේක්ෂාවන් සහ තිරශ්චිතීන් සඳහා සිය ජීවිත ගලවා ගැනීම සඳහා, සිය නිදහස සඳහා නිර්ධන පංතියේ ලේ පාවාදීමේ නින්දනීය කටයුත්ත කළවුන්ගෙන් උත්සන්න වන පංති සටන් රළ වේගය හමුවේ ඔරොත්තු දීමේ ශක්තියකින් තොරව මුනින් වැටුණවුන්ගෙන්, ඔවැනි තත්වයන් බලාපොරොත්තු විය යුතුය.

''සතුරා විසින් පහර දෙනු ලැබීම නරක දෙයක් නොව හොඳ දෙයකි. පුද්ගලයෙක් පිළිබඳවත්, දේශපාලන පක්ෂයක් පිළිබඳවත් මෙය සත්‍යයකි. සතුරා අපට පහර දෙන විට එයින් හැඟවෙන්නේ අප නිවැරැදි බවයි. සතුරාත් අපත් අතර පැහැදිලි බෙදා වෙන්කිරීමක් ඇති බවයි. සතුරා අප වඩ වඩාත් කළුකර පෙන්වයි නම් එය ඊට වඩාත්ම හොඳය'' මේ මාඕ අදහස් දක්වා ඇති අයුරුයි. සතුරා අපට පහර දෙන විට ඔහු එසේ කරනුයේ අප සතුරාට රිදවන හෙයිනි, අපේ ක්‍රියාකලාපය විසින් සතුරාට මහත් හානි පමුණුවන හෙයිනි, සතුරා අපට පහර නොදී අපේ ගුණ ගයත්නම් එයින් හැඟෙනුයේ, අප සතුරාට ප්‍රයෝජනවත් වන විදියට කටයුතු කර ඇති බව සහ සතුරාගේ පැත්තෙන් සිටින බවය. මෙලෙස බලන විට ලාංකීය නිර්ධන පංති විප්ලවයට දකුණෙන් මෙන්ම වමෙන්ද සත්‍යය විකෘති කරමින් අභූත චෝදනා, නගන ද්වේෂසහගත අපවාද අවලාද නගන සෑම සියලු කළු බලවේගයක් විසින්ම කරනුයේ, නරක දෙයක් නොව හොඳ දෙයකි. ඇත්ත වශයෙන්ම අපහාස කිරීම් අවලාද නැගීම් මගින් සතුරා නොදැනුවත්වම අපට මහගු සේවයක්

කරයි. ඒ කුමක්ද? එළිපිට සිටින හා සැඟවුණු පංති සතුරන් සහ ද්‍රෝහීන් අපට අවලාද නගන විට අපහාස කරන විට ඒවායේ යථාර්ථයත් අරමුණත් ඒවා ඉදිරිපත් කරන්නේ කවුරුන් විසින්ද? කුමක් සඳහාද? යන්නත් තේරුම් ගනිමින් අවංක, අව්‍යාජ විප්ලවාදීන් සත්‍යයේ පැත්තේ සිටගෙන, විප්ලවයේ පැත්තේ සිටගෙන ප්‍රශ්න තේරුම් ගන්නවා. මේ ක්‍රියාදාමය මගින් එක් පැත්තකින් සැබෑ විප්ලවවාදීනුත් අනෙක් පැත්තෙන් කැත අවස්ථාවාදීනුත් හෙළි පෙහෙළි කර ගැනීමට මහත් ආධාරකයක් වෙනවා.

අද ධනේශ්වර පංතිය මුහුණ පා සිටින බැරෑරුම්ම, විශාලතම ප්‍රශ්නය කුමක්ද? එය අන් කිසිවක් නොව නිර්ධන පංතියේ පැත්තෙන් එල්ලවන විප්ලවීය තර්ජනයයි. එය පිටු දැකීමට මග හරවා ගැනීමට නම් විප්ලවීය ව්‍යාපාරය විනාශකර දැමිය යුතුය. විප්ලවීය ව්‍යාපාරයක් ගොඩනැගෙනුයේ නිර්ධන පංති බහුජන සමූහයා විප්ලවීය න්‍යායක් ග්‍රහණය කර ගත් විට එම විප්ලවීය බලවේගය සංවිධාන කිරීමෙන් සහ ක්‍රියාත්මක කිරීමෙනි. ධනේශ්වර පංතියට, ධනේශ්වර ක්‍රමය තුළ නිර්ධන පංතිය, පංතියක් වශයෙන් විනාශකර දැමිය නොහැකිය. ධනේශ්වර සමාජ ක්‍රමය තුළ අනිවාර්යයෙන් බිහිවන සහ පවතින සමාජමය සාධකයකි, නිර්ධන පංතිය. එබැවින් ධනේශ්වර පාලක පංතීන්ගේ මුළුමහත් උත්සාහය වනුයේ නිර්ධන පංතිය විප්ලවීය බලවේගයක් බවට පත්වීම වළක්වාලීමයි. නැතහොත් විප්ලවීය බලවේගයක් වශයෙන් පැවැත්ම විනාශකිරීමයි. ධනේශ්වර පංතිය ක්‍රියාකර ඇත්තේත්, ක්‍රියාකරනුයේත් මේ අභිප්‍රායෙන් යුතුවය. මේ කටයුත්ත සඳහා ධනේශ්වර පංතිය තමන් සතු තමන් අභිමුව ඇති සෑම සියලු පහත්, නිවට, නින්දනීය අවියක්ම උපාය උපක්‍රමයක්ම යොදාගෙන තිබෙනවා. ඔවුන් ඒ සඳහා කළ හැකි හැම සියල්ලක්ම කරනවා. මේ ක්‍රියාදාමයේදී ඔවුන් ජාත්‍යන්තර වශයෙන් කාලාන්තරයක් මුළුල්ලේ අත්හදා බලන ලද සංකීර්ණ උපක්‍රමයන් තමා, විප්ලවයේ නමින් විප්ලවයට හතුරුකම් කිරීමත්, නිර්ධන පංති විප්ලවාදී පක්ෂය ඇතුළතින් බිඳවීමත් ඇදහිය නොහැකි මහා පව, බේගල්, නින්දා, අපහාස, අවලාද නැගීමත් සත්‍ය කරුණු විකෘති කොට ඉදිරිපත් කිරීමත්.

ලාංකීය ධනේශ්වර පාලක පංතිය ජනතා විමුක්ති පෙරමුණ මර්දනය කිරීමේ කටයුත්තේදී ඔවුන්ගේ ජාත්‍යන්තර ධනපති පංති සගයින් පුරා ශතවර්ෂයකටත් අධික කාලයක් මුළුල්ලේ පංති සටනේදී තම ප්‍රතිවිප්ලවීය කාර්යභාරයන් ඉටුකරමින් ලද අත්දැකීම්

සම්භාරයම අද මේ රටේ උපයෝගී කරගනිමින් සිටිනවා. එනම් කුරිරු වෙඩි උණ්ඩවල පටන් අවස්ථාවාදී වාග්මාලා හරහා ව්‍යාජ විප්ලවවාදී විවේචන සහ න්‍යායන් හරහා, පිළිකුල් සහගත අවලාද, අපහාස දක්වා සෑම ප්‍රතිවිප්ලවීය අවියක්ම ජනතා විමුක්ති පෙරමුණ මර්දනය කිරීමට යොදවා තිබෙනවා. වෙඩි උණ්ඩයත්, යුද ටැංකියත්, බයිනෙත්තු, රයිෆල්, මැෂින් තුවක්කු හා හෙලිකොප්ටර්, ගුවන් යානාත් ධනේශ්වර පංතිය සතු එකම ආයුධය නොවේ. ත්‍රිවිධ හමුදා, පොලිසිය වැනි සන්නද්ධ මර්දන හමුදා ධනේශ්වර පංතිය සතු එකම ප්‍රහාරක සේනාංකය නොවේ. මේවා වලංගු නොවන තැන මේවා ප්‍රයෝජනයට ගෙන නිර්ධන පංති ව්‍යායාමය විනාශ කළ නොහැකි තැන ධනේශ්වර පාලක පංතීහු තමන් සතු ප්‍රතිවිප්ලවීය අවි ගබඩාවෙන් අනිකුත් නින්දාසහගත අවි ආයුධ මෙවලම් නිර්ධන පංති විප්ලවවාදී ව්‍යාපාර විනාශකිරීම සඳහා උපයෝගී කරගනු ලැබේ. ධනේශ්වර පංතිය සතු ප්‍රතිවිප්ලවීය අවි ගබඩාව ඉතා පුළුල්ය. එසේම ඒ ප්‍රතිවිප්ලවීය අවි පාවිච්චිකිරීම සඳහා යොදනු ලබන සේනාංකද වෛවාරණ්‍ය මෙන්ම විශාලය. අවි අමෝරාගෙන සටන් බිමේ විවෘතවම එළියට එන යුද සෙබළා පොලිසියේ සිරමැදිරියේ අමානුෂිකව නමුත් මුහුණට මුහුණලා විවෘතවම පහර පිට පහර දෙන කුරිරු පොලිස් භටයා මෙන්ම ධනේශ්වර පාලක පංතියේ පංති අවශ්‍යතාවයන් සහ අරමුණු ඉටුකිරීමට, ඊටත් වඩා වෙනස් තත්වයන් යටතේ වෙනස් ආකාරයෙන් කටයුතු කරන්නනෝද සිටිති. මේ පුද්ගලයින් ධනේශ්වර පංතියට කරන සේවය යුද සෙබළා හෝ පොලිස් භටයා කරන සේවය මෙන් එක එල්ලේම එක පාරටම කෙනෙකුට විවෘතව දැක ගත නොහැකිය. ඔවුන් කරන සේවය වක්‍ර ආකාරයකින් ඉතා සියුම් ලෙස සහ සැඟවී සිටගෙන කරන්නෙකි. ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ ඉතිහාසය තුළ හොඳින් එබී බැලුවහොත් අපට එවැනි පුද්ගලයන් සහ තත්වයන් විශාල ප්‍රමාණයක් සොයාගත හැක.

ජනතා විමුක්ති පෙරමුණ විනාශ කිරීම සඳහා ලංකාවේ ධනේශ්වර පාලක පංතිය සිය ඔත්තුසේවා, පොලිසිය, ත්‍රිවිධ හමුදා, ස්වේච්ඡා සේවක බල ඇණි, ග්‍රාමීය ආරක්ෂක සේනාංක, විදේශ අවි ආයුධ ආම්පන්න, හදිසිනීතිය, ඇඳිරිනීතිය, මහජන ආරක්ෂක පනතේ වෙනත් විශේෂ වගන්ති සියල්ල පාවිච්චි කළ බව ඔබ හොඳින් දන්නෙහිය. ධනේශ්වර පංතිය මුළු වැර යොදා මුළු ශක්තිය හා දක්ෂතාවයන් යොදා තම ජාත්‍යන්තර පංති සගයන්ගේ ආධාර, අනුබල හා උපදෙස්

ලබාගෙන විශාල මිනිස් සංහාරයක් මගින්, අපේ ඉතිහාසයේ මෑත වකවානුවේ කෙරුණු ම්ලේච්ඡ මිනිස් ඝාතනය මගින් ජනතා විමුක්ති පෙරමුණ විනාශ කර දැමීමට, ලාංකීය නිර්ධන පංති බලවේගය සහමුලින්ම නැතිභංග කර දැමීමට තැත් දැරුව නමුත් ඔවුන් තවමත් සිය අවසාන අරමුණ ඉටුකර ගැනීමට අපොහොසත් බව ඔවුන්ටම වැටහීගොස්ය. සිරභාරයටගත් දසදහස් ගණනක් දෙනා හා සිරභාරයට තවමත් අසුනොවූ පුද්ගලයන් එක්කෝ ඝාතනය කර දැමීමේ ප්‍රයත්නය නැතහොත් අන් කවර හෝ මගකින් ඔවුන් විප්ලවයට ද්‍රෝහී වන විප්ලවයට සතුරු වන තත්වයට ඇද දැමීමට හෝ විප්ලවය කෙරෙහි කලකිරුණු විප්ලවය එපාවුණු උදාසීන, උකටලී තත්වයට ඇද දැමීමට හෝ පත්කළ යුතුව ඇත. මේ දසදහස් ගණන් විප්ලවවාදී තරුණයින්ට තවදුරටත් විප්ලවවාදීන් වශයෙන් පවතින්නට ඉඩ දී රඳවා තබාගැනීම ධනේශ්වර පංතිය හමුවේ ඇති විශාලතම අන්තරාවකි.

විශේෂයෙන්ම දහස් ගණන් තම පංති සංගයින්, තම විප්ලවවාදී සොයුරන් ධනේශ්වර පංති ඝාතකයින්ගේ ම්ලේච්ඡ වධ හිංසාවලට ගොදුරුව මිය යනු සියැසින්ම දුටු තම සහෝදරියන් ධනේශ්වර ම්ලේච්ඡ සාහසික භටයන් විසින් දූෂණය කරනු දැක ඇති, සිය ගෙවල් දොරවල් දවා අළු කරනු ලැබ ඇති විප්ලවවාදී තරුණයින් දසදහස් ගණනින් තවදුරටත් විප්ලවවාදී ජීවගුණයෙන් පිරී ඉතිරී ගිය මිනිසුන් හැටියට රඳවා තබා ගැනීම නම් ධනේශ්වර පංතියට සිය දිවි නසා ගැනීමකි. එබැවින් ඔවුන් විසින් කළ යුතු වන්නේ එක්කෝ හිට්ලර් යුදෙව් ජාතිකයන් ඝාතනය කළ අයුරින් මේ තරුණ ජනයා ඝාතනය කර දැමීමයි. නමුත් එය ප්‍රශ්නයට විසඳුමක් නොවනු ඇත. මේ දස දහස් ගණන් තරුණයින් ඕපපාතික වූවන් නොවෙති. ඔවුන් සමාජයේම කොටසක් වෙති. මේ තත්වයන් හොදින් තේරුම් ගත් අපේ රටේ ධනේශ්වර පාලක පංතිය උන්ගේ ජාත්‍යන්තර පංති සගයින්ගේ උපදෙස් හා අනුශාසනා පරිදි ය, ධනේශ්වර පංතිය පංතියක් වශයෙන් මුහුණ ලා ඇති මේ බැරෑරුම් ප්‍රශ්නය විසඳීමට පංතියක් වශයෙන් ඉදිරිපත් වූයේ. ඒ විසඳුම් මග නම් මේ දසදහස් ගණන් විප්ලවවාදී තරුණයින් ඝාතනය නොකර විප්ලවවාදීන් වශයෙන් ඝාතනය කිරීමයි. ශාරීරිකව ඝාතනය කිරීමක් නොව දේශපාලනික වශයෙන් ඝාතනය කිරීමයි. ඔවුන් තවදුරටත් විප්ලවවාදීන් වශයෙන් නැතිව එක්කෝ උදාසීන වූවන් නැත්නම් ප්‍රතිවිප්ලවවාදීන්ගේ තත්වයට පත්කිරීමයි. එය කළ නොහැකි නම් අඩු තරමින් ජනතා විමුක්ති පෙරමුණ භේද

බින්න කර එකිනෙකාට පර සතුරු වූ, එකිනෙකාට උගුල් අටවා ගන්නා, එකිනෙකා පාවාදී ගන්නා තත්වයන් ඇති කර එකිනෙකා කෙරෙහි එකිනෙකාට විශ්වාසයක් නැති කර විවිධ න්‍යායන් අනුගමනය කරන විවිධ නිකායන්ට අයත් කැඩී බිඳී ගිය කුඩා කණ්ඩායම් බවට පත් කොට එමගින් විප්ලවීය බලවේගයක් වශයෙන් ජනතා විමුක්ති පෙරමුණේ ශක්තිය හැකියාව හා ජීවමාන බව විනාශ කිරීමයි. එය අවුල් ජාලාවක් කිරීමයි. මේ කටයුත්ත තමා පුනරුත්ථාපනය නමින් හැඳින්වූයේ. පුනරුත්ථාපනය යනු තරුණයින් සිරගෙවල්වල රඳවා තබා ගෙන කෑම බීම, ලබාදීම නොවෙයි. මේ පුනරුත්ථාපනයේ විශේෂ සංගෘහිත වැඩපිළිවෙළ වනුයේ, ජනතා විමුක්ති පෙරමුණ අභ්‍යන්තරයෙන් බිඳ දමා සී සීකඩ කර එහි කොටස් නොයෙක් වක්‍ර මාර්ගවලින් ධනේශ්වර පංතියේ පහළ වන පංති සංවිධානය හරහා සහ ධනේශ්වර පංතිය විසින් හීලෑ කරගන්නා ලද වෛවාරණ විප්ලවවාදී සංවිධාන හරහා හෝ ධනේශ්වර පංතියට සේවය කරන ඇට්ටර වූ දිරාපත් වී ගිය වඳ බැහැපු න්‍යායන් වෙත නම්මවා ගැනීම මගින් හෝ ධනේශ්වර පංතියේ අරමුණු ඉටුවන තැනට කටයුතු සලසා ගැනීමයි.

ධනේශ්වර පංතියට එහි විවෘත පංති නියෝජිතයින්ට සහ නායකයින්ට කෙළින්ම ඉදිරිපත් වී කළ හැකි පුනරුත්ථාපනයක් නැත. පීලික්ස් ඩයස් බණ්ඩාරනායක හෝ මෛත්‍රීපාල සේනානායක හෝ ඇන්.ඇම්. පෙරේරා හෝ කොල්වින් ආර්. ද සිල්වා හෝ ලෙස්සි ගුණවර්ධන හෝ පීටර් කේනමන් ඇස්. ඒ. වික්‍රමසිංහ හෝ ස්ටැන්ලි සේනානායක හෝ ලයනල් සේනානායක හෝ සේපාල ආටිගල හෝ වෙනත් එවැනි ධනේශ්වර පංතියේ විවෘත නියෝජිතයෙක්ට හෝ ජනතා විමුක්ති පෙරමුණට විරුද්ධව, එහි දර්ශනයට විරුද්ධව, ප්‍රතිපත්තිවලට විරුද්ධව, වැඩපිළිවෙළට විරුද්ධව, ක්‍රියාමාර්ගයනට විරුද්ධව, එහි පුරෝගාමීන්ට විරුද්ධව කිවහැකි දෙයක් තිබේද? ඔවුන් කියන දෙයක් විප්ලවවාදීන් ගණන් ගනීද? සත්තකින්ම නැත. මෙන්න මේ තත්වයන් යටතේ ධනේශ්වර පංතිය විසින් ජනතා විමුක්ති පෙරමුණට අවලාද නැගීම සඳහා එමගින් ජනතා විමුක්ති පෙරමුණ කෙරෙහි ජනතාවගේ ඇති විශ්වාසය පළුදු කිරීම සඳහා, ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාමාර්ග ප්‍රතිපත්ති දර්ශනය හා වැඩපිළිවෙළ කෙරෙහි ජනතාවගේ ඇති බලාපොරොත්තු සුන් කිරීම සඳහා හා ජනතා විමුක්ති පෙරමුණේ සැබෑ විප්ලවාදීන් කෙරෙහි ජනතාවගේ ඇති ආදරය හා විශ්වාසය අහෝසි කිරීම සඳහා විප්ලවාදීන් නමින් පෙනී සිටින ධනේශ්වර පංති ඒජන්තවරුන් සහ ද්‍රෝහීන් ප්‍රයෝජනයට ගනු ලබන්නේය.

පක්ෂයක් පිළිබඳව හෝ පුද්ගලයින් පිළිබඳ සැබෑ වැරැදි විවේචනය කිරීම නරක දෙයක් නොවේ, එය හොඳ දෙයකි. එය කළ යුතු දෙයකි. එහි අරමුණ විය යුත්තේ එම වැරැදි තත්වයානුකූලව සොයා බලා විග්‍රහ කර ඒවා ඇති වූයේ කුමන තත්වයන් යටතේද ? ඒවා ඒ පැවැති තත්වයන් යටතේ ඒ අයුරින්ම ඇතිවීම සාධාරණද? ඒවා වැළැක්විය හැකිව තිබුණේ කෙසේද? ඒවායින් දැන් අත්මිදීමට ඇති මාවත් මොනවාද? අනාගතයේදී එවැනි තත්වයන් මග හැරිය හැක්කේ කෙසේද? යන මේ ප්‍රශ්න අනිවාර්යයෙන්ම සැබෑ විප්ලවවාදියකු විසින්ම සොයා බැලිය යුතුමය. කිසිම සැබෑ විප්ලවවාදියෙක් කවරදාවත් වැරැදි වසන් නොකරයි. ඒ වෙනුවට විවෘතවම එළිපිටම ඒ වැරැදි පිළිගනී. ඒවා අධ්‍යනය කරයි. ඒ මගින් හැකි ඉක්මනින් අත්මිදීමටත්, එසේම ඒවා අනාගතයේදී නොකිරීමටත් එවැනි තත්වයන් ඇති නොවීමටත් වග බලා ගනී. සැබෑ විප්ලවවාදියෙක් තමා දැන දැනම වැරැදි කිරීමට නොපෙළඹෙයි. මෙයින් අදහස් කරන්නේ විප්ලවවාදීන් අතින් වැරැදි නොකෙරෙනවාය යන්න නොවේ. දැන දැනම හිතා මතා සැබෑ විප්ලවවාදියෙකු අතින් වර්ධනය වූ විප්ලවවාදියෙකු අතින් වැරදී වීම අපහසු බවයි. නමුත් අඩු දියුණු සංවර්ධිත විප්ලවවාදීන් අතින් වඩා වර්ධනය වූ විප්ලවවාදීන්ට වඩා වැරදි සිදුවීමට ඉඩ කඩ තිබේ.

සෑම සිදුවීමක්ම ද්විඝටනාත්මක ලෙස සලකා බලන විට අන්තර් බැඳීම්වලින් යුක්තව පවතී. සෑම දෙයක්ම හැදෑරිය යුත්තේ ඒ ඓතිහාසික තත්වයන් තුළය. මාක්ස්වාදී ද්විඝටනය ලෝකය හැදෑරීමේදීත් විශ්ලේෂණය කිරීමේදීත් පිළිගන්නා ක්‍රමය එයයි. මෙය වැරැදි සම්බන්ධයෙන්ද පොදුය. වැරැද්ද අන් ඕනෑම දෙයක් මෙන්ම හැදැරිය යුත්තේත්, විශ්ලේෂණය කළ යුත්තේත් තේරුම් ගත යුත්තේත් ඒවා සිදු වූයේ යැයි සලකන ඓතිහාසික තත්වයන් තුළය. ඓතිහාසික තත්වයන් මග හැර අන්තර් සම්බන්ධතාවයන් කපා දමා යම් විෂය වස්තුවක් හැදැරීමට ගියහොත් එහිදී බැසගන්නා නිගමන මනෝමූල හා සාවද්‍යවන බව මාක්ස් ලෙනින් චින්තාව අපට අවධාරණයෙන් උගන්වයි. අපි අන් සෑම සියලු දෙයක් මෙන්ම වැරැදි දෙසද දැක්විය යතු ආකල්පය මනෝ මූලික හා සාවද්‍ය නොවිය යුතුය. ද්විඝටනාත්මක විය යුතුය. එනම් වැරැදි, ඒවා සිදුවේයැයි කියන ඓතිහාසික තත්වයන් තුළ ඒවා සිදුවූ කාලයේ පැවැති අන්තර් සම්බන්ධතාවයන්ගෙන් යුතුව, කොටසක් නොව සමස්තව ගෙන උඩින් පල්ලෙන් ආවාට ගියාට නොව ගැඹුරට, පතුලට කිඳා බැස, සිතින්

මවාගෙන අලුතින් ඈඳාගත් තත්වයන් යටතේ නොව, යථාර්ථවාදීව නියම තත්වයන් යටතේ හැදෑරිය යුත්තෙමු. එය නියම ක්‍රමයයි. මාක්ස් ලෙනින්වාදී ක්‍රමයයි. වැරැදි සෙවීමක් ඒ වැරැදි අධ්‍යනය කිරීමත් ඒවායේ නිසි පාඩම් අනාගත කටයුතු සඳහා සොයා බැලීමත් එක් කටයුත්තකි. ඒ කටයුත්ත නිර්ධනපංති විප්ලවවාදී ව්‍යාපාරයේ ඉදිරි ගමන ප්‍රගතිය අරමුණ කරගත්තක් වේ. නමුත් එක්කෝ සැබෑ වැරදි පසෙක තිබිය දී ඒවා වසංකරගැනීමේ චේතනාවෙන් හෝ අමතක කරලීමේ හෝ මගහරවාලීමේ හෝ චේතනාවෙන් ඒ සැබෑ වැරැදිවලට ද්විතීක තත්වයක් ආරූඪ කරලීමේ චේතනාවෙන් හෝ වැරැදි නොවන දේ වැරැදි ලෙස විග්‍රහ කිරීමත් බොරු මවාපෑමත් ඇතැම් සත්‍ය සිද්ධීන් විකෘති කර ඒවාට වැරැදිභාවයක් ආරූඪ කිරීමත් අතිශෝක්තියත්, සැබෑ ලෙස අවංක ලෙස විප්ලවාදී ව්‍යාපාරයේ ඉදිරි ගමන සඳහා නිර්ධන පංති ව්‍යායාමයේ ප්‍රගතිය සඳහා කරන්නක් විය නොහැක.

දැන දැනම අවලාද අපහාස නැගීමත්, චරිත ඝාතනය කිරීමත් පච සහ බේගල් ඇදබෑමත් කිසි ලෙසකින්වත් විප්ලවයේ සතුරන් ලෙස මිස මිතුරන් ලෙසින් කළ හැකි, කළ යුතු දෑ නොවේ. දැන දැනම හිතාමතාම කුමන හෝ හේතුවක් නිසාවෙන් විප්ලවාදී ව්‍යාපාරයකට එරෙහිව, එහි දර්ශනයට එරෙහිව ප්‍රතිපත්තියට, වැඩපිළිවෙළට, ක්‍රියාමාර්ගයනට හා එයට ඇප කැප වන පුද්ගලයනට එරෙහිව හිතාමතා සාවද්‍ය ගොතන ලද කරුණු හා සිද්ධීන් පදනම් කරගෙන අවලාද, අපහාස කිරීම මගින් බලාපොරොත්තු වනුයේ පංති සතුරාට ධනේශ්වර පංතියට සූක්ෂම අන්දමින් සේවය කිරීමයි. එවැනි පුද්ගලයෙක්, ඔහු කවරෙකු හෝ වේවා නිර්ධන පංති සතුරෙකි. ධනපති පංතියේ මිතුරෙකි. ඒ, ධනපති පංතියේ ඔත්තුකරුවකු නොවේ නම් අද අප මුහුණ පා සිටින තත්වයන්ට, බොහෝ දුරට සමාන තත්වයන්ට ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ වෙනත් නොයෙකුත් සහෝදරවරු විවිධ අවස්ථාවලදී මුහුණපා තියෙනවා. අප මෙවැනි තත්වයකට හාපුරා කියා පත් වූ අය නොවේ. අපේ ජාත්‍යන්තර පංති සොයුරන් මේ විෂයෙන් ලැබූ අත්දැකීම් අපට මෙහිදී මහත් සේ ඵලදායී වෙනවා.

ජනතා විමුක්ති පෙරමුණ මෑත කාල පරිච්ඡේදයේදී මුහුණ දුන් ප්‍රශ්නවලට බොහෝ දුරට සමාන තත්වයකට මුහුණ දුන් නොයෙක් රටවල මේ හා සමාන තත්වයන් ඇතිවෙලා තියෙනවා. ඒ තැන් හිදී ධනේශ්වර පාලකයින් නිර්ධන පංති ව්‍යාපාරය විනාශ කර දැමීම සඳහා උපයෝගී කරගත් සටකපට උපක්‍රම තමයි තවදුරටත් සංවර්ධනය

කොට මේ රටේ ධනේශ්වර පාලක පංතිය නින්දිත ලෙස උපයෝගී කරගනු ලැබූයේ. වෙඩි උණ්ඩ සහ බයිනෙත්තුවලින් කරන ලද මර්දනය මගින් නිර්ධන පංති ව්‍යාපාරයට පළමු පහර දීමත් සමග ඇති වූ අලුත් තත්වය ප්‍රයෝජනයට ගනිමින් නිර්ධන පංති ව්‍යාපාරය සහ මුලින්ම සහ තීරණාත්මක ලෙස මූලෝත්පාඨනය කිරීම සඳහා ධනේශ්වර පංතිය කටයුතු කර තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණට එරෙහිව ධනේශ්වර පංතියේ ප්‍රථම ප්‍රහාරය මෙහෙය වූයේ අවි ආයුධ සහ වෙඩි උණ්ඩවලින් නමුදු ඊළඟ ප්‍රහාරය මෙහෙය වනු ලබන්නේ පුනරුත්ථාපනයට මුවාවෙන් කරනු ලබන වැඩපිළිවෙළ මගිනි. පුනරුත්ථාපනය නම් අන් කිසිවක් නොව විප්ලවවාදී තරුණයන් විප්ලවවාදීත්වයෙන් තොර කිරීමයි. ආපසු ධනේශ්වර මාවතට ඇද ගැනීමයි. මේ සඳහා ධනේශ්වරය කෙරෙහි මේ තරුණයින්ගේ විශ්වාසයක් ඇති කරලිය නොහැකි කල් හි ඔවුන් විප්ලවය කෙරෙහි, විප්ලවවාදී ව්‍යාපාරය කෙරෙහි විප්ලවවාදීන් කෙරෙහි , විප්ලවීය දර්ශනය සහ ක්‍රියාමාර්ග කෙරෙහි කලකිරවීමට හෝ ඒ සමග මතභේද ඇති කරලීමට සහ භේද ඇති කරවීමට ධනේශ්වර පංතිය කටයුතු කරගෙන යනවා. ඒ මගින් පමණයි ධනේශ්වර පංතියට ''වර්තමාන තත්වයන් යටතේ ජනතා විමුක්ති පෙරමුණ විනාශ කරලිය හැක්කේ'' මේ කළකිරවීමේ සහ භේද කරවීමේ ව්‍යාපාරය උදෙසා ඔවුන් කළ හැකි හැම දෙයක්ම කරනවා. ප්‍රයෝජනයට ගත හැකි සෑම පහත් පෙළේ අවියක්ම අතට ගන්නවා.

අනිත් පැත්තෙන් මේ කටයුතු සඳහා යොදවනු ලබන්නේ ඔවුන්ගේ සැඟවුණු ඒජන්තවරුන්, ගැත්තන්, ද්‍රෝහීන් හා ඔවුන් විසින් සන්නද්ධ ගැටීම් වකවානුවේදී මර්දන තත්වයට ඔරොත්තු දිය නොහැකිව දුර්වලව ගොස් ව්‍යාපාරය පාවාදුන්නන් සහ සතුරා වැළඳගත්තවුන් වැනි දුර්වල කොටස්ය. එලෙසම විප්ලවවාදීන් යැයි තමා විසින්ම කියා ගනිමින් විප්ලවවාදී ව්‍යාපාරයට මහත් හතුරුකම් කර ඇති විවිධ ගණයට අයත් අවස්ථාවාදී කල්ලි සහ කණ්ඩායම් විසින් ජ.වි.පෙ. විනාශකර දමා එයින් කුට්ටි තමන්ගේ පැත්තට කඩාගැනීමේ කාර්යය සඳහා ජ.වි.පෙරමුණට විරුද්ධව එහි න්‍යායට හා වගකිව යුත්තන්ට විරුද්ධව ධනේශ්වර පංතිය හා එහි ඒජන්තවරුන් සමග හවුල් වී නින්දා සහගත මුසාවාද පතුරවමින් කඩාකප්පල්කාරී වැඩ කටයුතුවල යෙදෙනවා. දෙවන ලෝක මහා යුද්ධ සමයේදී සමසමාජ පක්ෂ නායකයින් සිරබාරයට ගෙන සමසමාජ පක්ෂය නීති විරෝධී කර තිබූ අවස්ථාවේදී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී ආණ්ඩුව සමග හොඳ

හිතින් සිටි පීටර් කේනමන් කල්ලිය ගෙන ගිය ක්‍රියා පිළිවෙතට සමාන පිළිවෙතක් තමයි ජ.වි.පෙරමුණ ධනේශ්වරයේ ප්‍රහාර කා ඇද වැටී සිටියදී දැන් මේ ඊනියා විප්ලවවාදීන් කරගෙන යනුයේත්. ධනේශ්වරය ජ.වි.පෙ.ට පහර දෙනුයේ එයින් කුට්ටි කඩා ගැනීමටයි. මේ කුට්ටි කඩා ගැනීමේ ව්‍යාපාරයට ධනේශ්වරයේ අනුබලය සහ ආශිර්වාදය ලැබෙනවා. මන්ද, විප්ලවවාදියෙක් ඒ කෙරේ පිරිහවන්නට බැරි නම් අඩු තරමින් විවිධ කල්ලිවලට බෙදා දැමීමෙන්වත් ධනේශ්වර පංතියට භාග්‍යයක් සැනසිල්ලක් ලැබෙන නිසයි.

මෙවැනි ක්‍රියාමාර්ගයන් අද කොතෙක් දුරට සාර්ථක වී ඇත්ද? ඇත්ත වශයෙන්ම විප්ලවවාදියෙකු වශයෙන් බැලූ කල මට හොඳින් පෙනී යන කරුණක් නම් ධනේශ්වරයින්ගේ මේ ක්‍රියාමාර්ගය කිසියම් දුරකට සාර්ථක වී ඇති බවයි. එයට හේතු මේවායැයි සිතිය හැක.

1. කුරිරු ධනේශ්වර මර්දනයට ගොදුරු වී ව්‍යාපාරයේ සිටි අවංකව වඩාත් කැප වුණු සහ වර්ධනය වුණු සහෝදරයින් විශාල පිරිසක් මරු වැළඳ ගැනීමත්, ඒ හේතුවෙන් ධනෙශ්වරයේ මේ ක්‍රියාමාර්ගයට එරෙහිව ප්‍රබල ප්‍රතික්‍රියාමාර්ගයක් ගැනීම අඩාල වීමත්,

2. ධනේශ්වරය සිය ඒජන්තවරුන් ගැත්තන් සහ පසුව නිර්ධන පංති ව්‍යාපාරයට ද්‍රෝහී වූවන් සහ නොයෙක් හේතු සහ පොරොන්දු ඇතිව ඔවුන් විසින් දිනා ගනු ලැබූ දුර්වලයින් ප්‍රයෝජනයට ගෙන සිරගෙවල්වල සහ සිර කඳවුරු තුළ විශාල ප්‍රමාණයේ සාවද්‍ය අදහස් පතුරුවද්දී ඒවාට පිළිතුරු දිය නොහැකි වන ලෙස අප සහමුලින්ම වෙන්කොට තබා තිබීමත් ඒ හේතුවෙන් තොරතෝංචියක් නැතිව සතුරාගේ පැත්තෙන් පමණක් නින්දා අපහාස සහ බේගල්ද විකෘති කිරීම් සහ අතිශෝක්තීන් පමණක්ම ලැබීමත්

3. පක්ෂ අභ්‍යන්තරයේ මතභේද පිළිබඳ සැබෑ තත්වය බොහෝ දෙනා නොදැන සිටීමත්

4. සටනක් පරාජය වීම තුළින් හා අධික මර්දනයකට ගොදුරු වීම තුළින් පක්ෂ සාමාජිකත්වය තුළ ඇති වූ ආකූල ව්‍යාකූලත්වයත් උදාසීනත්වයත් හේතුකොටගෙන එක්පැත්තකින් රහස් පොලීසියත්, පොලිසියත් පක්ෂය තුළට රිංගා සිටින සතුරු ඒජන්තවරුනුත් ද්‍රෝහීන් වූ අයත් නගන අවලාදවල යථා තත්වය තේරුම් ගැනීමට අපොහොසත්වීමත් ඒවා තේරුම්ගත් අය පවා

උදාසීනත්වය හේතු කොටගෙන ඒවාට එරෙහිව සත්‍යය ඉදිරිපත් කරමින් ශාස්ත්‍රානුකූලව ප්‍රතිප්‍රහාරයට ඉදිරිපත්වීම වැළකී යාමත් සහ තවත් එවැනි හේතූන්ය.

මෙතෙන ධනේශ්වර ක්‍රියාමාර්ගයක් ඇත. නමුත් එයට එරෙහිව නිර්ධන පංතියේ පැත්තෙන් ප්‍රතික්‍රියාමාර්ගයක් නොමැත. ඛේදජනක තත්වය එයයි. ප්‍රබල විරෝධයකින් තොරව පාළුගෙයි වළන් බිඳින්නා සේ සකල විධ ධනේශ්වර ගැත්තන් විසින්ම සෑම ආකාරයකම අවස්ථාවාදීන් විසින්ම කරගෙන යනු ලබන ප්‍රතිවිප්ලවීය ක්‍රියාමාර්ගයක් පමණි ඇත්තේ. නමුත් මාක්ස් ලෙනින්වාදියෙකු වශයෙන්ම මම මෙහිදී සර්ව අසුබවාදී වී නොමැත්තෙමි. සෑහෙන පිරිසක් යථාර්ථය තේරුම්ගෙන සිටින බව දනිමි.

අවලාද, නින්දා, අපහාස, කරුණු විකෘති කිරීම් සහ බොරු බේගල් ඇදබෑම් කව්රු කරතත් එය කරන්නවුන්ගේ දක්ෂතාවය, අවංකත්වය, කුසලතාවය, නිවැරැදිභාවය ශක්තිමත්භාවය හා විද්‍යාත්මකභාවය නොමැති බව ප්‍රදර්ශනය කරයි. අවලාද අපහාස සහ බේගල් මිනිසුන්ගේ ශක්තිය නොව දුබලතාවයත්, සත්‍යය නොව බොරුවත්, නිවැරැදිභාවය නොව සාවද්‍යභාවයත් සැමවිටම ප්‍රදර්ශනය කරයි. ඒවා මිනිසුන්ගේ දේශපාලන බංකොළොත්භාවයේ පරාගතවීමේ සහ පරාජයේ සංකේතයෝය. එබැවින් මාක්ස් ලෙනින්වාදීහු ඒවා කිසිලෙසකත් සිය අවි ආයුධ ලෙස පාවිච්චි නොකරති. ඒ මාක්ස් ලෙනින්වාදීන් දේශපාලනිකව බංකොලොත් නොවන නිසයි. දේශපාලනිකව ජරාජීර්ණ වී බංකොලොත් වී යන ධනේශ්වරයින් පමණක්ම මේවා කරනු ලැබේ. අවලාද හා බොරු අපහාස දේශපාලන බංකොලොත්භාවයේ ප්‍රතිඵලයක් නිසාම ඒවාට පිළිතුරු අනවශ්‍ය යැයි පිළිගැනීමක් තිබේ. ඒ එසේ වුවත් ඒ පිළිබඳව යථා තත්වයන් පැහැදිලි කිරීමට සුළුවෙන් හෝ මම බලාපොරොත්තු වෙමි.

ජනතා විමුක්ති පෙරමුණ අද මුහුණ පා ඇති තර්ජනවලට සමාන තත්වයනට මුහුණ පෑ කොමියුනිස්ට් පක්ෂ අතීතයේ තිබුණා. දෙවන ලෝක මහා යුද සමයේදී ජර්මන් ඉතාලියානු ෆැසිස්ට්වාදයෙන් තදබල ලෙස පහර කෑ පක්ෂයක් තමයි යුගෝස්ලෝවියානු කොමියුනිස්ට් පක්ෂය. ෆැසිස්ට්වාදීන් යුගෝස්ලෝවියාව ආක්‍රමණය කරන විට එරට තිබුණු කොමියුනිස්ට් පක්ෂය නැගෙනහිර යුරෝපීය රටවල තිබුණු කොමියුනිස්ට් පක්ෂ අතර විශාලතම එකක්. එහෙයින් කොමියුනිස්ට් පක්ෂයේ ආරම්භයේ පටන්ම යුගෝස්ලෝවියාවේ ෆැසිස්ට්

පාලනයට එරෙහිව සටන් වැදුණා. මේ හේතුවෙන්ම යුගෝස්ලෝවියානු කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයෙන් සමාජවාදී ආණ්ඩුවක් පිහිටුවන විට, ඇප කැප වුණ ශක්තිමත් භක්තිමත් කොමියුනිස්ට්වාදීන් අති විශාල සංඛ්‍යාවක් ජීවිත පරිත්‍යාග කොට තිබුණා. ඔවුන් සටනේ දී මිය ගොස් සිටි නිසාත් කොමියුනිස්ට් පක්ෂයට සටන් තුළින් ෆැසිස්ට් විරෝධී අරගල තුළින් එක් රොක් වුණු ඇතැම් සුළු ධනේශ්වර හා ධනේශ්වර කොටස්වලට හා සෑම සියලු අවස්ථාවාදීන්ට පක්ෂයේ වගකීම් ඉසිලීමට අවස්ථාව ලැබීම නිසාත් යුගෝස්ලෝවියාව කඩිනමින් සංශෝධනවාදය කරා ගෙනයාමට ඉඩ ප්‍රස්ථාව ලැබුණා. යුගෝස්ලෝවියානු කොමියුනිස්ට් පක්ෂය මුහුණ පෑ මේ අන්ත්‍රාව අද අපේ ව්‍යාපාරය හමුවේත් නැතැයි කිසිවෙකුටවත් සෑහීමකට පත්විය නොහැක. අපේ ව්‍යාපාරය තුළත් මේ තත්වයන් යටතේ ටිටෝලා, කර්ඩෙල්ජිලා, රන්කොවිච්ලා, ලාස්ලා වැන්නන් බිහිවීමට ඉඩකඩ තිබේ. මේ ගැනත් නිර්ධන පංති විප්ලවවාදීන් අන් හැම ප්‍රශ්නයක් ගැන මෙන්ම පරෙස්සම් විය යුතුය. ධනේශ්වර පංතියේ පංති අවශ්‍යතාවයන් සුරකිමින් ජනතා විමුක්ති පෙරමුණටත් පුද්ගලිකව මටත් අවලාද අපහාස නින්දා පමුණුවන ජනතාව එමගින් නොමග හරින විප්ලවවාදී ව්‍යාපාරයට කිව නොහැකි තරම් මහත් හානි පමුණුවන මේ පුද්ගලයෝ කවරහුද? ඔවුහු එක්කෝ:

1. මුල පටන් ජනතා විමුක්ති පෙරමුණ තුළට රිංගාගෙන සිටින සතුරු ඒජන්තලාය.

2. බලාපොරොත්තු හා ලාභ අපේක්ෂාවන් ඇතිව ව්‍යාපාරය තුළට රිංගා ඇති පසුව ඒවා බිඳවැටෙනු දැක, ඉටු නොවනු දැක ව්‍යාපාරයට ද්‍රෝහී වූවන්ය.

3. කුරිරු ධනේශ්වර මර්දනයට මුහුණ දිය නොහැකිව පංති සතුරා ඉදිරියේ සියල්ල පාවා දී තම ද්‍රෝහිත්වයේත්, බියසුළු බවත් දීන කැත ක්‍රියා පිළිවෙත නිසාත් ආපසු ජනතා විමුක්ති පෙරමුණ දෙස බැලිය නොහැකි හා සිය ද්‍රෝහීත්වය වසංගා ගැනීමට පක්ෂයට අවලාද නගන්නවුන්ය.

4. තම වැරැදි සහ සදොස්භාවය වසං කරගැනීමේ අරමුණෙන් යුතුව පක්ෂයට චෝදනා කරන්නවුන්ය.

5. ප්‍රශ්නවල යථාර්ථය තේරුම් නොගත් නිසා හෝ තේරුම් ගැනීමට අවස්ථාවක් නොලත් නිසා හෝ අවංකව වැරැදි මාර්ගයට පිවිසි අයය.

6. පෞද්ගලික බැඳීම් සහ නොයෙකුත් විශේෂ සම්බන්ධතාවයන් හේතුකොටගෙන ද්‍රෝහීන් සමග ඇති පෞද්ගලික මිත්‍රත්වය හේතු කොටගෙන ද්‍රෝහීන්ගේ පැත්ත ගත්තවුන්ය.

7.ව්‍යාපාරයට කරන ලද වැරැදි හේතු කොටගෙන තවදුරටත් ව්‍යාපාරයේ සිටිය නොහැකි, එබැවින් වෙනත් කල්ලි හා කණ්ඩායම් සමග එකමුතු වී ඒ කණ්ඩායම් සහ කල්ලිවලින් කුලියට ගත් අවලාද දමා ගසන්නවුන්ය.

ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ ඓතිහාසික අත්දැකීම් හොඳින් හදාරා බලන විට පෙනී යනුයේ ක්‍රම කිහිපයකින්ම නිර්ධන පංති ව්‍යාපාරය තුළ ද්‍රෝහීන් හා පාවාදෙන්නන් බිහිවන බවයි.

1. සූරාකන පංතීන් විසින් උවමනාවෙන්ම හිතාමතාම නිර්ධන පංති ව්‍යාපාරය තුළට රිංගවන ලද ද්‍රෝහීන්ය.

2. කලක් නිර්ධන පංති ව්‍යාපාරය වෙනුවෙන් සේවය කළ පසුව නොයෙකුත් හේතූන් උඩ නිර්ධන පංති ව්‍යාපාරයට ද්‍රෝහී වන්නන්.

3. තමන් කරන්නේ ද්‍රෝහීකමක් බව නොදැන ද්‍රෝහීකම් කරන්නවුන් ආදී මේ සියලු ගණයකම ද්‍රෝහීන් හා පාවාදෙන්නන් ගැන ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයට පුළුල් අත්දැකීමක් තිබෙනවා. මෙවැන්නන් අතීතයේ, වර්තමානයේ මෙන්ම අනාගතයේදීද සිටිනු ඇති. ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය තුළට සිය ඔත්තුකරුවන් රිංගවා එමගින් එම ව්‍යාපාර විනාශ කර ධනේශ්වර පංති අරමුණු සුරක්ෂිත කරගැනීම සඳහා නිර්ධන පංති ව්‍යාපාරයේ උපතේ පටන්ම ධනේශ්වර පංතිය ක්‍රියා කර තිබෙනවා. ඒ පිළිබඳව ඔවුන් ලබපු අත්දැකීම් ඉතා විශාලයි. ඒ විශාල අත්දැකීම් සම්භාරය උපයෝගී කරගෙනයි අද ධනේශ්වර පංතිය ක්‍රියා කරන්නේ. මේ කටයුත්ත සඳහා සෑම සියලු ධනේශ්වර පාලක පංතියක්ම අති විශේෂ උනන්දුවක් දක්වනවා. ඇතැම් පක්ෂවල එවැනි ද්‍රෝහීන් ඉක්මනින් එළිදරව් වූ අතර ඇතැම් පක්ෂවල බොහෝ ප්‍රමාද වී එළිවුණා. තවත් තැන්හි එළිදරව් නොවීම සිටියා. ඇතැම් තැන්හි ඔවුන් සුළු විනාශයන් කර ඇති අතර තවත් තැන්හි මහ නස්පැත්ති කිරීමට ඔවුන් පොහොසත් වුණා. ලෙනින්ගේ නායකත්වයෙන් යුත් බොල්ෂෙවික් පක්ෂයේ උසස් නායකයින් මෙන්ම මාවෝගේ නායකත්වයෙන් යුත් චීන කොමියුනිස්ට් පක්ෂයේ උසස් තැන්හිද අනෙකුත් කොමියුනිස්ට් පක්ෂවලත් මෙවැනි පුද්ගලයන් සිට හෙළිදරව් වූ බව රහසක් නොවේ. ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය

ලෝක ධනපති ක්‍රමය අබිබවා ලෝක නිර්ධන පංති විප්ලවයේ ජය කෙහෙලි නංවන තුරුම මේ අන්තරාව සහ තර්ජනය පවතිනු ඇත.

ධනපති ක්‍රමය තිබෙන තාක්කල්, ධනේශ්වර සූරාකෑම තිබෙන තාක්කල්, ධනේශ්වර පාලන පංතීන් සිටින තාක් කල් ඔවුන් ඔවුන්ගේ ඔත්තුකරුවන් නිර්ධන පංති ව්‍යාපාර තුළට රිංගවා එමගින් ඔවුන්ගේ කැත අරමුණ ඉටුකර ගැනීමට උත්සාහයන් දරනු ඇත. කළ හැකි සෑම සටකපට උපක්‍රමයක්ම යොදනු ඇත. ධනේශ්වර සමාජයක ගොඩනගන නිර්ධන පංති ව්‍යාපාරය දත් තිස්දෙක මැද දිව රැකෙන්නා සේය. ඉතා අපහසුවෙන් ධනේශ්වර පංතියේ මෙවැනි අතවරයන්ගෙන් රැකී සිටිය යුත්තේ ධනේශ්වර පංතිය සිය ඔත්තුකරුවන් රිංගවීමට දරන ප්‍රයත්නයේ විශාලත්වය හේතුකොටගෙන එයින් විශාල ප්‍රමාණයක් වැරැදී යද්දීත් ඉතා සුළු ප්‍රමාණයක් හෝ සාර්ථක කරගැනීමට හැකියාව ලැබී තිබේ. එසේ වනුයේ මේ කටයුත්ත සඳහා ධනේශ්වර පාලක පංතීහු තමන් අභිමුව ඇති තමන් සන්තකව ඇති සෑම සියලු හැකියාවක් බලවේගයක්, උපකරණයක් සහ උපාය උපක්‍රමයක්ම උපයෝගී කරගන්නා බැවිනුත් තමන් කලක් මුළුල්ලේ අත්හදා බලා ප්‍රගුණ කරගන්නා ලද ඔත්තුකරුවන් රිංගවීමේ ක්‍රියාදාමය අංග සම්පූර්ණ ශාස්ත්‍රයක් බවට පෙරළගෙන සිටීමත් එබැවින් ඉතා සූක්‍ෂම ලෙස එය කිරීමත් නිසාය.

ධනේශ්වර ඔත්තුකරුවන් රිංගවීම ඔවුහු එහි බැරෑරුම්කම හා වැදගත්කම හේතුකොටගෙනම ආවාට ගියාට උඩින් පල්ලෙන් නොකරති. එවැන්නන් හෙළිදරව් නොවෙන සේ වගබලා ගන්නා අයුරින් එය කරයි. ඔවුහු තම ඒජන්තවරුන්ට තම සැබෑ අරමුණ වසංකරගැනීමේ අවශ්‍යතාවය සහ ක්‍රම හොඳින් පහදා දෙති. අවසාන තීරණාත්මක මොහොතකදී හැර මොවුහු හෙළිදරව් නොවීමට වගබලා ගනිති. ධනේශ්වර සමාජයක් තුළ අලුතින් ගොඩනැගෙන සහ වර්ධනය වන විප්ලවවාදී ව්‍යාපාරයක් තුළට එම ව්‍යාපාරය කොතෙක් දුරට සැකය, සුපරීක්ෂාකාරීත්වය හා පරිශ්‍රම ඇති කරගෙන සිටියත් එය ජනතාවට විවෘත කර ඇති පක්‍ෂයක් හෙයින් ඇතැම් විශේෂ තත්වයන් යටතේ බොහෝ අපහසුවෙන් නමුත් ධනේශ්වර පංතියට තම ඔත්තුකරුවන් රිංගවීමට හැකියාවක් ලබාදේ. ''ජනතාවට දොර හරිමින් ද්‍රෝහීන් රිංගා ගැනීම වළක්වනු ''යන්න කොමියුනිස්ට් පක්‍ෂවල ක්‍රියාමාර්ගය වී තිබියදීත් ද්‍රෝහීන්ද එකා දෙන්නා අපහසුවෙන් නමුත් රිංගාගන්නා බව සැබෑය. ද්‍රෝහියා තමා ද්‍රෝහියකු නිසාම තමාගේ ද්‍රෝහිත්වය හෙළිදරව්

නොවන සේ ඉතා පරිස්සම්වීමට වග බලා ගනී. මෙවන් තත්වයන් යටතේ ඇතැම් විට ද්‍රෝහීන් හෙළිදරව් වීම කල් නොයවා සිදු වුවත් බොහෝ ද්‍රෝහීන් හෙළිදරව් වීමට කල් යනු ඇත. ඒ කාලය තුළ මේ ද්‍රෝහීන් විසින් තවත් දුර්වල පුද්ගලයින් දිනා ගනු ලබන හා හවුල් කරගනු ලබන අතර ව්‍යාපාරයට ඉමහත් හානිද පමුණුවනු ඇත. ද්‍රෝහියකු ඔහුගේ සැබෑ තතු වසන්කර ගැනීමට විශාල කැප වීමකින්ද වැඩ කිරීමට පුළුවන. නැතහොත් එසේ කරන බව පෙන්වීමටද පුළුවන. එසේම ඔවුහු නිර්ධන පංති ව්‍යායාමය ගැන විශාල උද්‍යෝගයක් උනන්දුවක් හා අවශ්‍යතාවයක් පෙන්වීමටද පුළුවන. සිය ද්‍රෝහී බව එළිදරව් වීමට ඉඩ නොදෙන්නට පරෙස්සම් වීම හේතුකොටගෙන මෙවැනි තත්වයන් යටතේ ද්‍රෝහීන් හෙළිදරව් කරගැනීම විශාල ගැටලුවකි. මේ ගැටලුවට මාක්ස්ගේ පටන් ලෙනින් හරහා මේ දක්වාම සෑම විප්ලවවාදියෙක්ම මුහුණ පා තිබේ.

බොල්ෂෙවික් පක්ෂය තුළට රිංගාගත් මෙවැනි එක් සතුරු ඒජන්තවරයකු පිළිබඳව ලෙනින් ''වාමාංශික කොමියුනිස්ට්වාදය ළදරු වලිප්පුවකි.'' පොතේ ''ජර්මනියේ වාමාංශික කොමියුනිස්ට්වාදය, නායකයෝ, පක්ෂය, පංතිය හා බහු ජනතාව නම් පස්වැනි පරිච්ඡේදයෙහි මෙසේ සඳහන් කරයි. ''.... අනෙක් අතට අපේ තත්වය මෙසේ විය. නියම වශයෙන් නායකයන් එනම් ප්‍රධාන කාර්ය මණ්ඩලය ගුප්තභාවයකින් වසන් කර තිබීමේ අවශ්‍යතාවය මතු කළාවූ නිත්‍යානුකූල හා නීති විරෝධී කටයුතු අතර ක්ෂණයෙන් එහා මෙහා මාරුවීමේ තත්වය විසින් ඉතා අන්ත්‍රාදායක තත්වයක් බිහිකරන ලද්දේය. නරකම තත්වයක් මතුවුයේ 1912 දී මැලිනොව්ස්කි නමැති ඔත්තුකාරයා බොල්ෂෙවික් මධ්‍යම කාරක සභාවට ඇතුළත් වූ අවස්ථාවේය. ඔහු ඉතා කදිම පක්ෂයට භක්තිමත් සහෝදරයන් බොහෝ ගණනකට බරපතළ වැඩ ඇතිව දරුණු සිර දඬුවම් ලැබෙන තැනට වැඩ සැලසුවේය. බොහෝ දෙනෙකු වෙත මරණය ළංකළේය. ඔහු ඊට වැඩියෙන් හානි කිරීමට ඉඩ නොලද්දේ නීත්‍යනුකූල සහ නීති විරෝධී කටයුතු අතර සුදුසු පෙළේ සබැඳියාවක් අප විසින් ඇති කර තිබූ හෙයිනි. පක්ෂයේ මධ්‍යම කාරක සභිකයකු වශයෙනුත් ඩූමාවේ නියෝජිතයෙකු වශයෙනුත් අපගේ විශ්වාසය දිනා ගැනීම සඳහා අපේ දිනපතා නීත්‍යානුකූල පුවත්පත් ගොඩනැගීම උදෙසා ආධාර වීමට මැලිනොව්ස්කිට සිදුවිය. සාර් රාජාණ්ඩුව යටතේ වුවද එම පුවත්පත් මගින් මෙන්ෂෙවික්වාදීන්ගේ අවස්ථාවාදීත්වයට විරුද්ධව සටන් කිරීමටද එක් ආකාර වුවමනාවකින් යුතුව බොල්ෂෙවික්වාදයේ

මූලධර්ම ප්‍රචාරය කිරීමටද හැකියාව තිබුණි. මැලිනොව්ස්කි එක් අතකින් හොඳම බොල්ෂෙවික්වාදීන් බොහෝ ගණනක් බන්ධනාගාරයට හා මිනී වළවල් තුළට තල්ලු කළ අතර අනික් අතින් නීත්‍යනුකූල පුවත්පත් මගින් දහස් ගණන් තරුණ බොල්ෂෙවික්වාදීන්ට දේශපාලන අධ්‍යාපනය දීමට ඔහුට ආධාර දීමට සිදුවිය. ප්‍රතිගාමී වෘත්තීය සමිති තුළ විප්ලවකාරී කටයුතු ආකාරයෙන් ඉගෙනීමේ කාර්යයට මුහුණදී සිටින ජර්මන් වගේම බ්‍රිතාන්‍ය, ඇමරිකන්, ප්‍රංශ සහ ඉතාලි සහෝදරවරුන් මේ කරුණ කෙරෙහි තදින් සිත් යොමු කරනු මැනවි.''

''දියුණුතම රටවල් ඇතුළේ බොහෝ රටවල කොමියුනිස්ට් පක්ෂ තුළට ධනපති පංතිය විසින් ඔත්තුකාරයෝ නිසැකවම ඇතුළු කරනු ලැබෙති. ඉදිරියටත් ඔවුන් විසින් එසේ කරගෙන යනු ඇත. මේ උවදුර මැඩලන එක් ක්‍රමයක් නම් දක්ෂ ලෙස නීත්‍යනුකූල හා නීති විරෝධී කටයුතු සම්බන්ධ කිරීමයි.'' මේ මැලිනොව්ස්කි නමැති ධනපති ඔත්තුකාරයා ජර්මනියේ යුද සිරකරුවකු වශයෙන් සිට බොල්ෂෙවික් පාලන කාලයේ රුසියාවට ආපසු පැමිණි විට රුසියානු කම්කරුවෝ ඔහුට විරුද්ධව වහාම නඩු විභාගයක් පවත්වා ඔහුව වෙඩිතබා මරා දමනු ලැබීය. මේ පිළිබඳව ලෙනින් මෙසේ කියයි. ''අප කළ වරද ගැන මෙන්ෂෙවිකයෝ අපට තදින් පහර දුන්නා. අප කළ වරද නම් ඔත්තුකරුවකු මධ්‍යමකාරක සභාවේ තබාගැනීමයි.'' බොල්ෂෙවික් පක්ෂ තුළට රිංගවන ලද එකම ධනේශ්වර ඔත්තුකරුවා මොහු පමණක් නොවේ. එමෙන්ම ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ පක්ෂ තුළට ධනේශ්වර පංතිය විසින් රිංගවන ලද එකම මැලිනොව්ස්කි මොහු පමණක් නොවීය. ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය තුළට ධනේශ්වර පංතිය සිය කැත පංති අරමුණ ඉටුකර ගැනීමේ අභිප්‍රායෙන් රිංගවන ලද මැලිනොව්ස්කිලා සියදහස් ගණනක් විටින් විට එක් එක් අවස්ථාවලදී එක්කෝ හෙළිදරව් වී ඇත. නැත්නම් තමන් විසින්ම කළ එළි බැස ඇත. ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය තුළ මෙන්ම අපේ රටේ පැරැණි වාමාංශික ව්‍යාපාරයද මේ තත්වයට ගොදුරු වූ බව සත්‍යයකි. දෙවන මහා ලෝක යුද්ධයෙන් අනතුරුව සමසමාජ පක්ෂය දෙකට කැඩී යාමේදී සමසමාජ නායකයින් අතර උග්‍ර මතභේදයකට තුඩුදුන් මෙවැනි එක් ප්‍රශ්නයක් විය. එනම් සමසමාජ නායකයකු වූ ඩොරික් ද සූසා පොලිස් ඔත්තුකාරයෙකු යයි පිලිප් ගුණවර්ධන ප්‍රමුඛ කණ්ඩායම තදින් විශ්වාස කිරීමයි. ලංකා කොමියුනිස්ට් පක්ෂයද 1960 ගණන්වලදී එහි උද්‍යෝගිමත් සාමාජිකයකු වූ නිමල් කරුණාතිලක

පොලිස් ඔත්තුකරුවකු යැයි සැක කොට පක්ෂයෙන් නෙරපා දමන ලදී. අද මොහු එක්සත් ජාතික පක්ෂයේ බල කණුවකි. එලෙසම ජෝර්ජ් ආර්යාව හෙවත් කාල්කැස්මන් බිරිඳ ගැනද කොමියුනිස්ට් පක්ෂය පසුව සැක පහළ කළේය.

කලක් විප්ලවවාදී ව්‍යාපාරයේ නියැලී සිට පසුව විප්ලවාදී ව්‍යාපාරයට ද්‍රෝහී වී සතුරන් අතරට පලාගිය උන් පිළිබඳව ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය ලබා ඇති අත්දැකීම් සම්භාරය අති විශාලය. ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකයකු වූ කාල් කෞට්ස්කිගේ පටන් ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය තුළ මේ වන තෙක් හෙළිදරව් වී ඇති එවන් මිනිසුන් ගණන බොහෝය. චීන කොමියුනිස්ට් පක්ෂයේ කලින් උප සභාපතිවද මාවෝගෙන් පසුව පත්වන්නා හැටියටද චීන සමූහාණ්ඩුවේ ජනාධිපති වශයෙන්ද සිටි ලියු ෂා ඕචි විප්ලවයේ වකවානුවේදී විශාල නායකත්වයක් දරමින් එයට සහභාගී වූ පුද්ගලයකි. නමුත් 1960 අග භාගයේදී ඔහු ද්‍රෝහියකු වශයෙන් හංවඩු ගසා සියලු නිලතලවලින් නෙරපාහරිනු ලැබීය. චීන කොමියුනිස්ට් පක්ෂයේ එවකට සිටී ප්‍රධාන ලේකම් ඩෙංෂියාඕපිං ද විප්ලව වකවානුවේ මධ්‍යම චීනයේ රතු හමුදා මෙහෙයවමින් විප්ලවය වෙනුවෙන් විශාල වැඩකොටසක් ඉටුකළ පුද්ගලයන්ගෙන් කෙනෙකි. ඔහුද 1968 දී ධනේශ්වර ක්‍රියාමාර්ගය ගත් ද්‍රෝහියකු හැටියට හංවඩු ගසා නෙරපා හරිනු ලැබීය. චීන රතු හමුදාවේ ප්‍රධාන අණදෙන නිලධාරි මණ්ඩලයේ නායකයාද ද්‍රෝහියකු හැටියට සලකා පක්ෂයේ දේශපාලන මණ්ඩලයෙන් සහ හමුදාවේ ඔහු දැරූ තනතුරෙන් නෙරපා දමනු ලැබීය. පීකින් නගරාධිපති වූ හා චීන කොමියුනිස්ට් පක්ෂයේ එවකට දේශපාලන සාමාජිකයෙකුව සිටි පෙන්වෙන් ද්‍රෝහියකු හා විදේශ ඔත්තුකරුවකු ලෙස සලකා සිර භාරයට ගනු ලැබීය. සංස්කෘතික විප්ලවයෙන් පසු චීන කොමියුනිස්ට් පක්ෂයේ (9 වැනි) මහ සම්මේලනයෙන් පසු මාවෝගෙන් පසුව පත්වන්නා හා චීන කොමියුනිස්ට් පක්ෂයේ උප සභාපති හැටියටත් පත්කරනු ලැබූ ආරක්ෂක ඇමැති ලිං පියා ඕ විප්ලව සමයේදී මාවෝ සමග දීර්ඝ පාගමනටද පෞද්ගලිකවම සහභාගි වෙමින් විප්ලවය වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කළ පුද්ගලයකි. එසේම සංස්කෘතික විප්ලවය භාර මධ්‍යම කරක සභා කොමිටුයේ ලේකම් චෙන් ෆොතා කලින් මාවෝගේ පෞද්ගලික ලේකම් වරයා විය. චීන ගුවන් හමුදාවේ ප්‍රධාන අණ දෙන නිලධාරී හූ ඇතුළු චීන කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ චීන ත්‍රිවිධ හමුදාවලත් උසස් නිලධාරීන් ගණනාවක් ම

මොවුහු විප්ලව සමයේ ඉදිරියෙන් වැඩ කටයුතු කළ අය වෙති. අද ද්‍රෝහීන් වශයෙන් සලකා චීන කොමියුනිස්ට් පක්ෂයෙන් නෙරපා හැර තිබේ. දේශපාලන මණ්ඩලයේ සාමාජිකයින්ගේ අර්ධයකටත් වැඩියෙන් එසේ නෙරපනු ලැබ ඇත. සෝවියට් කොමියුනිස්ට් පක්ෂය තුළ කෘෂෙව් වැන්නවුණුත් චෙකොස්ලොවෙකියානු කොමියුනිස්ට් පක්ෂය තුළ ඩුබ්ෂෙක් වැන්න වුණුත් හංගේරියානු කොමියුනිස්ට් පක්ෂය තුළ ඉම්රේ නාගී වැන්නවුනුත් ඇමරිකන් කොමියුනිස්ට් පක්ෂය තුළ බෙග්‍රර්ඩන් වැන්නවුණුත් මේ වැනි මිනිසුන් පිළිබඳ උදාහරණ ස්වල්පයක් පමණී. 1961 කියුබානු ආක්‍රමණයේදී CIA එක මුවාවක් වශයෙන් පාවිච්චි කළේ කියුබාවේ සිට මියාමිවලට පැන ආ කැස්ත්‍රෝගේ රජයේ මුල් සති කිහිපය තුළ අගමැති වශයෙන් කටයුතු කළ ජොසේ මාටි සමග කියුබාව මුදාගැනීමට සටන්කළ දේශප්‍රේමියකු වූ මිරෝ ආජන්ටස් නමැත්තාගේ පුත්‍රයා වූ හවානාවේ නීතිවේදී මණ්ඩලයේ හිටපු සභාපතිවර ජොසේ මීරෝ කාර්දේනා ය. මෙවැන්නන් අතීතයේ සහ වර්තමානයේ සිටියා මෙන්ම අනාගතයේදීද පංති සමාජය පවතින තාක්කල් සිටිනු ඇත.

මම 1964 දී ලංකාවට එන විට ලංකාවේ සැබෑ විප්ලවවාදී ව්‍යාපාරයක් තිබුණේ නැහැ. මුළු මහත් වාමාංශික ව්‍යාපාරයම සංශෝධනවාදී ප්‍රතිසංස්කරණවාදී මඩගොහොරුවේ එරිලයි සිටියේ. කොමියුනිස්ට් පක්ෂයෙන් කැඩී ගිය කණ්ඩායමක් ප්‍රේමලාල් කුමාරසිරිගේ සහ ශන්මුගදාසන්ගේ නායකත්වයෙන් යුත් (චීන පිල) කණ්ඩායමත් විප්ලවය ගැන කතා කරමින් සිටියා. නමුත් විප්ලවවාදී වාග්මාලා කටපාඩමින් ඇදබෑම හැරුණු විට ඒ පක්ෂය තුළ විප්ලවවාදී න්‍යායක්වත්, විප්ලවාදී දර්ශනයක්වත්, විප්ලවවාදී වැඩපිළිවෙළක්වත්, විප්ලවවාදී ප්‍රතිපත්ති මාලාවක්වත්, විප්ලවවාදී ක්‍රියාමාර්ගයක්වත්, විප්ලවවාදී සංවිධානයක්වත්, විප්ලවවාදී ජීව ගුණයක්වත් තිබුණේ නැහැ.

ඔවුන් විප්ලවය ගැන කතා කළ හෙයින් ඔවුන් සැබෑ විප්ලවවාදීන් යැයි රැවටී ඔවුනට සහයෝගය දුන්නා. නමුත් භාවිතාව තුළින් ඔවුන් තේරුම්ගත් පසු සැබෑ විප්ලවවාදී ව්‍යාපාරයක් ගොඩනැගීමේ අවශ්‍යතාවය තේරුම්ගෙන ඒ අනුව කටයුතු කරන්නට සිදුවුණා. මේ රටේ සමාජවාදී විප්ලවය ජයග්‍රහණය කරන්නට නම් සැබෑ නිර්ධන පංති විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගිය යුතුව තිබුණා. විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගිය යුත්තේ විප්ලවවාදීන්ගෙන් නමුත් විප්ලවවාදීන් නැති තැනක

විප්ලවවාදී පක්ෂයක් ගොඩනගන්නේ කොහොමද? මුළු මහත් වාමාංශික ව්‍යාපාරයම සංශෝධනවාදී මඩගොහොරුවේ වැටී සිටින අවස්ථාවක, වෘත්තීය සමිති දේශපාලනයත්, පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණවාදයත්, කම්කරු පංතිය ප්‍රමුඛ මුළුමහත් ජනතාවම දැඩි ලෙස වෙලාගෙන ඇති අවස්ථාවක සකලවිධ දේශීය දේශපාලකයින් විප්ලවීය දර්ශනයට, ක්‍රියාමාර්ගයට එරෙහිව අවි අමෝරා ඇති අවස්ථාවක යටත්විජිත ඉතිහාසයේම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය විසින් ඉතාමත් සාර්ථක ලෙස ධනේශ්වර පාර්ලිමේන්තු දේශපාලනය ජනතාව අතර කිඳා බස්සවා ඇති රටක ලංකාවේ එවකට මැතිවරණ අටවාරයක් පවත්වා තිබිණි. ආසියාකරයේ බ්‍රිතාන්‍ය යටත්විජිත අතුරෙන් මැතිවරණයෙන් පාලක දේශපාලන පක්ෂය - පංතිය නොවේ - විටින් විට මාරුකර ඇති රටක දක්ෂිණාංශය පමණක් නොව වාමාංශයද පාර්ලිමේන්තු මිත්‍යාව ජනතාව අතර තහවුරු කරමින් සිටින රටක විශේෂයෙන්ම විප්ලවකාරී දේශපාලන පක්ෂයක් ගොඩ නැගීම සුළු පටු නොවේ. ලෙහෙසි පහසු සරල හා ඉක්මනින් කළ හැකි කටයුත්තක් නොවේ.

එය ඉතාමත්ම බැරෑරුම්ම හා පරිස්සමින්ම අතගැසිය යුතු වැදගත්ම සහ සංකීර්ණතම කටයුත්තකි. ''බහුජනතාව විසින් න්‍යායක් ග්‍රහණය කරගත් විට එය ද්‍රව්‍යමය බලවේගයක් බවට පත්වේ.'' කියලා මාක්ස් කියලා තියනවා. අපේ රටේ එවකට විප්ලවවාදී පක්ෂයක්, විප්ලවවාදී බලවේගයක් නොතිබුණාට පීඩිත පංති, නිර්ධන පංති බහුජන සමූහයක් සිටියා. විප්ලවවාදීන් විසින් කළ යුතු කටයුත්ත වූයේ මේ නිර්ධන පංති බහුජන සමූහයාට මාක්ස්වාදී න්‍යාය ග්‍රහණය කරවා, ඔවුන් විප්ලවවාදී ද්‍රව්‍යමය බලවේගයක් බවට පත්කර ඒ විප්ලවීය ද්‍රව්‍යමය බලවේගය අව්‍යාජ මාක්ස් ලෙනින්වාදී වැඩපිළිවෙලක් තුළ සංවිධානය කර ඒ විප්ලවීය සංවිධානයේ නායකත්වය යටතේ මග පෙන්වීම යටතේ පුළුල් බහුජන සමූහයා විප්ලවය කරා මෙහෙයවා ධනේශ්වර ආඥාදායකත්වය හා ආධිපත්‍ය සුන්බුන් කර නිර්ධන පංති ආඥාදායකත්වයක් ස්ථාපිත කර සූරාකෑමෙන් තොර සමාජවාදී සමාජ ක්‍රමයක් හරහා උත්තරීතර කොමියුනිස්ට් සමාජය වෙත පා තැබීමයි. මාක්ස්වාදී න්‍යාය නිර්ධන පංති බහුජන සමූහයාට ග්‍රහණය කරවා ඔවුන් විප්ලවවාදී බලවේගයක් බවට පෙරළීම කරන්නේ නැතිව විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගිය නොහැක. විප්ලවවාදීන් ගොඩනගන්නේ නැතිව විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගිය නොහැකිය. විප්ලවවාදී නැති තැන විප්ලවවාදී පක්ෂයක් තිබිය නොහැකිය. විප්ලවවාදී පක්ෂයක්

ගොඩනැගීමට නම් විප්ලවවාදීන් සිටිය යුතුමය. විප්ලවාදීන් බිහිකළ යුතුමය.

විප්ලවවාදීන් බිහි කිරීමට නම් ප්‍රතිසංස්කරණය ජයගෙන ඇති සමාජය ප්‍රතිසංස්කරණවාදී දර්ශනයට සහ සිද්ධාන්තවලට එරෙහිව අනවරත අරගලයක් අප්‍රතිහත ධෛර්යයකින් යුතුව නිර්ධන පංති විප්ලවවාදී දර්ශනය හා ක්‍රියාමාර්ගය ගොඩනැංවීම සඳහා කළ යුතුය. මෙය තමා මතවාදී අරගලය යනුවෙන් හඳුන්වන්නේ. ජනතාව තුළ ධනේශ්වර මතවාදයට එරෙහිව විප්ලවවාදී මතවාදය නගාසිටුවන්නේ නැතිව විප්ලවවාදීන් ගොඩනැගිය නොහැකිය. එබැවින් අපි ප්‍රථමයෙන්ම කළේ ධනේශ්වර මතවාදයට එරෙහිව ජනතාව අතර විප්ලවීය මතවාදය ගොඩනැගීම සඳහා කටයුතු කිරීමයි. මේ කටයුත්ත සඳහා දියුණු වූ, වර්ධනය වූ, පරිසමාප්ත වූ මාක්ස් ලෙනින්වාදී සමූහයක් එක් රැස් කරගැනීමට සිටියේ නැත. විප්ලවවාදී කාඩර්වරු සිටියේ නැත. මාක්ස් ලෙනින්වාදී පක්ෂයක් ගොඩනැගීමේ ක්‍රියාවලියේ තීරණාත්මක සාධකයක් තමා දක්ෂ, කාර්යශූර, බුද්ධිමත්, පරිත්‍යාගශීලි, අවංක කැපවුණු වර්ධනය වූ මාක්ස් ලෙනින්වාදී කාඩර්වරුන් සිටීම. අපට නිර්ධන පංති විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගීමේ අරමුණ ඇතිව විප්ලවවාදීන් ගොඩනැගීමේ අරමුණ ඇතිව ජනතාව අතර මතවාදී අරගලයක් කිරීමට අවශ්‍ය ප්‍රමාණයක් දක්ෂ සහ වැඩුණු මාක්ස් ලෙනින්වාදී කාඩර්වරු සිටියේ නැහැ. කුඩා හෝ සංවිධාන මට්ටමක් ගොඩනගා ගැනීමට අවශ්‍ය විප්ලවවාදීන් කිහිප දෙනෙකුවත් සිටියේ නැහැ. චීන පිලෙන් සොයා ගත හැකි කිහිප දෙනා මාක්ස් ලෙනින්වාදී දැනුම අතින් ඉතාමත් පහත් මට්ටමක දේශපාලනිකව ළපටි, ප්‍රතිසංස්කරණ ජරාජීර්ණ වූ පැරැණි සංවිධාන ක්‍රමවලට ඇබ්බැහි වූ පැරැණි වාමාංශික ව්‍යාපාරයේ පරාභව ගත වී මැරීයන අංග ලක්ෂණ උරුම කරගත් ග්‍රහණය කරගත් අය වුණා. අපේ සටන් ව්‍යාපාර පටන් ගැනුණේ එහි ආරම්භයට පුරෝගාමී වුණේ වර්ධනය වී ගිය මාක්ස් ලෙනින්වාදී සමූහයක් නොවේ. එක් පුද්ගලයකුට මුළුමහත් ධනේශ්වර ව්‍යාපාරයේම ප්‍රබල ක්‍රියාකාරිත්වයකට එරෙහිව පැරැණි වාමාංශික ව්‍යාපාරයේ විකෘති දර්ශනයට එරෙහිව ඉතාමත් අපහසු තත්වයන් යටතේයි, විප්ලවවාදී දර්ශනය ජනතාව අතර ජයග්‍රහණය කිරීමට සිදුවුණේ. ඊට එරෙහිව පැමිණි බාධක හා විරෝධතා අනන්තය. මුල් කාලයේදී මතවාදී අරගලය ජනතාව අතර කිරීම, පැරැණි වාමාංශික ව්‍යාපාරයෙන් සොයාගනු ලැබූ කුරුවල් වූ කිහිපදෙනෙකු සහ නවකයින්

කිහිප දෙනෙකු අතරින් කාඩර්වරුන් කිහිප දෙනෙකු වර්ධනය කිරීමත් සඳහා ඉතාමත් දුෂ්කර ඉතාමත් අපහසු වැඩ කොටසකුයි කරන්න සිදුවුණේ. සෑම සමාජ ආයතනයක් මෙන්ම දේශපාලන පක්ෂයකටත් පරිණාමයක් ඓතිහාසික විකාශනයත් සංවර්ධනයත් තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණ පිළිබඳවත් සත්‍යය එයයි. ඕනෑම දේශපාලන පක්ෂයක් සංවර්ධනය වනුයේ ඒ රටේ පවතින සමාජ දේශපාලනමය තත්වයන් පදනම් කරගෙන ඊට අනුරූපී ලෙසය. ඒ ඓතිහාසික තත්වයන් තුළය. එබැවින් එම පක්ෂයෙහි අභ්‍යන්තර තත්වයත් එය ගමන් ගත් මාර්ගයත් කොටින්ම මුළුමහත් පක්ෂය කෙරෙහි යමෙක් විග්‍රහ කරනවා නම් එය කළ හැක්කේත්, කළ යුත්තේත් එම පක්ෂය පැවැති සහ සංවර්ධනය වුණු ඓතිහාසික තත්වයන් තුළය.

1964 සිට 1969 දක්වා අප විසින් කරන ලද්දේ තනිකරම ධනේශ්වර මතවාදයට එරෙහිව විප්ලවීය මතවාදය ජයග්‍රහණය කිරීම සඳහා ජනතාව අතර කරන ලද. කඨෝර වූත් දුෂ්කර වූත් අරගලයක් පමණී. 1969 දක්වාම පක්ෂ සංවිධානයක් ගොඩනැගුවේ නැත. එයට හේතුව පක්ෂ සංවිධානයක සාමාජිකයින් වීමට තරම් සුදුසු වූත් දියුණු වූත් සහෝදරවරුන් සැහෙන පිරිසක් ඒ වන විට නොසිටීමයි. මතවාදී අරගලයේ ප්‍රතිඵල වශයෙන් විප්ලවවාදී සහෝදරවරුන් සැහෙන පිරිසක් ගොඩනගා ගැනීමත් සමගම අප සංවිධානය ගොඩනැගීම පටන් ගත්තා. මතවාදී අරගලය කිරීම සඳහා අප පළමුවෙන්ම නැඹුරුවූයේ ජනතාව සමඟ ජනතාවගේ සමාජ ප්‍රශ්න සාකච්ඡා කරමින් ඒවා ද්විඝට්ටනාත්මක ලෙස විශ්ලේෂණය කරමින් විග්‍රහ කරමින් ඒවා බිහි වී වර්ධනය වී ඇති ආකාරයන් ඒවායේ උපතට හේතූන් ඒවායේ අද තිබෙන සැබෑ තත්වයත් ඉදිරියට වර්ධනය වන ආකාරයත් ඒවාට ඇති සැබෑ තාත්වික විද්‍යානුකූල විසඳුමත් සාකච්ඡා කිරීම මගිනුයි. මෙලෙස ජනතාවගේ ප්‍රශ්න සමාජ ප්‍රශ්න මාක්ස් ලෙනින්වාදී දෘෂ්ටිකෝණයකින් විග්‍රහකර ඉදිරිපත් කරගෙන යාමේ ක්‍රියාවලියේදී අප ලැබූ අත්දැකීම්වල ප්‍රතිඵලයක් වශයෙනුයි, පංති 5 හටගැනුණේ. පංති 5ටත් ඒ අනුව ඓතිහාසික විකාශනයක් පරිණාමයක් සංවර්ධනයක් තිබෙනවා. පංති පහ තැබීමෙන් කිසිවෙකු මාක්ස් ලෙනින්වාදියෙකු වන්නේ නැහැ. එමගින් කෙරෙන්නේ මිනිසුන් මාක්ස් ලෙනින්වාදී චින්තනයට හැරවීම, නැඹුරුවීම පමණී. එය ඉතාමත් සාර්ථක ප්‍රතිඵල ගෙනදී තිබේ.

පංති පහෙන් කෙරෙන්නේ ලංකාවේ වත්මන් දේශපාලන තත්වය මාක්ස් ලෙනින්වාදී දෘෂ්ටිකෝණයක පිහිටා විග්‍රහකර එමගින්

ජනතාව මාක්ස් ලෙනින්වාදී පැත්තට ඇද ගැනීම පමණි. එමගින් මිනිසුන් සමාජය වෙලී ඇති ප්‍රශ්න තුළින් ඒ හරහා ඒවාට සැබෑ විද්‍යාත්මක විසඳුම් සොයා මාක්ස් ලෙනින්වාදය වෙතට නැඹුරු කරයි. ධනේශ්වර චින්තාවට විරුද්ධව නිර්ධන පංති චින්තාවට ජයකෙහෙළි නංවනු පිණිස කරනු ලබන මතවාදී අරගලයේ පුරෝගාමී වැඩකොටස ඉටු කිරීමට පංති පහට ඇති හැකියාව ඉතිහාසය විසින් මොනවට ඔප්පු කර තිබේ. මිනිසුන් මාක්ස් ලෙනින්වාදය වෙතට ක්‍රියාත්මක අයුරින් සැහෙන ප්‍රමාණයක් නැඹුරු කිරීම යාන්ත්‍රික ලෙස කළ නොහැකිය. ඔවුන් මාක්ස් ලෙනින්වාදයට ගෙන ආ යුත්තේත් ගෙන ආ හැක්කේත් ඔවුන්ගේම සමාජ ප්‍රශ්න තුළින්මය. මෙසේ මාක්ස් ලෙනින්වාදයේ චින්තාව පැත්තට නැඹුරු අයට අපි 1968 පටන් අධ්‍යාපන කඳවුරු සංවිධානය කරමින් මාක්ස් ලෙනින්වාදී දර්ශනය පිළිබඳවත් ලාංකීය විප්ලවයේ ගැටලු පිළිබඳව සෑහෙන අවබෝධයක් දෙමින් සහ නව දර්ශනය හා ක්‍රියා මාර්ගය භාවිතාවේ යෙදීමට අවකාශ ලබා දෙමින්ද එමගින් න්‍යායික දැනුමට අමතරව භාවිතාවේ යොදා එය ප්‍රත්‍යක්ෂ කර ගැනීමට ඉඩ සලසමින්ද මතවාදී අරගලය ඉදිරියටම ගෙන ආවෙමු. ජනතාවට දේශපාලන අවබෝධය ලබාදීම අතින්, මාක්ස් ලෙනින්වාදී චින්තාව ජනතාව අතර පතුරුවාලීම අතින්, අපි සමකාලීන ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ විප්ලවවාදීන් අතර පෙරමුණේ සිටින බව නොරහසකි.

සංවිධානයක් ගොඩනැගීමට තරම් විප්ලවවාදීන් පිරිසක් ගොඩනගමින් සිටින විට සංවිධානය කිරීමේ ප්‍රශ්න පැනනැගුණාම එම ප්‍රශ්නයන් ඉතාම නිවැරැදිව මාක්ස් ලෙනින්වාදී පදනමකින් ක්‍රියාවට නැගුණා. අප ඉහළ සිට පහළට ව්‍යාපාරයේ සංවිධානය ගොඩනැගුවේ නැහැ, පැරැණි වාමාංශික ව්‍යාපාර හා ධනේශ්වර දේශපාලන පක්ෂ ලෙසින්. ඒ වෙනුවට අප කළේ පහළ සිට ඉහළට සංවිධානයක් ගොඩනැගීමයි. මේ අනුව පක්ෂ ශාඛාව, ග්‍රාමීය කොමිටිය, ප්‍රාදේශීය කොමිටිය හරහා දිස්ත්‍රික් කොමිටිය දක්වා සංවිධාන ගොඩනැගී තිබුණා.

1941 දී ඉතාලියානු හා ජර්මන් පැසිස්ට්වාදය ඇල්බේනියාව, දෙවන ලෝක මහා යුද්ධයේදී ආක්‍රමණය කරන විට එහි කොමියුනිස්ට්වාදීන් විවිධ නගරවල හා ගම්වල තනි කණ්ඩායම් ගණනාවක් ලෙස සංවිධානය කර තිබුණා. අන්වර් හෝජාගේ නායකත්වයෙන් යුත් කණ්ඩායම වූයේ තෝර් ෂේ නගරයේයි. පහළ මට්ටම්වල මෙම කොමියුනිස්ට් කණ්ඩායම්

කිහිපයම එකට එකතු කර සම්මේලනයක් පවත්වා සම්බන්ධ කිරීමෙනුයි ඇල්බේනියානු කොමියුනිස්ට් පක්‍ෂය ගොඩනැගුවේ. මෙය ඉතාමත් සාර්ථක ප්‍රතිඵල ගෙන දුන් හා නිවැරැදි ක්‍රමයක් බව ඔප්පුවී තිබේ. අප විසින් ගොඩනැගිය යුතු සංවිධානය කුමක්ද යන්න තීරණය කිරීමේදී අපි නැවතත් නිවැරැදිව කටයුතු කර තිබෙනවා. ගරිල්ලා හමුදාවක් ලෙස සංවිධානය කළ යුතුද? නැතිනම් දේශපාලන පක්‍ෂයක් වශයෙන් සංවිධානය විය යුතුද? අද මේ ප්‍රශ්නය ජාත්‍යන්තර විප්ලවවාදී ව්‍යාපාරය තුළ උග්‍ර මතභේදයකට, උග්‍ර ගැටීම්වලට තුඩු දී තිබෙන්නක්. මේ දෙකේ අන්තර් සම්බන්ධතාවය තේරුම්ගත් අපි අප විසින් ගොඩනැගිය යුත්තේ පක්‍ෂයක් බවත් එය පංති සටනේ උච්ඡතම අවධිය වන සන්නද්ධ අරගලය සඳහා සූදානම් වන පක්‍ෂයක් වශයෙන් තීරණාත්මක මොහොතකදී විප්ලවයේ පෙරමුණු බලඇණිය වශයෙන් ජනතාවට මාර්ගෝපදේශකත්වය සහ නායකත්වය දෙන ජනතාව ඉදිරියට මෙහෙයවන පෙරටු සේනාංකය වශයෙන් සංවිධානය විය යුතු බවත් පක්‍ෂය සන්නද්ධ අරගලයේදී අවි ගෙන සටන් වදින හමුදාවකට පෙරළෙන බවත් මේ යුගයේදී සටන් නොකරන විප්ලවවාදී දේශපාලකයින් සිටිය නොහැකි බවත් එසේම දේශපාලන අවබෝධයෙන් තොර විප්ලවවාදී හටයින් සිටිය නොහැකි බවත් එබැවින් සටන් බිමේ හමුදාව වනුයේ මුළු මහත් පක්‍ෂය බවත් තේරුම්ගෙන ඒ අනුව නව පන්නයක විප්ලවකාරී පක්‍ෂයකුයි ගොඩනැගිය යුත්තේ යන මතයට එළඹුණා.

මෙය කළේ ජාත්‍යන්තර විප්ලවවාදී ව්‍යාපාරය නොයෙක් තැන්හි ලබා ඇති අත්දැකීම්වලට අනුරූපවයි. නමුත් එතරම් සියුම් සංකීර්ණ දියුණු විප්ලවවාදී පක්‍ෂයක් ගොඩනැගීමේ කටයුත්තත් එවැනි පක්‍ෂයක ඓතිහාසික සංවර්ධනයත් සරල එකක් නොවේ. එය ඉතාමත්ම සංකීර්ණ ක්‍රියාදාමයක් විය යුතුය. 1969 වන විට අපේ සංවිධානය වෙතට අප විසින් විවිධ පැරැණි වාමාංශික දේශපාලන පක්‍ෂවලින් නානා කණ්ඩායම් දිනාගනු ලැබ සිටියා. මේ කණ්ඩායම් එකිනෙක තුළ කිසියම් දුරකට මතවාදීවත්, සංවිධානාත්මකවත් ගුලිගැසීම් හෙවත් විශේෂ බැඳීම් පැවැතුණා. ධනේශ්වර ක්‍රමයක් තුළ පැවැතීමත් පැරැණි වාමාංශික ව්‍යාපාරයෙන් භින්නවීමේදී එහි ගුණාංග සමහරක් ශේෂ කරගැනීමක් නිසා මේ සුළු ධනේශ්වර ගුණාංග තවත් කලකට පවතින බව තේරුම්ගත් අපි ඉතාමත් දියුණු, ඉතාමත් සංකීර්ණ ලෙනින්වාදී බොල්ෂෙවික් පක්‍ෂයක් අව්‍යාජ විප්ලවකාරී බහුජන

කොමියුනිස්ට් පක්ෂයක් ගොඩනැගීමේ අරමුණ ඇතිව එහි සංවිධානාත්මක ප්‍රාරම්භක පියවර වශයෙන් ජනතා විමුක්ති පෙරමුණ අරම්භ කළා. ජනතා විමුක්ති පෙරමුණ යන නම තැබීමේදීම මා අදහස් කළේ පක්ෂයක් ලෙනින් ඉල්ලන පරිදි අව්‍යාජ විප්ලවකාරී බහුජන පක්ෂයක් ගොඩනැංවීමේ කටයුත්තෙහි එක් අවධියක් ලෙසයි. එනම් ජනතා විමුක්ති පෙරමුණ ගොඩනගා එහි තුළ ක්‍රියාත්මක වන අය භාවිතාව තුළින් පෙන්වන මාක්ස් ලෙනින්වාදී විප්ලවවාදී ජීව ගුණය අනුව ඔවුන් ලබා ඇති පන්නරය අනුව ඔවුන්ගේ වර්ධනය අනුව ඔවුන් තෝරාගෙන අයෝමය විනයක් හා මතවාදී ඒකාග්‍රතාවයක් ද යුත් නිර්මල මාක්ස් ලෙනින්වාදී චින්තනයත්, ක්‍රියාමාර්ගයනුත් උපාය උපක්‍රමත්, සංවිධාන ක්‍රමත් අනුගමනය කරන බොල්ෂෙවික් පක්ෂයත් ගොඩනැගීමයි. (දකුණු වියට්නාමයේ ජාතික විමුක්ති පෙරමුණ ගොඩනගා එය තුළ ක්‍රියාත්මක වීමේදී ලබන ලද පන්නරය අනුව තෝරාගත් සහෝදරවරුන්ගෙන් සැබෑ විප්ලවවාදී කාඩර්වරුන්ගෙන් සාමාජිකයන්ගෙන් ජනතා විප්ලවකාරී පක්ෂය ගොඩනගන ලද බව පෙනේ.)

කොටින්ම කියතොත් ජනතා විමුක්ති පෙරමුණ අනාගතයේදී ගොඩනැගෙන කොමියුනිස්ට් පක්ෂය සඳහා කොමියුනිස්ට් සදාචාරයෙන් සහ ජීවගුණයෙන් යුත් සැබෑ මාක්ස් ලෙනින්වාදීන් බිහි කරන පක්ෂ පාසලක් බවට පත් කිරීමය, මගේ අභිප්‍රාය වූයේ. සැබෑ කොමියුනිස්ට් සදාචාරයකින් යුත් මිනිසා 21 වන ශත වර්ෂයේ මිනිසා හැටියට සාමාන්‍යයෙන් ගණන් ගනු ලැබේ. මෙලෙස 21 වන ශතවර්ෂයේ මිනිසා 20 වන ශතවර්ෂය තුළ ගොඩ නැගමේ කටයුත්ත සඳහා පාසලක් ලෙස ජනතා විමුක්ති පෙරමුණ ගොඩනැගීම මගේ බලාපොරොත්තුව වුණා. නමුත් අන්‍යස්ථානයන්හි මෙන්ම අපටත් බාහිර මෙන්ම අභ්‍යන්තර සතුරු උවදුරුවලට නිරන්තරයෙන්ම ගොදුරු වන්නට සිදුවුණා. ධර්මසේකර කල්ලියේ ද්‍රෝහී ක්‍රියා පිළිවෙතත් කේනමන් කල්ලියේ පාලනය යටතේ පැවැති ''ඇත්ත'' පත්‍රයේ පාවාදීමුත් ශන්මුගදාසන් කල්ලියේ ද්‍රෝහී ක්‍රියාත් විප්ලවකාරයින් යයි කියාගත් ඇතැම් වෙනත් කල්ලිවල ද්‍රෝහී පාවාදිමුත් හේතු කොටගෙනත් අනෙක් පැත්තෙන් ධනේශ්වර රාජ්‍ය යන්ත්‍රයේ මර්දනය හේතු කොට ගෙනත් 1969 අග භාගයේදී අපේ සංවිධාන වැඩකටයුතු සෑහෙන දුරට අඩපණවී ගොස් 1970 අප්‍රේල්වලදී පළමු ධවල භිෂණයට මුහුණ පෑමට සිදුවුණා. ඉන්පසු දිගටම අපට එරෙහිව නොකඩවාම ධවල භීෂණය පැවැතුණා. 1971 මාර්තුවේදී එය අතිශයින් උත්සන්න වන තෙක්, 1971 මාර්තු වන විට ජනතා විමුක්ති

පෙරමුණ බොහෝ ස්ථානවල දිස්ත්‍රික් කමිටු දක්වා ගොඩනගා තිබුණ අතර ඇතැම් තැන්හි තවමත් දිස්ත්‍රික් කමිටු මට්ටම ගොඩනගා නොතිබුණ හෙයින් ඒ තැන්වල කාඩර්වරුන්ගේ සංවිධායක කොමිටි මගින් කටයුතු කරගෙන ගියා. මේ වකවානුව තුළ දිස්ත්‍රික් කොමිටි ඒකාබද්ධ කොට සංවිධානය මධ්‍යගත කිරීම අත්‍යවශ්‍ය වුවත් පංති සතුරාගේ මර්දනය හේතුකොටගෙන ඒ සඳහා පක්ෂ සම්මේලනයක් එක තැනකට කැඳවීම කිසිසේත් උචිත වූයේ නැහැ. (පංතියක් තියෙනකොට අල්ලන්න යන තත්වයක් යටතේ පක්ෂ සම්මේලනයක් එක තැනකට කැඳවීම දුෂ්කර විය. එබැවින් අප්‍රේල් අරගලයට සහභාගි වන විට අපි ජනතා විමුක්ති පෙරමුණ ගොඩනගා අවසන් වී තිබුණේ නැහැ.)

මුලදී 1964 පටන් මතවාදී අරගලය දියත් කළ අවස්ථාවේ පටන් මම කුමන අපහසුකම් තිබුණත් සාමූහිකව වැඩ කිරීමේ හා සංවිධානාත්මකව වැඩ කිරීමේ අවශ්‍යතාවය උඩ කුඩා කණ්ඩායමක් ඒ කටයුත්ත සඳහා සංවිධායක මණ්ඩලයක් වශයෙන් ගොඩනැගුවා. එම සංවිධායක මණ්ඩලය මගිනුයි, පක්ෂය ගොඩනැගීම සඳහා කටයුතු මෙහෙයවුණේ. මේ සංවිධායක මණ්ඩලය පවත්වාගෙන යාමත් ඉතාමත් අපහසු වුණා. මන්ද ඒ සඳහා වර්ධනය වූ අය, උචිත අය හිඟවීමයි. කෙසේ වෙතත් අප සිටින තත්වය යටතේ සහ සිටි මිනිසුන් සමග ඉදිරියට යා යුතුව තිබුණා. මාක්ස් ලෙනින්වාදියා ජීවත්විය යුත්තේ, ක්‍රියාකළ යුත්තේ හිතින් මවාගත් මනඃකල්පිත ලෝකයක නොව යථාර්ථවාදී පවතින ලෝකයෙහිය. එබැවින් පැවතුණ තත්වයන් යටතේ මට ක්‍රියාත්මක වන්නට සිදුවුණා. මෙලෙස පළමුවෙන්ම ගොඩනගන ලද සංවිධායක කොමිටියෙන් දුර්වලයන් හා ඉතාමත් පරාභවගත වූවන් අයින් කර අලුතින් අය ගනිමින්ද පැරැණි සංවිධායක කොමිටිය විසුරුවා හැර නව සංවිධායක කොමිටි ගොඩනගමින්ද ඉදිරියට ගෙන ගියා. (මෙම සංවිධායක කොමිටියේ මුල පටන් නොකඩවාම සිට ඇත්තේ මමත්, සනත්, කරුණාරත්න) මේ සංවිධායක කොමිටියට තමයි දැන් දේශපාලන මණ්ඩලය යැයි හඳුන්වනු ලබන්නේ. ඇත්ත වශයෙන්ම අපට දේශපාලන මණ්ඩලයක් තිබුණේ නැහැ. මධ්‍යම කාරක සභාවක් තිබුණෙත් නැහැ. මන්ද ජනතා විමුක්ති පෙරමුණ ඒ දක්වා ඉහළට සංවිධානය වී නොතිබුණ නිසයි. නමුත් අවසාන කාලයේදී සම්මේලනයක් පවත්වන තුරු වැදගත් තීරණ ගැනීමට හා ඒකාබද්ධතාවය පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් ලේකම් සහ උප ලේකම්වරුන්ගෙනුත් සංවිධායක කොමිටියෙනුත් වෙනත් විශේෂ අංශවල වැඩකළ අයගෙනුත් සමන්විත

පිරිසක් තාවකාලිකව කැඳවා එය එක්තරා අන්දමක මධ්‍යම කාරක සභාව වෙනුවට ක්‍රියා කරන කොමිටියක් හැටියට පවත්වාගෙන ආවා. මෙය පළමුවෙන්ම 1971 ජනවාරි මැදදී රැස්වුණා. අන්තිම කාලයේ තිබූ සංවිධායක කොමිටිය මා බදුල්ලේ සිර ගෙදර සිටියදී සනත්ලා, කරුලා හා අතුලලා විසින් තෝරා ගන්නා ලද්දක්. ඔවුන්ගේ අභිමතය පරිදි එය තෝරා ගෙන ඇත්තේ මා සිරභාරයට ගන්නා අවස්ථාවේ (පළමුවර) තිබූ කොමිටිය විසුරුවා හැරීමෙන් පසුවයි. මා සිර භාරයේ සිට පැමිණි පසු මේ ගැන එකඟත්වයක් තිබුණේ නැහැ. එහි මා සමග සිටියේ උයන්ගොඩ සහෝදරයා පමණයි.

පක්ෂය තාමත් ගොඩනැගී නැති අවස්ථාවේ පක්ෂ සංවිධාන අතර සම්බන්ධතාවය පවත්වාගෙන යාමටත් පක්ෂය ඉදිරියට ගෙනයාමේ කටයුත්ත පහසු කිරීම සඳාහත් ලෙනින් රහසිගත තත්වයන් තුළ මෙවැනි අයුරින් වැඩ කළා. ලෙනින් මේ පිළිබඳව ''වාමාංශික කොමියුනිස්ට්වාදය ළදරු වලිප්පුවකි'' පොතේ 33 පිටුවේ මෙසේ කියයි.... ''අප පක්ෂය තුළ නායකයින්ගේ ආඥාදායකත්වයට විරුද්ධව නිතරම ප්‍රහාර එල්ල වුණි. මට මතක හැටියට මුලින්ම එබඳු පහර ගසන ලද්දේ 1895දීය. එකල නිල වශයෙන් පක්ෂය බිහිවී නොතිබුණි. එහෙත් ඒ කාලයේ කණ්ඩයම්වල නායකත්වය බාරගැනීම සඳහා ශාන්ත පීටර්ස්බර්ග් නුවර මධ්‍යම කණ්ඩායමක් ගොඩනගන ලද්දේය.....''

අපි වැඩකළේ ජාත්‍යන්තර විප්ලවවාදී ව්‍යාපාරය ලබා ඇති ඓතිහාසික අත්දැකීම්වලට අනුවයි.

පක්ෂ අභ්‍යන්තරයේ ඇතිවූ භේදයන්..

**01. ධර්මසේකර ප්‍රශ්නය**

ධර්මසේකර* අපට හමුවන විට ඔහු සංශෝධනවාදී පක්ෂයක සාමාජිකයෙකි. ඔහුට එහි තැනක් නැතිකම ගැන කලකිරී සිටියා. අපි සංශෝධනවාදීන්ගේ ශිෂ්‍ය ව්‍යාපාරවල වැඩ කරන්නට පටන් ගත්තේ චේ ගුවේරාගේ මරණින් ටික කලකට පසුවයි. විද්‍යාලංකාර සරසවියේ වර්ජනයෙන් පසු අස්කරනු ලැබූ ජයකොඩි අපේ පංතිවලට ආවා. ඔහු මගිනුයි ධර්මසේකර හමුවන්නේ. ඔහු මුල් දවසේම හිස උදුම්මාගෙන සුළු ධනේශ්වර මමත්වයෙන් හා මාන්නයෙන්, නමුත් හිස් ඔළු ගෙඩියක් ඇතිව අප වෙත පැමිණ පක්ෂය ගොඩනැගීමට විරුද්ධ බවත් තිබෙන පක්ෂයට නම් නොයන බවත් පටන්ගන්න එකක් නම් සලකා බලන බවත් අප සමග එකඟත්වයකට එන්නට සාකච්ඡා නොකර ඔහුගේ මිත්‍රයින්ට

ප්‍රකාශක සටහන්:
*. ජී.අයි.ඩී. ධර්මසේකර-වර්තමානයේ අනගාරික ධර්මසේකර

අප චීන පිලේ ඔත්තුකාරයින් යයි කියා අපට එකතු නොවන ලෙස කියා ගියා. නමුත් අපි ගැන පැහැදී සිට (පංතිවලින්) ජයකොඩි දිගටම අප සමග වැඩකරන්නට පටන්ගත්තා. විද්‍යාලංකාරයේ සංශෝධනවාදී ශාඛාවට අප පංති තියන විට නැවත ධර්මසේකර ආවා. පසුව ඔහු පිළිගත්තා ඔවුන් කැඩී යන එක වළක්වා ගන්නටත්,අප තුළට රිංගා සංශෝධනවාදීනට ඔත්තු සැපයීමටත් ඔහු ආව බව. අපේ ව්‍යාපාරය එදා සංශෝධනවාදීනට එළිදරව් කළේ මොහුයි. පසුව මොහු අපේ පංතිත්, ප්‍රතිපත්තිත්, වැඩකරන ශෛලියත් ඉගෙනීමට ඇතුළට රිංගුවා. නමුත් එය උපන් ගෙයිම හෙළිදරව් වුණා.

දිනක් ඔහුගේ සගයින් කිහිපදෙනෙක් පංතියක් තැබීමට කැඳවනවායැයි කියා මට කතා කර මම එහි යන විට ඔහු එහි කැඳවා තිබුණේ ඔහුට එදින සවස කඩේදී මුණගැසුණ අපේ සුසිල්, නිමල් මහරගේ, ප්‍රේමපාල, විල්සන් යන අයයි. අපි එකිනෙකා හඳුනන බව නොදත් මොහු කළ කපටිකම හෙළිදරව් වුණා. පසුව පියතිලක ඉදිරියේ බොරු ස්වයං විවේචනයක් කර පක්ෂය තුළට රිංගුවා. අපෙන් වැඩකරන ක්‍රමය පංති සියල්ල ඉගෙන අප ලවාම කඳවුරු පවත්වාගෙන (ඒ අතර ඔහුගේ මිත්‍ර සංශෝධනවාදී බදුලු දිසා සංවිධායක අගා ජයසේන සමග කියා තිබුණා, අපෙන් සියල්ල ඉගෙන වෙනම එකක් සාදන බව.) ඔහු වැඩකළ ප්‍රදේශවල මිනිසුන් කෘත්‍රිම ලෙස සුළු ධනේශ්වර මට්ටමෙන් ඔහු වටා රඳවා ගැනීමට ඔහු වැඩ කළ බව පසුව ඔප්පු වුණා. එදා පක්ෂය ගැන කවුරුත් කිසිවක් කීවේ නැහැ. මේ තත්වය ප්‍රයෝජනයට ගත් මොහු තමා වටා මිනිසුන් ගොඩනගාගත්තා. මම ඔහුගේ මිනිසුන්ට කඳවුරු කළ අවස්ථාවල අවසානයේදී මා ගිය විට ඔහු කියා තිබෙනවා ''මට අසනීප නිසා මා ගෝලයෙකු එව්වා. පංතිය තැබුවා හොඳද? මිනිහා හොඳට වැඩ කළාදැයි'' කියා. සුළු ධනේශ්වර මමත්වය අනුව කෙරුමා ලෙස පෙනී සිටීමට සියලු කැත වැඩ කළ මොහු පසුව හොරෙන් කල්ලි ගොඩනගා ගැනීමට කටයුතු කළ බව හැම දිස්ත්‍රික්කයකින්ම හෙළිදරව් වුණා. ඒ ගැන ඇසුවාම තවත් නොකරන බවට පොරොන්දු වී ගෝලයින් ලවා සූක්ෂම ලෙස වෙන දිස්ත්‍රික්කවලට ගොස් තමන්ගේ කල්ලිය හදන්නට පටන් ගත්තා. අවසානයේදී එන්.ඒ.නන්දසිරි ලවා මාව රහස් පොලිසියට පාවාදී මාව කොටුකර තබා සිය කල්ලි ගොඩනගමින් සිටි මොහු එකම අසහාය විප්ලවවාදී නායකයා බවත්, අප විප්ලවවාදීන් නොවන බවත් කියා ඔහුගේ ගෝලයින් ලවා ප්‍රචාරය කර හරිමින් මැතිවරණයේදී තුන් හවුල

බලයට එන බවත් එවිට විප්ලවය කළ නොහැකි බවත් ඒ නිසා 1970 අප්‍රේල්වල කළුතර දිස්ත්‍රික්කයේ පොලිසිවලට පහර දී සිංහරාජයට (අඩවියට) පසුබැස සටන් පටන් ගන්නා බවත් එයට එකඟවන ලෙසත් දන්වා දූතයින්ද යැව්වා.

මෙසේ දෙනියායට ආ දූතයා වූයේ කුරේ නැමැත්තායි. ඔහු වැරැදි තැන්වලට කොකු ගැසීම නිසා තත්වය එළිදරව් වුණා. පසුව අපි ධර්මසේකරව සාකච්ඡාවකට කැඳෙව්වා. නමුත් ඔහු ආවේ නැහැ. ජයකොඩිලා ආවා. කුමන්ත්‍රණ සංශෝධනවාදී පිලෙන් ආ අය ඔහු කඩාගෙන තිබුණා. මේ වකවානුව වන විට අපට ධර්මසේකර ගැන තදින්ම සැක පහළ වී තිබුණා. එනම් ඔහුගේ පියා යූ.එන්.පී. නායකයෙක්, ගම්කාර්ය සභාපතිවරයෙක්. ඔහුම පිළිගත්තා ඔහුත් මුලදී යූ.එන්.පී. කාරයෙකු බව. ඔහුගේ මාමා කෙනෙකු වන ගුණරත්න (රස්පුටීන්) නමැති සංශෝධනවාදී ගුරුවරයෙකු නිසා ඔහු සංශෝධනවාදී පිලට ගිය බව. ඔහු විප්ලවවාදියෙකු වූවා නම් කොමියුනිස්ට් පක්ෂය දෙකට කැඩෙන විට ඔහු චීන පිලට යා යුතුව තිබුණා. අනෙක් සරසවි ශිෂ්‍ය ශාඛා චීන පිලට යද්දී මොහු රුසියන් පිලේම සිටියා. මේ කාලය තුළ තමා විද්‍යාලංකාර සරසවියේ විද්‍යාපීඨය සංවිධානය කිරීමට ඇමරිකන්කාරයෙකු වූ මයිලෝ වුල්ෆ් ආවේ. ආසියාතික රටවල ශිෂ්‍ය ව්‍යාපාර අල්ලා ගැනීමට යුහුසුළු වූ ඇමරිකානුවන්ට හොඳ පහසු ගොදුරක් ලෙස ධර්මසේකර පෙනීම පුදුමයක් නොවේ. ධර්මසේකරගේ පියා යූ.එන්.පී. නායකයෙකු වීම ඔහුත් පැරණි යූ.එන්.පී.කාරයෙකු වීම (මාලේවන ඥාණිස්සර හිමි ඔහුගේ මාමා කෙනෙකු වෙනවායැයි ඔහු මා සමග හා ජයකොඩි සමග කියා තිබේ.) ඔහු විප්ලවවාදියෙකු නොවීම සංශෝධනවාදී කොමියුනිස්ට් පක්ෂය තුළ හිටියත් සරසවි ගියවිට හැම යූ.එන්.පී.කාරයෙක්ම සංශෝධනවාදී වීම පුරුද්දය. කිසිම මාක්ස් ලෙනින්වාදී දැනුමක් ඔහු තුළ නොතිබීමත් ඔහු තුළ පැසවමින් තිබූ සුළු ධනේශ්වර ප්‍රසිද්ධියට කෑදරකමත් ආදී සියල්ල අනුභව කොට ඔහු යැංකි චරපුරුෂ සේවයට බිලිවී ඇති බව සැක කිරීම නිසාය.

සංශෝධනවාදී මොහුව පක්ෂයේ වැඩකටයුතුවලට වැද්ද නොගෙන ඇත්තේ අප තුළ වූ මේ සැකය අපම එළියට දමන්නට ප්‍රථම ගොනාට ඉස්සරින් කරත්තය ගියාසේ ඔහුම අපට ඔහුගේ ඔළුවට සරිලන CIA තොප්පිය දමන්නට උත්සාහ කළා. ඔහු යම්කිසි විධියකින් 1970 අප්‍රියෙල්වල පොඩි කොලොප්පමක් කළානම් එය ප්‍රයෝජනයට ගෙන අධිරාජ්‍ය ගැති යූ.එන්.පි.ය මහා මැතිවරණය අහෝසිකර දමා

ආඥාදායකත්වයක් ගොඩනගනු ඇත. එයට සම්පූර්ණ සූදානමක් තිබුණා. මේ තැත ව්‍යර්ථ කිරීමට අප ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වූයේ ඔහු ඔහුගේ මිත්‍ර කැටපොලේ සුමතිපාල භික්ෂුව ලවා ඉලංගරත්නටත්, ඒ මගින් ජේ. ආර්ටත් අප ආණ්ඩුව පෙරළන්නට තැත් දරනවායයි දැන්වීමයි. පසුව ඔහුගේ සගයින් දෙදෙනෙකු වන හබුරුගල ජයසේකර හා බණ්ඩාරගම රොසැන්ඩල් පෙරේරා විසින් මාව පාවා දෙන ලදී. මේ අතරතුර කොළඹ විශ්වවිද්‍යාලයේ රොසැන්ඩල් පෙරේරා හට හලාවතින් ලබාගත් පිස්තෝලයක් දී මා කතරගම සිටිනවායයි සිතා මා මැරීමට බිත්තර වෙළෙන්දෙකු ලෙස රොසැන්ඩල් කතරගම සයිමන් (සිරිපාල) සහෝදරයාගේ ගෙදරට ඇරලා තියෙනවා. මීට කලින්ද වාසුදේව නානායක්කාරත්, ජිනේන්ද්‍රපාල හා කරන්නාගොඩත් සමගින් අප පක්ෂයේ සිටගෙනම අප පක්ෂයට හොරා ගොස් රහස් සාකච්ඡා කර තියෙනවා. (නගරවල තියෙන පිළිමවලට බෝම්බ ගසා විප්ලවය පටන් ගන්න යූ.එන්.පී. සමයේ) මෙය හෙළිදරව්වූයේ භාග්‍යකටමෙන් මෙම සාකච්ඡාවට ඩී.ඒ. ගුණසේකර සහෝදරයාත් යාම නිසයි. මම බදුලු සිරගෙදර සිටින අවස්ථාවේ මා ජේ.ආර්. විසින් ඔහුගෙන් බේරාගන්නට රහසේ ඇමරිකාවට ඇරලා යයිද සිරගෙදර තුළ නැතැයිද අවලාද නැගූ මොහු අපේ ව්‍යාපාරය මාව නිදහස් කළ පසු වර්ධනය වනවිට එය පාවාදීමට කටයුතු සමසමාජ පක්ෂය සමග හවුලේ කළා.

ඔහු කැටපොළේ සුමතිපාල මගින් ඇන්.ඇම්. හා බර්නාඩ් හමුවේ අපට එරෙහිව පොදු ක්‍රියා මාර්ගයක් සකස් කළා. අර ඓතිහාසික පවහෑල්ල කෙලින්ම ඇරියේ බර්නාඩ් සොයිසා ළඟටයි. පසුව එයින් බලාපොරොත්තු වූ ප්‍රතිඵල නොලද විට අපව විනාශ කිරීමට ධනේශ්වර රාජ්‍ය යාන්ත්‍රණය සමග කුමන්ත්‍රණය කර සැලැස්මක් සකස් කළා. වාසුදේව නානායක්කාර සමග හවුලේ ධර්මසේකර ඇමරිකන් තානාපති කාර්යාලයට පහර දුන්නේ රාජ්‍ය යාන්ත්‍රණය ලවා අපව විනාශ කරලීමටයි. ඇත්ත වශයෙන්ම එය එසේම සිදුවිය. ඇමරිකන් තානාපති කාර්යාලයට පහර දීම විහිළුවක්. තානාපති කාර්යාලයටවත් එහි එක් නිලධාරියෙකුටවත් කිසිදු හිරිහැරයක් නොවීය. පොලිස් පරීක්ෂක මැරීමෙන් සිදුවූයේ පොලිසිය විප්ලවවාදීන් සමග තද වෛරයක් ඇතිකර ගැනීමයි. අමෙරිකානු තානාපති කාර්යාලයට පහරදුන්නේ එය කලින් එළිදරව්වූවත් අපට කිසිවක් කළ නොහැකි වන්නටයි. අප එය එළිදරව් කළා නම් අප CIA කාරයෝ යැයි කියන්නටයි. අපේ ව්‍යාපාරයේ නායකයා ජේ.ආර්ගේ පුතා යයි ඉලංගරත්න ලවා කියෙව්වේ

ද ධර්මසේකරයි. මේ රටේ ඉතිහාසයේ නොවූ විරූ අන්දමින් ගිනිකොණ ආසියාවේ අන්කිසි තැනක නැති අන්දමින් නැගී ආ විප්ලවවාදී චණ්ඩ මාරුතය විනාශකර දැමීම යැංකි චර පුරුෂ සේවයට අවශ්‍යවූවක්. ඉතින් ඔවුන් සියලුදෙනාම එක්වී ඔවුන්ගේ ගැත්තා වූ ධර්මසේකර ප්‍රයෝජනයට ගනිමින් අපව විනාශකර දැමීමට කටයුතු කළ බව දැන් හොඳින් තේරුම් ගත හැකියි. ධර්මසේකර අද ධනේශ්වරය හා සකලවිධ ප්‍රතිගාමීත්වය හමුවේ සිය යුතුකම් කොටස සුවචව ඉටුකර ධනේශ්වරය තුරුල්ලේ නැළවෙමින් සිටී. CID එක පවා මෙය පිළිගත්තා. මෙවැනි ද්‍රෝහියෙකු හා අපරාධකාරයෙකු අප අතර ප්‍රතිවිරුද්ධතාවය, මිතුරු ප්‍රතිවිරුද්ධතාවකැයි යමෙක් කියයි නම් ඒ එක්කෝ ඔහු තත්වයන් හා සිදුවීම් නොදන්නා නිසා විය යුතුය. නැත්නම් ඔහුට එම තත්වයන් හා සිදුවීම් වසඟාලීමේ අවශ්‍යතාවයක් තිබිය යුතුය.

## 02. සරත්* ප්‍රශ්නය

සරත් සහෝදරයලා අපට හමුවන විට සිටියේ පේරාදෙණියේ විශ්වවිද්‍යාලයේ නිහාල් ඩයස් කණ්ඩායම තුළයි. නිහාල් ඩයස් ඒ වන විට අපට එරෙහිව කරන ලද සාපරාධී ද්‍රෝහී ක්‍රියා හේතුකොට ගෙන ඔහුගේ කැත මුහුණ පේරාදෙණියේ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ සාමාජිකයන් ඉදිරියේ එළිදරව් කර ගනිමින් සිටියා. ඒ 1968 අගභාගයේදීය. අපි සරත් විජේසිංහ සහෝදරයා හා සමරතුංග සහෝදරයා මාවනැල්ලට ගෙන්වා දිනක් රාත්‍රියේ සාකච්ඡා කළා. එවිට සරත්වත්, සමරතුංගවත් මා කවුදැයි දැන සිටියේ නැහැ. අපි දිගින් දිගටම ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් අප සමග අපේ න්‍යායට පසුව එකඟ වුණා. නමුත් මේ කාලයේදීම කල්‍යානන්දලාත් සරත් සහෝදරයා සමග වෙනම සාකච්ඡා කර ඇති බවත් අපට අවබෝධ වුණා. දැනගන්නට ලැබුණා. මෙසේ ටිකකලක් ගෙවී යාමත් සමගම සැබෑ තත්වය අප තේරුම්ගෙන ඇතැයි දැනගත් සරත්, සමරතුංග සහ සිරිවර්ධන මාව පොල්ගහවෙල සරත් සහෝදරයලාගේ අයියලාගේ ගෙදරට කැඳවා ඒ පිළිබඳව ස්වයං විවේචනයක් කර අප සමග කෙලින්ම කටයුතු කරගෙන යාමට එකඟත්වයකට පැමිනුණා. පසුව පොඩි දයා සහෝදරයා ඉතාමත් අවංකවම කල්‍යානන්ද සමග තිබූ සම්බන්ධකම් සහ එහි සැබෑ තත්වයනුත් එය අහෝසි කිරීමට ඔවුනට සිදු වූ අන්දමත් පැහැදිලි කළා. ඒ අනුව සිද්ධිය මෙසේය.

අප සරත් සහෝදරයලා මුණ ගැසෙන්නට පටන්ගත් කාලසීමාවේම කල්‍යානන්දලා සරත් මුණ ගැසීමට පැමිණ තිබෙනවා.

ප්‍රකාශක සටහන්:
*. සරත් විජේසිංහ - 71 අරගලයේදී මියගොස් තිබේ.

නමුත් සරත්ලා අපට ප්‍රථම කල්‍යානන්දලා සමග වැඩකටයුතු කරගෙන යාම සඳහා සම්බන්ධකම් ඔවුනට ලබාදී තිබෙනවා. එසේම එය අපෙන් වසංගා ගෙන තිබෙනවා. ඒ අනුවයි කෑගල්ලේ ජස්ටින් ප්‍රනාන්දු සහෝදරයාගේ අයියා වන විමල් ප්‍රනාන්දු මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ කල්‍යානන්දට සම්බන්ධ කර ඇත්තේ. ගුරුසිංහ සහෝදරයාද විමල් මගින් මෙසේ කළින් කල්‍යානන්දට සම්බන්ධ වී සිටියා. පසුව සරත් සහෝදරයාගේ පෙම්වතිය වූ විට්ලින් ලියනගේ සහෝදරිය මගින් වැඩකිරීමට කල්‍යානන්දට සම්බන්ධකම් දී කල්‍යානන්ද ඒ සහෝදරිය මුණ ගැසීමට වාද්දුවට ඇර තිබෙනවා. නමුත් විට්ලින් සහෝදරිය පිළිබඳ සැබෑ තත්වය නොදත් කල්‍යානන්ද ඇය සමග සරත් සහෝදරයාට විරුද්ධව කතා කර තිබෙනවා. එහි අරමුණ වී ඇත්තේ විට්ලින් සහෝදරිය සරත් සහෝදරයලාගෙන් ඔවුන් වෙත දිනා ගැනීමයි. විට්ලිං සහෝදරිය පේරාදෙණිය සරසවියට පැමිණ සරත්ට තත්වය හෙළිදරව් කළවිට කල්‍යානන්දට අවශ්‍යව තිබුණේ ඔහු කටයුතු කළේ සරත්ලා සමග සහයෝගයෙන් වැඩ කිරීමට නොව සරත්ලා සමග ව්‍යාජ මිත්‍රත්වයක් පෙන්නුම් කර ඔවුන්ගෙන් සම්බන්ධකම් ලබාගෙන ඔවුන් සමග සිටි සහෝදරවරුන් කල්‍යානන්දලා වෙත දිනාග ැනීම බව ඔප්පු වුණා. කල්‍යානන්දගේ සටකපට කුමන්ත්‍රණකාරී ක්‍රියා පිළිවෙත එළිදරව්වීමෙන් අනතුරුවයි, සරත් සහෝදරයලා අප සමග එකඟත්වයකට පැමිණ සැබෑ ලෙස වැඩකිරීමට බැස්සේ. ඉන් පසුව ඔවුන් අප සමග දිගටම වැඩකරගෙන ගියා. සරත් සහෝදරයා සමග සිටි අය අප සමග එකඟවීමෙන් පසුවත් ඔවුන් කලින් එකට සිටීමේ හේතුවෙන් ඒ තුළින් ගොඩනැගී තිබූ මිත්‍රත්වයත් ඔවුන් කණ්ඩායමක් වශයෙන් අපට එකතුවීමත් ඔවුන් අතර තිබූ පුද්ගලික බැඳීම් හා සම්බන්ධතාවයනුත් හේතුකොටගෙන ඔවුන්ගේ විශේෂ ගුලිගැසීමේ ස්වභාවයත් එකල පෙනීගියා. ධර්මසේකරලාගේ කට්ටිවාදී ප්‍රශ්නය ආවිට පේරාදෙණියේ සිරිවර්ධන ප්‍රමුඛ සහෝදරවරු සරත්ලා තුළිනුත් එවැනි තත්වයක් ඇතිවීගෙන යන බවට කරුණු ඉදිරිපත් කළා. සිරිවර්ධන සහෝදරයා ඉදිරිපත් කළ කරුණු පිළිබඳව සලකා බැලූ ඇතැම් පක්ෂයට අවංකවම හිතවත්කම් දැක්වූ සහෝදරවරු එවැනි තත්වයක් උදාවීම වැළැක්වීමට කටයුතු කළ අතර කුමානායක වැනි අය අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමේ අවස්ථාවාදී කැත පිළිවෙතක් අනුගමනය කර තිබෙනවා.

සරත් සහෝදරයාගේ නැගනිය වන සුසිලා සහෝදරිය සමග අප සමග සම්බන්ධවන විටත් සමරතුංග සහෝදරයාගේ ප්‍රේම සම්බන්ධයක් තිබණා. එලෙස පොඩි දිසා සහෝදරයා සුජාතා හඳගම සහෝදරිය සමග ප්‍රේම සම්බන්ධයක් තිබුණා. (පක්‍ෂය මේවාට විරුද්ධ වූයේ නැහැ. පක්‍ෂයේ අනුමැතිය ලැබුණා.) මේ ඥාති සම්බන්ධතාවය පදනම් කරගෙන ඒ සහෝදරවරුන් අතර ගුලිගැසීමක් ඇතැයි කරුණු ඉදිරිපත් වුණා. කුමානායක නම් සරත් සහොදරයාත්, විට්ලින් සහෝදරියත් සමග පේරාදෙනියේ නව කලාගාරයේදී චිත්‍රපට නරඹද්දී නරක විදියට හැසිරුණේ යැයි යන චෝදනා ඉදිරිපත් කරමින් පහත් පෙළේ වාසි ලබා ගැනීමට කටයුතු කළ නමුදු කුමානායක කවුදැයි හෙළිදරව් වී තිබේ. සිරිවර්ධන සහෝදරයා ඉදිරිපත් කළ ප්‍රශ්නය ගැන සලකා බලා ඇතැම් සහෝදරවරුන් (සරත්, සමරතුංග, පොඩි දිසා යන සහෝදරවරුන් නොවේ.) කරන ලද සැකකටයුතු හා වැරැදි ප්‍රකාශන හේතුකොටගෙන තත්වය බැරෑරුම් වී ඇති බව තේරුම් ගත් අපි කට්ටිවාදයක් ගොඩනොනැගෙන සේ කටයුතු කරන ලෙස උපදෙස් දී දිගටම සරත් සහෝදරයාත් සමග ඉදිරියට වැඩකටයුතු කරගෙන ගියා. ඉන්පසු සරත් සහෝදරයා ඉතාමත් දක්‍ෂ ලෙස වැඩ කළා. ඔහු සමග හෝ සමරතුංග පොඩි දිසා වැනි සහෝදරවරුන් සමග හෝ අපට මතභේද ඇතිවුණේ නැහැ. සරත් සහෝදරයා ඔවුන් දැරූ වගකීම්වලින් කිසි දිනෙකවත් පක්‍ෂය විසින් නෙරපා දමා තිබුණේ නැහැ. අවසාන කාලයේදී සරත් සහෝදරයා කෑගල්ලේ දිස්ත්‍රික් ලේකම් වශයෙනුත් පොඩි දිසා සහෝදරයා උප දිස්ත්‍රික් ලේකම් වශයෙනුත් වැඩකටයුතු කරමින් සිටියා. මුලදී ව්‍යාපාරයට සරත් සහෝදරවරු පිළිබඳ සැක කිරීමට සිදුවූයේ ඔවුන් කල්‍යානන්දලා සමග රහසිගතව සම්බන්ධකම් පවත්වාගෙන යාම ව්‍යාපාරයට එළිදරව් වීම නිසාය. පසුව එවැනි තත්වයක් ඇති නොවීය. ධර්මසේකරලා මෙන් ඔවුන් පක්ෂ ද්‍රෝහීන් නොවූහ. විශාල ලෙස ව්‍යාපාරයට කැපවී වැඩකළ අය වූහ.

## 03. අතුල සනත් ප්‍රශ්නය

ජනතා විමුක්ති පෙරමුණ තුළ අතුලලා හා සනත්ලා* සමග ඇතිවූ මතභේදයට හා එහි වර්ධනයට දිගු ඉතිහාසයක් තිබෙනවා. එහි සැබෑ පදනම නම් පැරැණි නමුත් වර්ධනය නොවූ අදක්‍ෂ හා දේශපාලන අවබෝධයෙන් හීන අයත් නමුත් පසුව ව්‍යාපාරයට සම්බන්ධ වූ එහෙත් දක්‍ෂ ඉක්මනින් වර්ධනය වූ හා දේශපාලන අවබෝධයෙන් වැඩි අයත් අතර ජනතා විමුක්ති පෙරමුණ තුළ ප්‍රතිවිරුද්ධතාවයක් ගොඩනැගෙමින්

ප්‍රකාශක සටහන්:
* සනත් බොරලුකැටිය - ගුරුවරයෙකි. 65 පළමු සාකච්ඡාවට සහභාගි උනා. 71 අරගලයේදී මියගොස් තිබේ.

තිබුණා. මෙන්න මේ ප්‍රතිවිරුද්ධතාවයේදී පැරැණි අය වඩා වර්ධනය වූ හා තහවුරු වූ නවකයින්ගේ ඉදිරිගමන පිළිගැනීම ප්‍රතික්ෂේප කළ හෙයින් එය මුහුකුරා ගියේය. මෙහිදී ව්‍යාපාරය තුළට රිංගාගෙන සිටි ද්‍රෝහීන් සහ නොයෙක් බලාපොරොත්තු හේතුවෙන් ව්‍යාපාරය තුළට රිංගා ඒ බලාපොරොත්තු සුන්වී යනු දකිද්දී ව්‍යාපාරයට ද්‍රෝහී වී සතුරු පස ගත් අයත් මේ ප්‍රතිවිරුද්ධතාවයන් සාර්ථක ලෙස පංති සතුරාගේ ප්‍රතිවිප්ලවීය ඵල ප්‍රයෝජනය සඳහා යොදවා ගනු ලැබිණ.

සනත්ලා, කරුෑලා ව්‍යාපාරයේ ආරම්භක සාමාජිකයින් බව ඇත්තය. සනත් 1970 අප්‍රේල් මාසයේ පටන් පූර්ණකාලීනයකු වශයෙන් වැඩකළ බව ඇත්තය. කරුණාරත්න 1970 නොවැම්බර් මාසයේ පටන් පූර්ණකාලීන සාමාජිකයෙක් බව ඇත්තය. ලොකු අතුල* 1965 අගදී ව්‍යාපාරයට සම්බන්ධ වූ බවත් 1968 සිට පූර්ණකාලීනයෙකු වශයෙන් වැඩ කළ බව ඇත්තය. නමුත් මොවුන් වැඩ කළේ තම හැකියාවන් අනුවයි. දේශපාලන වශයෙන්, න්‍යායාත්මක වශයෙන් මොවුන්ගේ වර්ධනය සීමාසහිත විය. මොවුන්ට වඩා පසුව ව්‍යාපාරයට සම්බන්ධ වූ සමහර අය දේශපාලන අවබෝධය අතිනුත් න්‍යායාත්මක මට්ටම අතිනුත් විප්ලවවාදී හැකියාව අතිනුත් මොවුන් අභිභවනය කරමින් ඉදිරියට යනු ඇතැම්විට පෙනෙන්නට විය. ව්‍යාපාරය කලින් කුඩා කණ්ඩායමක් ලෙස පැමිණි අවස්ථාවේ ඔවුන් සතුව තිබූ බලය පසුව බිඳවැටී යනු ඔවුනට පෙනී යන්නට විය. අනෙක් පැත්තෙන් ධර්මසේකරලා වැනි ද්‍රෝහීන් ව්‍යාපාරය තුළට රිංගා ගැනීම තුළින් ඇතිවූ තත්වය තුළින් මොවුන්ට තම තත්වය තහවුරු කර ගැනීමට යම් ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක්ද ව්‍යාපාරය තළ උදා විය. 1970 දී මා සිරභාරයට පත්වන විට ව්‍යාපාරය මුළුමනින්ම සංවිධානය කර නොතිබිණි. 1964 - 1965 සිට අපි 1969 - 1970 දක්වා කරගෙන යන ලද්දේ පැහැදිලිවම මතවාදී අරගලයක් පමණි. විප්ලවයක් කිරීමට විප්ලවවාදී පක්ෂයක් අනිවාර්යයෙන්ම තිබිය යුතුය. විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගීමට නම් විප්ලවවාදීන් සමුහයක් සිටිය යුතුය. නමුත් එකල විප්ලවවාදීන් සමූහයක් මේ රට තුළ නොසිටියහ. විප්ලවවාදීන් බිහිවනුයේ පීඩිත පංති ජනකායක් විප්ලවවාදී දර්ශනයක් ග්‍රහණය කරගැනීමෙන් පමණකැයි මාක්ස් අවධාරණය කර තිබේ. පැරැණි වාමාංශික ව්‍යාපාරය ප්‍රතිසංස්කරණවාදී වීමේ හේතුවෙන් එමගින් පීඩිත බහුජනතාව වෙතට විප්ලවවාදී දර්ශනයත් ග්‍රහණය කරවීමක් නොවීය. මෙන්න මේ හේතුවෙන් සැබෑ විප්ලවවාදීන් වූ අපට අව්‍යාජ මාක්ස් ලෙනින්වාදීන් වශයෙන් හා පුරා කිරීමට තිබූ කර්තව්‍ය

ප්‍රකාශක සටහන්:

*. අතුල නිමලසිරි ජයසිංහ - 71 අරගලයෙන් පසු රජයේ සාක්ෂිකරුවකු විය. පසුව පොදු පෙරමුණු ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමතිවරයෙකු විය.

නම් විප්ලවවාදී මතවාදය මේ රට තුළ ජයග්‍රහණය කරවීමට විප්ලවවාදී දර්ශනය මේ රටේ ජනතාවට ග්‍රහණය කරවීමට ප්‍රතිවිප්ලවවාදී ධනේශ්වර මතවාදයට විරුද්ධව විප්ලවවාදී මතවාදය නගාසිටුවීමට මතවාදී අරගලයක් කිරීමයි.

එලෙස අපි පළමුවෙන් චීන පිල තුළ මතවාදී අරගලයක් දියත් කළෙමු. එය චීන පිල පැරැණි ප්‍රතිසංස්කරණවාදී කොමියුනිස්ට් පක්ෂයෙන් බිහිවීමේදී තමන් වෙත උරුම කරගෙන පැමිණි ප්‍රතිසංස්කරණවාදී සිද්ධාන්තයන්ටත්, සම්ප්‍රදායන්ටත්, ක්‍රියාමාර්ගයන්ටත්, වැඩපිළිවෙළටත්, සංවිධාන ක්‍රමවලටත් එරෙහිව වූවක් විය. එය චීන පිල තුළ මාක්ස් ලෙනින් විරෝධී ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්යන්ටත් සංවිධාන ක්‍රමවලටත් එරෙහිවූ පක්ෂ අභ්‍යන්තර අරගලයක් විය. මෙම පක්ෂ අභ්‍යන්තර අරගලයේදී තම පරාජය දුටු පැරැණි ප්‍රතිසංස්කරණවාදී ද්‍රෝහී නායකත්වය නොයෙක් සටකපට උපක්‍රමවලින් අපව විටින් විට පක්ෂයෙන් නෙරපා හරින ලදී. මින් අනතුරුව අපි රටේ නොයක් තැන්වල මතවාදී අරගලය පුළුල් ලෙස කරගෙන ගියෙමු. මෙහි ප්‍රතිඵලයක් වශයෙනුයි මූලික සාකච්ඡාවක් සහ පසුව පංති 5ක් බිහිවූයේ. පංති 5 මගින් අපි බලාපොරොත්තු වූයේ ජනතාවගේ එදිනෙදා ප්‍රශ්න මාක්ස්වාදී දර්ශනයක පිහිටා ජනතාවට විග්‍රහකර දීමයි, එමගින් ජනතාව මාක්ස්වාදී දර්ශනය දෙසට ඇද ගැනීමයි. පංති පහ අප විසින් හඳුන්වනු ලැබූයේ '' වර්තමාන දේශපාලන තත්වය සහ නිර්ධන පංති විප්ලවවාදීන් සතු කටයුත්ත යනුවෙනි'' එමගින් ජනතාවට පවතින, ජනතාවට තේරුම් ගත නොහැකි වූ, ජනතාවට විසඳාගත නොහැකිවූ දැවෙන සමාජ ප්‍රශ්න ද්විඝටනාත්මක ලෙස විග්‍රහකර ඒවායේ හේතු ඒවා බිහිවී ඇති සැටි වර්තමාන තත්වය දක්වා බිහිවී ඇති සැටි ඒවායේ අනාගත ගමන් මාවත හා ඒවාට ඇති සැබෑ විසඳුම් ඉදිරිපත් කරන ලදී.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජනතාව තුළ මාක්ස්වාදී දර්ශනය කෙරෙහි දැඩි විශ්වාසයක් ඇති කරන ලදී. ඒ අනුවයි, මතවාදී අරගලය තවදුරටත් ඉදිරියට ගෙනයමින් ජනතාවට මාක්ස් ලෙනින්වාදී අවබෝධයක් ලබාදෙනු වස් දේශපාලන කඳවුරු පවත්වනු ලැබුයේ. මෙම දේශපාලන කඳවුරුවලදී මාක්ස් ලෙනින්වාදී දර්ශනය පිළිබඳව මූලික අවබෝධයක් ලබාදීම තුළින් මාක්ස් ලෙනින්වාදී දර්ශනය ග්‍රහණය කරගත් විප්ලවවාදීන් දහස් ගණනක් බිහිකරලීමට කටයුතු කර ඇත. මෙවැනි අධ්‍යාපන කඳවුරු සහ පංති පැවැත්වීම

අතින් අපි පැරැණි වාමාංශික ව්‍යාපාරය අභිබවා බොහෝ ඉදිරියට ගොස් සිටින බව කිසිවෙකුටත් ප්‍රතික්ෂේප කළ නොහැක. අප විසින් රට පුරා මහා පරිමාණයෙන් විප්ලවවාදී මතවාදී අරගලයක් කර ඇති බව කවරදාවකවත් අපේ පංති සතුරන්ට පවා කිසිසේත්ම වසන්කළ නොහැක්කක් වී ඇත. මෙලෙසින් මතවාදී අරගලයක් ඉදිරියට කරගෙන යාමේ ප්‍රතිඵලයක් වශයෙන් රටපුරා විප්ලවවාදීන් බිහිවීමත් සමග එය තවතවත් මහා පරිමාණයෙන් පළල් කිරීමේ අවශ්‍යතාවයත් හැකියාවත් ඇති විය. අනෙක් අතට එය පෙරට වඩා සංවිධානාත්මකව කරගෙන යාමේ අවශ්‍යතාවයද උදාවිය. මේ අනුව රටපුරා මතවාදී අරගලය තවදුරටත් කරගෙනයාමට කාඩර්වරුන් (පූර්ණකාලීනයින්) තනන ලදී. ඒ සමගම මතවාදී අරගලය එතෙක් දියත්කර නොතිබූ ප්‍රදේශවල එය දියත් කිරීම සඳහා එලෙස සහෝදරවරුන් වැඩියෙන් සිටි ප්‍රදේශවලින් ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ ඓතිහාසික අත්දැකීම්වලට අනුව යමින් කාඩර්වරුන් යවන ලදී.

එකල විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගිය යුත්තේ කෙසේද? ගොඩනැගිය හැක්කේ කෙසේද? යන ප්‍රශ්නයට පිළිතුරු සෙවීමේදී ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ අත්දැකීමුත් අපේ රටේ පැරැණි වාමාංශික ව්‍යාපාරය අපට උරුම කරගෙන යන අභාවාචක අත්දැකීම දැඩි ලෙස හැදෑරූ අප තීරණය කළේ මෙහිදී විප්ලවවාදී ව්‍යාපාරයක් ගොඩනැගිය යුත්තේ ඉහළ සිට පහළට නොව පහළ සිට ඉහළට බවයි. 1970 අප්‍රේල් වන විට අප පක්ෂ ශාඛා, ග්‍රාමීය කොමිටි, ප්‍රාදේශීය කොමිටි, ප්‍රාදේශීය දිස්ත්‍රික් කොමිටි යන ලෙසින් ව්‍යාපාරය ගොඩනැගීමට කටයුතු පටන්ගෙන තිබුණා පමණි. එම ක්‍රියාමාර්ගය කිසිසේත් අවසන් වී නොතිබිණි. ව්‍යාපාරය මුලදීම මතවාදී අරගලය කරගෙන යමින් සිටියදී නොයෙක් ප්‍රදේශවල වැඩකළ යුතු අතර සම්බන්ධතාවයක් පවත්වාගැනීමටත් යම්කිසි සංවිධාන මට්ටමක් පවත්වා ගැනීමටත් සම්බන්ධතා කොමිටියක් හෙවත් සංවිධායක කොමිටියක් පැවැතිණ.

එය 1965 මැයි මාසයේ සිටම පැවැති ව්‍යාපාරයේ වැඩකටයුතු නොකිරීමත් ව්‍යාපාරය ගැන උනන්දුවක් නොදැක්වීමත් ව්‍යාපාරය හමුවේ සිය යුතුකම් ඉටුකිරීමට නොහැකිවීමත් යන හේතුවෙන් විවිධ අය විවිධ කාලවලදී මෙයින් අයින්වූ අතර නවක උද්‍යෝගී ක්‍රියාශීලී සහ දක්ෂ වර්ධනය වූ අය එයට ඇතුළු කරන ලදී. එය මධ්‍යම කාරක සභාවක් හෝ දේශපාලන මණ්ඩලයක් නොවීය. මෙම සංවිධායක කොමිටිය මා

පළමුවර සිරභාරයට ගන්නා විට 21 දෙනෙකු දක්වා පළල් කර තිබිණි. එනිසාම එය එකල හඳුන්වනු ලැබුයේ 21 යනුවෙනි. එමගින් ප්‍රදේශ අතර අන්තර් සම්බන්ධතාවක් පවත්වාගෙන යාමත් ව්‍යාපාරය පහළ සිට ඉහළට සංවිධානය කිරීම මෙහෙය වීමත් කිරීමට උත්සාහ ගැනිණ. මුල පටන් නොකඩවාම මේ කොමිටියේ මමත්, කරූත්, සනතුත් පමණක් සිට ඇති නමුත් මා පළමුවරට අත්අඩංගුවට ගත්තාට පසු පළමු වන භීෂණ සමයේ දී ව්‍යාපාරයේ නායකත්වය සනත් අතට ගැනීමෙන් පසු සනත් හා කරූ ඔවුන් සමග සහයෝගයෙන් වැඩකිරීමට ලොකු අතුලත් යොදාගෙන තිබිණ. මොවුන් තිදෙනා විසින් මේ කාලය තුළ ''21 මණ්ඩලය'' විසුරුවා හැර තිබිණ. එයට හේතුව වශයෙන් දැක්වූයේ 21 මණ්ඩලයේ සිටි ඇතැම් සහෝදරවරු භීෂණයට ඔරොත්තු නොදුන් බවත් ඇතැමුන් සිටිතැන් පවා සොයාගත නොහැකි වූ බවත් ය.

අනෙක් අතට ඒ භීෂණ සමයේදී පසුබට නොවී කෙලින් සිටි අයයැයි, ටී.ඩී. සිල්වා, කුමානායක, සිසිල්චන්ද්‍ර, ලක්ෂ්මන් මාදුවගේ, සුනන්ද*, අනුර, ධනපාල වැනි අය හැඳින්වූවා. කිසිවෙකු එකල රැකවරණය නොදෙන අවස්ථාවක ටී.ඩී. සිල්වාගේ ගෙදරත් ලොකු අතුලලාගේ ගෙදරත් පමණක්ම ඔවුන්ට කොළඹින් රැකවරණ ස්ථාන වූ බවත් අනුරත් සුනන්දත් කුමානායකත් භීෂණයට බයේ පැනගොස් සිටි ස්ථානවල වැඩ කළ බවත් සිසිල්චන්ද්‍ර ඒ අමාරු දිනවල පවා ලීෆ්ලට් පත්‍රිකා මෝටර් රථවලින් රටපුරා ගෙනගිය බවත් නුවරඑළියට පළමු නඩු දිනයේදීම නිර්භීතවම සිසිල්චන්ද්‍ර හා ලක්ෂ්මන් මාදුවගේ ගිය බවත් ධනපාල විශාල පරිත්‍යාගයක් කළ බවත් එකල භීෂණ සමය තුළ ව්‍යාපාරයේ වැඩ කටයුතු කරගෙන යාමට ඉතිරිව සිටියේ ඔවුන් කිහිපදෙනා පමණක් බවත් ඔවුන් සඳහන් කළා. ඒ කාලය තුළ තමයි මා සිරභාරය තුළ සිටියදී 21 කොමිටිය විසුරුවා හැර අලුත් සංවිධායක කොමිටියක් මේ අය ඇතුළු කොටගෙන හදාගෙන තිබෙන්නේ. මුල පටන් මම එයට එකඟවුණේ නැහැ. මා සිරභාරයේ සිට නිදහස් වී ආ විට මොවුන් විසින් ඇතිකරගෙන තිබූ ඒකාධිකාරයට එරෙහිව එක් පැත්තකින් සටන් කිරීමේ හැකියාවක් මට තිබුණේ නැහැ. අනෙක් පැත්තෙන් මම පැවැති තත්වයත් හරිහැටි තේරුම් ගත්තේ නැහැ. මේ මතබේදයන් පටන් ගත්තේ හිරේ සිට මා නිදහස් වී ආ මුල් දිනවල සිටමයි. 1970 ජූලි 14 වන දා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ පළමු දේශනය සඳහා, නිදහස් කිරීමෙන් දින 4කට පසු මා කොළඹ පැමිණි විට දේශනයෙන් පසු රාත්‍රිය මට කොළඹ නැවතීමට සනත්, ලොකුගේ, අතුල සහ කරූ

ප්‍රකාශක සටහන්:
* සුනන්ද දේශප්‍රිය

විසින් පිළියෙල කර තිබුණේ ටී.ඩී. සිල්වාගේ ගෙදරයි. නමුත් මම එයට එදා එකඟවුණේ නැහැ. ඒ රහස් පොලිසියේදී ටී.ඩී.සිල්වාගේත්, පොඩි අතුලගේත්* පින්තූරයක් මට පෙන්නූ විට මම ඔවුන් හඳුනන්නේ නැතැයි කියා තිබීම නිසාය. දැන් රහස් පොලිසියෙන් මා ගැන සෙවිල්ලෙන් සිටි හෙයින් කොළඹ පැමිණි මුල් දිනයේදීම එසේ අඳුනන්නේ නැතැයි කියූ පුද්ගලයාගේ ගෙදරටම යාම නුසුදුසු බවත් මා කී නමුත් කොළඹ ටී.ඩී. ගේ ගෙදරට වඩා ආරක්ෂක ස්ථානයක් නැතැයි තර්ක කරමින් ටී.ඩී.ත් ලොකු අතුලත් සනතුත් කරූත් තදින් මා සමග හැප්පුණා. මට එහි යා යුතුමයි බල කළා.

සිරභාරයේ සිට මා ආ විට සනත්, කරූ, ලොකු අතුල ඇතුළු පිරිස මට දැඩි ලෙස ආදරය කරන බව පෙන්වමින් රොසැන්ඩල් මාව මැරීමට කතරගම ගොස් තිබීමේ කරුණ සඳහන් කරමින් මගේ සතුරන්ගෙන් මාව දැඩිලෙස පරිස්සම් කළ යුතු යයි කියමින් වරක් මා තනියම සිට හසුවූවා යයිද නැවතත් එසේ හසුවීමට ඉඩදිය නොහැකි යැයි ද කියා මා ආරක්ෂා කිරීමට දැඩි උනන්දුවක් දක්වන බව පෙන්වමින් මම මගේ ආරක්ෂාව ගැන නොතකන්නේය යයි කියමින් ''විජේවීර සහෝදරයාට මොකක්හරි කළොත් ව්‍යාපාරයට වන්නේ කුමක්දැයි'' කියමින් ඒ අනුව මාව ඔවුන්ගේ ඊනියා ආරක්ෂක පියවරවල්වලට පත් කරනු ලැබුවා. මා නිදහස් කළ දිනයේ බණ්ඩාරවෙලදීමයි යෝජනා කළේ සනත්, කරූ, අතුල ඇතුළු සියලු දෙනා ඉදිරිපිටදීම ලක්ෂ්මන් මාදුවගේත්, සිසිල්චන්ද්‍රත් මගේ ආරක්ෂකයින් හැටියට. එසේ රටේ වැඩියෙන්ම වැඩකර ඇති ප්‍රදේශ හැටියට සහ විශ්වාසදායක ප්‍රදේශයක් හැටියට අම්බලන්ගොඩ සඳහන් කරමින් මම අම්බලන්ගොඩ නැවතිය යුතු යැයිද යෝජනා කළා. මේ යෝජනාවට මා තදබල ලෙස විරුද්ධ වුණා. මම අපේ ගෙදර සිටගෙන වැඩ කිරීමට කැමැත්ත පළකළා. නමුත් අපේ ගෙදර කිසිසේත් ආරක්ෂිත නොවන බවත් වැඩියෙන් වැඩකර තිබූ ප්‍රදේශයක් නොවන බවත් සඳහන් කරමින් මට අම්බලන්ගොඩ නවතින්නට එන ලෙස මට දිගින් දිගටම බල කළා. 1967 පටන්ම ගාලු දිස්ත්‍රික්කයේ වැඩකර තිබුණේ සනත්ය. සිසිල්චන්ද්‍රත්, ලක්ෂ්මන් මාදුවගේත් අවශේෂ අම්බලන්ගොඩ අය මෙන්ම සනත් සමග ළඟින්ම ඇසුරු කළ මුල පටන්ම සනත්ගේ මිතුරන්ය. මොවුන් දෙදෙනා සනත්ගේ උපදෙස් පිට මගේ හැම කටයුත්තක්ම පාලනය කිරීමට යාමේ හේතුවෙන් වැඩිකල් නොගොස්ම මට ඔවුන් සමග ප්‍රතිවිරෝධතා හදාගැනීමට සිදුවිය. මා කෑ යුත්තේ කොහෙන්ද?


ප්‍රකාශක සටහන්:
*. වික්ටර් අයිවන් - රාවය කතුවරයාය

නොකෑයුත්තේ කොහෙන්ද? මම සාකච්ඡාවලටය යායුත්තේ කොහාටද නොයා යුත්තේ කොහාටද? මා හමුවීමට පැමිණෙන සහෝදරවරුන්ට එයට ඉඩ දෙනවාද? නැද්ද? යන මේ සියල්ල මොවුන් අත්තනෝමතික ලෙස පාලනය කරන්නට පටන් ගත්තා.

අම්බලන්ගොඩ රැස්වීමෙන් පසුදින සුනන්දගේ නංගි කමනීත්, සම්පතීත් පූර්ණකාලීන වැඩට ඇරීමට සිදුවුණා. ඒ වනවිට කමනීත් සම්පතීත් වැඩ කිරීම තුළින් ප්‍රදේශයේ හෙළිදරව් වී තිබුණා. අනෙක් පැත්තෙන් වැඩ කිරීමට ඔවුන්ගේ ගෙවල් විසින් දැඩි ලෙස බාධා පමුණුවා තිබුණු හෙයින් ඔවුන්ට පූර්ණකාලිකයන් වශයෙන් වැඩකිරීමට යාමට අවශ්‍ය බැව් හා ඊට පිළිවෙළක් සූදානම් කර දෙන ලෙස ඔවුන් සනත් මගින් ව්‍යාපාරයෙන් ඉල්ලා තිබුණා. පසුව එය මටද දන්වනු ලැබුවා. උද්ගතවී ඇති තත්වය තුළ එක්කෝ ඔවුන් ව්‍යාපාරයේ වැඩකටයුතු නැවැත්විය යුතු බවත් නැතහොත් ව්‍යාපාරයේ වැඩ තවදුරටත් කිරීම සඳහා ඔවුන් පූර්ණකාලීනයන් වශයෙන් වෙනත් ප්‍රදේශවලට යැවිය යුතු බවත් ඔවුන් දැන්වූවා. ස්ථාන පිළියෙළ කරන තෙක් ටික දිනක් ඉවසන්න යැයි සනත් ඔවුන්ට කියා තිබුණා. නමුත් සම්පතීලාගේ ගෙදර සමග ගැටුම උග්‍ර වී සම්පතීත්, කමනීත් ඔවුන්ගේ ගෙදරවල් සමග තරහ වී  ඇල්පිටියේ සම්පතීලගේ නෑ ගෙදරකට ගොස් තිබුණා. එහි සිට සිසිල්චන්ද්‍රගේ නමට සම්පතීත් කමනීත් ව්‍යාපාරයට ලිපියක් එවා තිබුණා. ඔවුන් ගෙදරින් පැනගොස් සිටින බවත් ව්‍යාපාරයේ වැඩ කටයුතු සඳහා වහාම යොදවා ගන්නා ලෙසත් දන්වා ඒ අම්බලන්ගොඩ රැස්වීමට දින දෙකකට පෙරදීයි. උද්ගත වී ඇති තත්වය තේරුම්ගත් මම ප්‍රශ්නයට තාවකාලික පිළියමක් වශයෙන් මේ සහෝදරියන් දෙදෙනාට නැවතීමට සහ වැඩ කිරීමට සනත් ස්ථානයක් පිළියෙළ කරදෙන තෙක් ඔවුන් අපේ ගෙදර දින කිහිපයකට නැවැත් වූවා. සනත් සහ සුනන්ද යන දෙදෙනාම දොඩන්දූවේ අය. සුනන්දගේ තාත්තා එක ගමේ වැසියන් වශයෙන් සනත්ට උගන්වා තිබෙනවා. එබැවින් සුනන්දගේ පියා සනත්ගේ ගුරුවරයෙක්ද විය. මේ නිසා සුනන්දලාත් සනතුත් අතර මුල පටන්ම පෞද්ගලික පවුල් සම්බන්ධතාවයක් පැවතිණ. මේ හේතු කොටගෙන කලින් සුනන්ද පූර්ණකාලීන වැඩට ගිය අවස්ථාවේ සනත් සුනන්දගේ පියා සමග සමාදානයකට එළඹ තිබුණා. කමනී පූර්ණකාලීන වැඩට යාමේ ප්‍රශ්නය සනත්ට පෞද්ගලිකවම බලපෑවා. සුනන්දගේ පියාත් මවත් සනත් සමග මේ ප්‍රශ්නය කතාකර කමනීත්, සම්පතීත් ආපසු ගෙන්වාදීමට සනත් පොරොන්දු වී තිබුණා. ඊට පසු සනත්

ටී.ඩී. සිල්වාගේ ගෙදරදී එදිනම ලොකු අතුල, ටී.ඩී., කරූ, ධනපාල, කුමානායක, සිසිල්චන්ද්‍ර වැනි අය සමග මේ පිළිබඳව මට විරුද්ධව සාකච්ඡා කර තිබූ බව දැනගන්නට ලැබුණා. පසුව සිසිල්චන්ද්‍රත් ඔහුගේ අම්මාත් කුමානායකත් විසින් මේ සහෝදරියන් දෙදෙනා ආපසු ඔවුන්ගේ නිවෙස්වලට ඔවුන්ගේ අකමැත්ත පිටම කැඳවාගෙන ගොස් තිබුණා. මීට සති කිහිපයකට පසු මේ සහෝදරියන් දෙදෙනා නැවතත් පූර්ණකාලීන වැඩ සඳහා බදුල්ලට නිවෙස්වලින් ගියා.

මාව සිරභාරයට ගත්විට ටී.ඩී.ලාගේ ගෙදර පළමුවෙන්ම අංජනමක් බලා තිබෙනවා. ඒ අනුව ටී.ඩී.ත් ඔහුගේ බිරිඳත් භාරයක්වීම සඳහා අනුරාධපුරයට ගොස් තිබෙනවා. නමුත් සනත්, කරූ, අතුල වැනි අය මෙය මගෙන් වසන් කළා. විමලගුණ සහෝදරයාගෙන් මෙය දැනගත් පසු මම එය වසන් කිරීම පිළිබඳවත් එවැනි දෑ කිරීම පිළිබඳවත් ඔවුන්ට චෝදනා කළා.

පළමුවැනි හයිඩ්පාක් රැලියෙන් පසුව ලොකු අතුල විසින් රැස්වීම් පැවැත්වීමට විරුද්ධව මතයක් ඉදිරිපත් කරන ලදී. මෙයට එක් ප්‍රධාන හේතුවක් වශයෙන් දැක්වූයේ ප්‍රසිද්ධ රැස්වීම්වල කතා කරන විට විජේවීර සහෝදරයාට සතුරන් විසින් වෙඩිතබා දැමිය හැකිය යන්නයි. පිට පළාත්වල සහෝදරවරු පවා මෙම මතය තදින් දමනවා යැයි ඔහු කීවා. නිදසුනක් වශයෙන් කුරුණෑගල හේරත් සහෝදරයා ඒ ගැන අවධාරණයෙන් සඳහන් කළ බවත් ඔහු කීවා. පසු කලෙක ප්‍රතිවිරුද්ධතා උත්සන්න වීමත් සමග ඇල්පිටියේ කුරුඳුගහහැතැප්මේ පැවැත්වූ රැස්වීමෙන් පසු පෙබරවාරි 27වනදා හයිඩ්පාක් රැලිය තෙක්ම එක්ව ප්‍රසිද්ධ රැස්වීම් පැවැත්වූයේ නැහැ.

මා සිරභාරයේ සිටියදී සංවිධාන වැඩ කටයුතු සනත් විසින් ඔහුගේ අතට ගෙන තිබිණ. මා සිරභාරයෙන් නිදහස් කළ පසුත් එය එසේම තිබිණ. ඒ මා විසින් ප්‍රචාරක කටයුතු මෙහෙයවීමට පටන් ගත් බැවිනි. නමුත් ටික කලකට පසු සනත් සංවිධාන කටයුතු පැහැර හරින බවට දිගින් දිගටම චෝදනා ගලා ආවා. හම්බන්තොට දිස්ත්‍රික්කයට දින නියම කොට කිහිප වතාවක් නොගිය බවත්, උතුරු මැද පළාතට හා අම්පාරටද එසේම වූ බවත් නොඑක් විට දැනගන්නට ලැබුණා. මේ ප්‍රශ්නය උඩත් එක් පැත්තකින් මතභේද උග්‍ර වුණා. සනත්ගේ මේ අකාර්යක්ෂම වැඩපිළිවෙළ හේතු කොටගෙන ඒ වන විට ඇතැම් දිස්ත්‍රික් කොමිටි තුළ මතභේද ඇතිවී, ඒවා උග්‍රවී ඇතැම් දිස්ත්‍රික්කවල ප්‍රතිවිරුද්ධ, දිස්ත්‍රික්

කොමිටි දෙක බැගින් පවතින තත්වයක්ද උදා වී තිබුණා. මෙවැනි තත්වයන් අනුරාධපුරයේ, පොළොන්නරුවේ සහ හම්බන්තොට පැවැතී ඇත. ඇතැම් තැන්හිදී සනත් අභ්‍යන්තර මතභේද විසඳීමේදී පක්‍ෂග්‍රාහී වී ඇතැයිද චෝදනා ලැබිණි. එලෙස සනත්ගේ පාසල් ශිෂ්‍යයෙකු වූ අනුරාධපුරයේ දිස්ත්‍රික් ලේකම් ජයසිංහගේ සහ අතුලගේ ගෝලයෙකු වූ රන්ජිත්ගේ පැත්ත ගත්තේ යැයිද පොළොන්නරුවේ මතභේදවලදී ගාලු දිස්ත්‍රික්කයෙන් පොළොන්නරුවට හරින ලද සුසිල්ගේ පැත්ත ගත්තේ යැයිද වාර්තා විය.

ටී.ඩී., කරූ, ධනපාල වැන්නන් අර ඉහත කී සංවිධායක මණ්ඩලයේ සිටියත් පූර්ණකාලීන නොවීම ගැන මුලින්ම මා විසින් විවේචනය කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් කරුණාරත්න පමණක් 1970 නොවැ. 10 දින පටන් පූර්ණකාලීන වැඩට එන ලදී. ධනපාල පූර්ණකාලීන වැඩට නාවා පමණක් නොව අනුන්ලවා වැඩ කරවීමත්, හැම දෙයක්ම අනුන් පිට තැබීමත් බොරු කයිවාරු ගැසීමත් පමණක්ම කරන පුද්ගලයෙක් හැටියට විවේචනය කෙරිණ. ටී.ඩී. වැඩ නොකළොත් ඔහුට සෑම වැඩක් ගැනම දැනගැනීමට තිබූ උවමනාවන් හැම තැනකටම හැම දෙයකටම ඇඟිලි ගැසීමත් ඔහුගේ ගෙදර සාකච්ඡා සඳහා සහෝදරවරුන් කැඳවීමට එපා යැයි තහනම් කර තිබියදීත් එය ගණන් නොගෙන හැම කෙනෙක්ම ඔහුගේ ගෙදරට කැඳවීමත්, හැම සාකච්ඡාවක්ම ඔහුගෙ ගෙදර පැවැත්වීමට උත්සාහ කිරීමත්, එමගින් ව්‍යාපාරය ගැන හැම දෙයක්ම දැනගැනීමට කටයුතු සලසා ගැනීමත්, රහස් පොලීසියේ ඔහුගේ පින්තූරයක් තිබියදී පවා ඔහුගේ ගෙදරට මෙතරම් සෙනගක් යද්දී ඔස්මන්ගේ ගෙදරට දවසට දෙතුන් වතාවක් කඩා පනින පොලිසිය සහ රහස් පොලිසිය මොහුගේ නිවසට එක වතාවක්වත් කඩා නොපැමිණීමත් (1971 මාර්තු අග දක්වාම පොලිසිය ඔහුගේ නිවසට ගියේ නැත.), ඔහු ලේක්හවුසියේ චේ ගුවේරාකාරයෙකු ලෙස එළිදරව් වී තිබියදීත් ලේක්හවුසිය ඔහු ගැන කිසිම පියවරක් නොගැනීමත් ඔහුගේ බිරිඳත් දරුවනුත් ව්‍යාපාරයේ වගකිවයුතු නායකයන් එම ගෙදරට ගිය විට දැක්වූ ආකල්පයන් ඔහු කලින් 1965 මැතිවරණයේදී මහජන එක්සත් පෙරමුණේ සිට යූ.ඇන්.පි.යට ගොස් සිටි බව වසන් කරගෙන තිබීමත් ව්‍යාපාරයට හොරෙන් අතුල මගින් මාස්පතා පුරා මාස 10ක් රු. 500 බැගින් ව්‍යාපාරයෙන් ලබාගෙන තිබීමත් ව්‍යාපාරයේ අරමුදලෙන් හා ශ්‍රමයෙන් කුස්සි කාමර දෙකක් වැසිකිළියක් හා නාන කාමරයක් සාදවා තිබීමත් ඔහු කලින් ව්‍යාපාරයට

සම්බන්ධ නොවුණේ නම් කැලිෆෝනියාවට යාමට බලාපොරොත්තුවෙන් සිටි බව ව්‍යාපාරයේ ඇතැම් සහෝදරවරුන්ට පවසා එළිදරව් වී තිබීමත් වැඩ කරනවා වෙනුවට ව්‍යාපාරයේ තොරතුරු සපයා ගැනීමට කටයුතු කිරීමත් සියුම් ලෙස ව්‍යාපාරයට සහ මට එරෙහිව කඩාකප්ල්කාරී අවලාද ව්‍යාපාරයක් දියත් කිරීමත් හේතුකොටගෙන මොහු ගැන තදින් සැක පහළවී තිබුණා. (ටී.ඩී. සංවිධායක මණ්ඩලයෙන් නෙරපීම සනත්ලාගේ අතුලලාගේ, කරූලාගේ විරෝධතා නිසා කළ නොහැකි විය. මන්ද? සංවිධායක මණ්ඩලයේ වැඩි දෙනක් ඒ පැත්තට සිටීමත් උයන්ගොඩත් මමත් මේ පැත්තට සිටීමත් නිසාය. එහෙත් කොළඹ දිසා කොමිටි සාකච්ඡාවකට මම ගොස් ඔහු දිස්ත්‍රික් ලේකම් ධූරයෙන් නෙරපීමට යෝජනා කොට එය සම්මත කර ගත්තේය. ඒ වෙනුවට ඔස්මන් පත්කිරීමට කළ යෝජනාවද සම්මත විය. ටී.ඩී.ද එම සාකච්ඡාවට සහභාගි විය.) ව්‍යාපාරයේ අරමුදල් අයථා ලෙස අතුල විසින් පරිහරණය කර ඇතැයි 1970 අග වන විට නොඑක් සාධක අනුව ඔප්පු වෙමින් තිබුණා.

මුදල් පරිහරණය පිළිබඳව කිසියම් සෑහීමකට පත්විය හැකි වාර්තාවක් ඉදිරිපත් කිරීමට ලොකු අතුලටවත්, සනත්ටවත් බැරුව ගියා. ලක්ෂ්මන් මාදුවගේ ආයාසයෙන් වසංකර ගෙන සිටි ඔහු පිළිබඳ යථාර්ථය (චරිතය සහ ක්‍රියා පටිපාටිය ගැන) අපිට හෙළිදරව් වූ බව දැන ගැනීමෙන් ඔහු අප සමග උරණ වුණා. මුලින්ම ඔහු සමග ප්‍රතිවිරෝධතා ගොඩනැගුනේ මොහුට වැඩ කරන ලෙස දැන්වූ විටයි. මොහු කුසීත කමින් වැඩ නොකර නිකං සිටීමට පුරුදුව සිටියේය. මොහු බොඩිගාඩ්කමින් අස්කළ විට තවත් මතභේද ඇතිකරගත්තා. මෙලෙස 1970 අග වන විට ඥාති සම්බන්ධතාවය පදනම් කොටගත් අතුල ටී.ඩී, සිල්වා, කුමානායක කල්ලියකුත් (ධනපාලත් එයට සම්බන්ධ වූණා.) ප්‍රදේශවාදය පදනම් කොටගත් අම්බලන්ගොඩ කල්ලියකුත් සනත්, ලක්ෂ්මන් මාදුවගේ, සිසිල්චන්ද්‍ර, සුනන්ද, අනුර (කවුරුත් මේ කල්ලි දෙක අතරේ සිටියා) බිහි වුණා. තමන් අයථා අන්දමින් රඳවාගෙන සිටි බලය අහිමිවීමේ තර්ජනයක් තමන් කර ඇති වැරැදි හෙළිදරව්වේය යන බියක් දක්ෂයින් ඉදිරියට යාමේ හැකියාවන් හමුවේ පොදු අභිලාෂයෙන් මේ කල්ලි දෙකම එකට එකතු කරගෙන ගියා.

ව්‍යාපාරය තුළ එහි සංවර්ධනයේ විශේෂත්වයන් හා එයට මුහුණ දීමට සිදුවූ විශේෂත්වයන් උපයෝගී කරගෙන ව්‍යාපාරය තුළ

අයුක්ති සහගත ලෙස හිමිකරගෙන සිටීමට හැකි වූ බලය තවදුරටත් රැකගැනීමෙන් ඒවා තහවුරු කරගැනීමේත් අරමුණින් යුතුව ලොකු අතුල, ටී.ඩී.කුමානායක කල්ලියත් එහි පසුපස සිටි එහි සහචරයිනුත් සනත්ගේ නායකත්වයෙන් යුත් අම්බලන්ගොඩ කල්ලියත් එහි පිටුපසින් සිටි සහචරයනුත් එකට එකතු වී එකම ද්‍රෝහී කල්ලියක් වශයෙන් කටයුතු කරගෙන යන ලදී. ද්‍රෝහීන් අතර මෙම සමගිය කොතරම් දුරට පැවතුනාදයත් ටී.ඩී. සිල්වාගේ ගෙදර 1971 පෙබරවාරි මස මුලදී ටී.ඩීත් ඔහුගේ බිරිඳත් විසින් හතර වන වරට පක්ෂය ගැන අංජනමක් බැලූ විට සනත්, සිසිල්චන්ද්‍ර සහ ලක්ෂ්මන් මාදුවගේත් එයට සහභාගී වී ඇත. මෙහිදී අලුත් නායකත්වයක් ගැනත් අලුත් නායකත්වයකින් විප්ලවය කිරීමේ හැකියාවත් අංජනමෙන් විමසා තිබේ. මේ කණ්ඩායම් දෙකේ එකතු වීමට තවත් පොදු කරුණු ගණනාවක් බලපෑවා. දෙගොල්ලන්ම පක්ෂ අරමුදල් වංචා කර තිබුණා. ව්‍යාපාරයෙන් බොහෝ දේ වසංකරගෙන තිබුණා. අදක්ෂතාවය හා අඩු සංවර්ධනයත් ඔවුන් අතර පොදු ගුණාංගයක් වුණා.

1971 මාර්තු 2 වැනිදා හෝ 3 වැනිදා රාත්‍රී ලොකු අතුල වේයන්ගොඩ, දඩගමුවේදී ඔහුගේ මිත්‍ර තිලකරත්නගේ අක්කාගේ නිවසේදී තිලකරත්න සහ සනී සමග මාව මැරීමට කුමන්ත්‍රණයක් සකස්කර තිබූ බවත් එය වෙනත් සතුරන්ගේ පිටින් තැබීමට කටයුතු සලසා තිබූ බවත් තිලකරත්නගේ මල්ලී වන කඩවත අමරසිංහ (මොහුද අතුලගේ හොඳ මිතුරෙකි.) විසින් දඩගමුව රජමහ විහාරයේ ව්‍යාපාරයට සම්බන්ධ හිමිනමක් සමග පවසා එමගින් අපට දැනගන්නට ලැබිණි. මෙය සනත්ලා දැන සිටි බව පමණක් නොව ඔවුන්ද මෙයට එකඟත්වකින් සිටි බවට සාක්ෂි තිබේ.

1971 මාර්තු 06වැනිදා මට හොරෙන් දිස්ත්‍රික් ලේකම්වරු අම්බලන්ගොඩට කැඳවා පාවා දීමට කටයුතු කළ විට සනත්ලා, කරූලා එයට විරුද්ධ නොවූවා පමණක් නොව සනත්, ටී.ඩී.ගේ පණිවුඩය ගෙන එය මාතර සුසිල්ට නොදන්වා පැන්ටිස් අයියා හමුවීමට කතරගම ගොස් තිබිණි. මාර්තු 06 වැනිදා ධර්මසේකරලා ඇමරිකන් තානාපති කාර්යාලයට පහරදුන් දවසයි. එදින අම්බලන්ගොඩට දිසා ලේකම්වරු සියලු දෙනාම කැඳවා තිබිණි. (අම්බලන්ගොඩ නිවෙස් සියල්ල හෙළිදරව් වී තිබිණි.) නමුත් කුමක් විය හැකිව තිබුණද? ඒ.එස්.පී, කෙනෙක් යටතේ පාලනය වූ ලොකු පොලිසියක් වූ අම්බලන්ගොඩ පොලිසියට ඔවුන් සියලු දෙනාම කොටු කිරීමට නොහැකි වේ යැයි කාට කිව හැකිද?

ඔවුන්ගේ ද්‍රෝහිකම් වංචාවන් හා වැරැදි වසන්කරගැනීම් සඳහා සියලු බංකොලොත් උපක්‍රම අසාර්ථක වූ විට සනත්ලා, අතුලලා ව්‍යාපාරයට හොරෙන් මට හොරෙන් ඔවුන්ට හිතවත් ප්‍රදේශවල පහරදීම් කරන්නට මම විප්ලවවාදියෙකු නොවන බව හංවඩු ගැසීමටත් ඔවුන් ව්‍යාපාරයක් දියත් කළා. අවි ආයුද ඔවුන් ළඟ තිබීමත්, දිස්ත්‍රික්ක කිහිපයකම සබඳකම් ඔවුන් අත තිබීමත්, කලින් සනත්ගේ ඉල්ලීම පිට පූර්ණකාලීනයින් වැඩි යැයි සඳහන් කරමින් හා ඔවුන් ප්‍රදේශයේ තදින් එළිදරව් වී ඇති බව කියමින් එවකට වැඩ කර නොතිබූ ප්‍රදේශවල ගාලු දිස්ත්‍රික්කයෙන් කෙලින්ම පූර්ණ කාලීනයන් ලෙස යවා තිබූ බොහෝදෙනෙක් දිස්ත්‍රික් නායකයින් කර තිබීමේත් වාසිය ප්‍රයෝජනයට ගෙන සනත්-අතුල කල්ලිය තම ව්‍යාපාරය රහසිගතව කරගෙන ගියා.

සනතුත්, අතුලත් ආයුධවලින් සන්නද්ධයයි ඔවුන්ට දිස්ත්‍රික්කය හා වෙනත් දිස්ත්‍රික්ක ගණනාවකම බලය ඇතැයිද අතුල විසින් වේයන්ගොඩ ජයසූරිය සමග පවසා තිබේ. තවද ඔහු (5000)ක් සිටි ඇතැයිද ඔවුන් පහර දීම කරනු ලබන්නේ යයිද පවසා මට තදින් කනට කර වචනයෙන් බැන වැදී ඇත. මොවුන්ගේ කුමන්ත්‍රණ සියල්ල මාර්තු 6 වැනිදා වන විට හොඳින් හෙළිදරව් වී තිබිණි. නමුත් මොවුන්ගේ ව්‍යාපාරයට කළ හැකි හානිය යථා පරිදි තේරුම්ගත් අපි ඉවසිලිවන්තව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වුණා. නමුත් සති කිහිපයක් ඇතුළත ඔවුන් විසින් අපව පාවාදෙන ලදී. (මේ ගැන සෑහෙන කරුණු හෙළිවී ඇති අතර තවත් සෙවිය යුතුව ඇත) ඉන්පසු ඔවුහු ඔවුන්ගේ ද්‍රෝහී ක්‍රියාමාර්ග ක්‍රියාවට නගා ඇත. (ඇත්ත වශයෙන්ම අප්‍රේල් අරගලය පිළිබඳ යථාර්ථය නිසි පරිදි හාරා අවුස්සාගන්නා තෙක් මේ මෑතක් වනතුරුම සනත්ගේ ද්‍රෝහී ස්වභාවය මා විසින් යථා පරිදි තේරුම්ගෙන නොතිබිණි.) මොවුන් සමග මගේ ඇති වූ දේශපාලන අරගලයේදී මොවුන් කෙතෙක්දුරට බංකොලොත් වී තිබෙන්නේ ද යත් සකලවිධ ධනේශ්වර පාලක පංතියක් විසින්ම විප්ලවවාදීන්ට එරෙහිව ඉතිහාසය පුරා අවලාද අපහාස චරිත ඝාතන කර ඇති පරිදි මට ද එරෙහිව එසේ කිරීමේ ව්‍යාපාරයක් දියත් කරන ලදී. මෙය ටී.ඩී. ගේ බිරිඳගෙන් පටන්ගෙන අතුලලා හරහා සනත් කණ්ඩායම දක්වාම කරන ලදී.

ව්‍යාපාරය තුළ මතභේද ඉතාමත්ම උග්‍ර තත්වයකට පත්ව තිබිය දී ඒවා ඉතාමත් මුවහත් වී තිබිය දී මාව අත්අඩංගුවට ගනු ලැබීමෙන් වාසි ලැබූ අතුල සනත් කල්ලිය ඔවුන්ගේ දඩබ්බර

ක්‍රියාමාර්ගය ගෙනයාමට අවස්ථාව ලබාගත්තා. මා අත්අඩංගුවට ගත් බව දන්වන පත්‍රිකාව බෙදා නොහරින ලෙසත් ''රතු ලංකා'' පුවත්පත නොවිකුණන ලෙසත් ලොකු අතුල නුවර අයට උපදෙස් දී එම පුවත්පත් හා පත්‍රිකා ගිනි තබ්බවා ඇත. එසේම සනත්, රථයක් කුලියට ගෙන අම්බලන්ගොඩ සිට තිස්සමහාරාමයට ගොස් එම පත්‍රිකා නොබෙදන ලෙස පැන්ටිස් අයියාට දන්වා තිබේ. එලෙසම සිසිල්චන්ද්‍ර අම්බලන්ගොඩදී පත්‍රිකා බෙදුවහොත් ගහලා පන්නනවා යැයි සහෝදරවරුන් පිරිසකට තර්ජනය කර තිබේ. මෙසේ පත්‍රිකා බෙදීම වළක්වා පොලිසිවලට පහරදීමට සුදානම් කරන ලෙස ලොකු අතුල කියා ඇත්තේ, නුවර මාර්තු මස මැද දී මයි. (අනුර කුරුකුලසූරිය ගේ කටඋත්තරයේත් මෙය සඳහන්ව ඇත.) මාර්තු 18 දා අම්බලන්ගොඩ දීත් පසුව ටී. ඩී. ගේ ගෙදර දීත් තවත් වතාවක් ලොකු අතුලගේ නැන්දාගේ ගෙදරදීත් මාර්තු 29 වැනිදා සත්ව උද්‍යානයේදීත් මාත් උයන්ගොඩත් හැර (එවකට මා සිර බාරයේය. උයන්ගොඩ කැඳවා නොතිබුණි.) ඔවුන් දේශපාලන මණ්ඩලයයැයි හඳුන්වන සංවිධානයක කොමිටියේ රැස්වීම් පවත්වා තිබේ . එහිදී ලොකු අතුල, කරූ, හා සරත්ගෙන් යුත් ලේකම් මණ්ඩලයක් ඔවුන් තෝරාගෙන තිබේ.

මේ සාකච්ඡාවලදී කළ කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් වශයෙන් තමයි අප්‍රේල් 5 වැනිදා ඒ අතිධාවනකාරී ක්‍රියාව අවංක සහෝදරවරු ගණනාවකගේ වටිනා විප්ලවවාදී ජීවිත බිලිගනිමින් සිදුවුයේ. වැල්ලවායේ කලින් දින පහර දීම සිදුවුයේ සනත්ලා සමගින් අම්බලන්ගොඩ දී අරගෙන තිබූ තීරණයක් අනුවලු. පසුව දිනය වෙනස් කළ බව දන්වන්නට අමතක වෙලාලු. (මොණරාගල දිස්ත්‍රික් ලේකම් ලෙස ඇල්පිටියෙන් ප්‍රේමසිරි ගමගේ හැර තිබෙන්නේ සනත් විසින් අපට හොරාය. අප එය දැනගත් විට මාර්තු 6 වැනිදා සාකච්ඡාවේදී ඒ පිළිබඳවත් ඔහුට චෝදනා කළා.) මා සිරගෙය තුළ සිටියදී පහර දුන්විට සතුරා විසින් මාව මරාදමනු ඇතැයි ඔවුන් බලාපොරොත්තු වී තිබෙනවා. නමුත් එය සිදු වුයේ නැහැ. අප්‍රේල් 02 වන දා සාකච්ඡාව ඔවුන්ගේ වැඩපිළිවෙළට අනිත් අයත් හවුල්කර ගැනීමට කරපු කුමන්ත්‍රණයක් පමණයි. මෙහි දී සනත් යෝජනා කර තිබෙන්නේ රාජ්‍ය බලය ඇල්ලුවාට පසු අප්‍රේල් 15 බටපොළදී සියලු දෙනාම මුණගැසෙන්නටයි. මෙය මෙසේ වුණා නම් බටපොළට ගියා නම් අපි සහෝදරවරුන්ට ජීවත්වීමේ වරම් ලැබේද? කිසිම සංවිධායක මණ්ඩලයක නොසිටි ලයියාටත්* උයන්ගොඩටත් කොළඹ භාරදී තිබෙන්නේ ඔවුන් බිලි දීමටයි. සතුරා

ප්‍රකාශක සටහන්:
*. ලයනල් බෝපගේ

පහර දෙන විට පසු බැසිය යුතුය යනු පිළිගත් මාක්ස්වාදී සිද්ධාන්තයකි. මා CRP එකට ගෙන ආ විට එහි පැමිණි ඔස්මන්, සිසිල් චන්ද්‍ර හා කුමානායකගෙනුත් යාපනයට පැමිණි ඔස්මන්ගේ අම්මාගෙනුත් පසු බසින ලෙසත් හෙළිදරව් වී ඇති සහෝදරවරු දිස්ත්‍රික්වලින් මාරු කරන ලෙසත් කුපිතකාරී ක්‍රියා නොකරන ලෙසත් දිගින් දිගටම මාවිසින් ඉල්ලා සිටියදීත් ව්‍යාපාරය තුළට රිංගා ගත් සතුරු ඒජන්තවරු සහ ව්‍යාපාරය තුළ සිටි ද්‍රෝහීන් එකතු වී ව්‍යාපාරය විනාශ කිරීමට සතුරාට උදව් දී තිබේ. (මේ පිළිබඳ සියලු කරුණු දැන් හෙළි වී සහ හෙළිවෙමින් ඇත. උදාහරණයක් වශයෙන් අප්‍රේල් 2 දිනට පෙර ලොකු අතුලලා විසින් සාකච්ඡා දෙකක් පැවැත්වූ බව පමණි හෙළි වී තිබුණේ. නමුත් හරස් ප්‍රශ්න ඇසීමේදී මාර්තු 18 සිට මාර්තු 19 අතර සාකච්ඡා 4ක් කර ඇති බව ලොකු අතුලගෙන් ඉබේම ගිලිහුණි. මේවාට සහභාගි වූ සිසිල් චන්ද්‍ර ලක්ෂ්මන් මාදුවගේ වැනි අය මේ සාකච්ඡා වසන්කර ගෙන සිටි අතර ඊයේ පෙරේදා හෙළිවන තුරු අප මේ ගැන කිසිවක් දැන සිටියේ නැත.) ඒවා සියල්ල විස්තරාත්මකව ලියා දැක්වීමට බලාපොරොත්තු වෙමි.

ජනතා විමුක්ති පෙරමුණ විනාශ කිරීමට ධනේශ්වර පාලක පංතියට අනියම් ක්‍රමයකින් උදව් කිරීමේත්, දසදහස් ගණන් ශ්‍රේෂ්ඨ විප්ලවවාදී සොහොයුරන් ධනේශ්වර මර්දනයට බිලිදීමේත් චෝදනාව මම ව්‍යාපාරය තුළ සිටි ද්‍රෝහීන්ට සහ සතුරු ඒජන්තවරුන්ට එරෙහිව එළිපිටම චෝදනා නගන්නෙමි. (මේ ද්‍රෝහී ක්‍රියාවට මුල් වූ සියල්ලම සනත්, කරූ, අතුල ඇතුළු අය අද ජීවතුන් අතර සිටිමින් නොයෙක් ආකාරයෙන් සතුරු පස ගෙන ක්‍රියා කරන බව පැහැදිලිය.)

මහ නඩුවේ සිටින ද්‍රෝහීන් සියලු දෙනාම රජයත් සමග ඉතාමත් කිට්ටු සම්බන්ධකම් පවත්වමින් ජනතා විමුක්ති පෙරමුණට එරෙහිව කුමන්ත්‍රණයකට හවුල් වී සිටී. ලොකු අතුල, ටී.ඩී, කුමානායක මෙන්ම මේ අය ද (ජනතා විමුක්ති පෙරමුණට එරෙහි අය) ඉයන් වික්‍රමනායකත් ෆීලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායකත් රහස් පොලිසියත් සමග නොයෙක් ක්‍රමවලින් සම්බන්ධකම් පවත්වමින් අඩු දඬුවම්, සමාවත් පවුලේ අනෙකුත් අය නිදහස් කරගැනීම ආදී අරමුණු ඉටුකර ගැනීමටත් තම ද්‍රෝහීකම් සඟවා ගැනීමටත් සතුරු අවශ්‍යතාවයන් ඉටු කරමින් ජනතා විමුක්ති පෙරමුණටත් පෞද්ගලිකව මටත් එරෙහිව අපහාස කිරීමේත්, දේශපාලන මඩගැසීමේත්, නීතිමය වශයෙන් සිරකිරීමේත් අරමුණෙන් බොරු සාක්ෂිදීමත් බොරු සාක්ෂි මෙහෙයවීමත් කර ගෙන යයි. නඩුවේ සැබෑ සැකකරුවන් වී ඇත්තේ කිහිප දෙනෙකි.

ද්‍රෝහීන් සියලුදෙනාම පැමිණිල්ලේ පැත්ත ගෙන පැමිණිල්ලේ උපදෙස් පිට අපට එරෙහිව පැමිණිල්ල මෙහෙයවමින් සිටී. ෆීලික්ස් මේ ගැන කල්තියා කයිවාරුවක් ගසා තිබී. එය ඒ දිනවලම අපට ආරංචි විය. (මටත් ජනතා විමුක්ති පෙරමුණටත් එරෙහිව මඩගැසීමේ අරමුණින් ඉදිරියේදී තවත් ඊනියා සැකකරුවන් කිහිප දෙනෙකුම සාක්ෂි කූඩුවට නගින බවට නම් සැකයක් නැත.

ද්‍රෝහීන් පිළිබඳ ප්‍රශ්නය මුළු මහත් ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය අද මුහුණ පාන බරපතළම ගැටලුවලින් එකකි. මේ විෂය පිළිබඳව නිර්මල මාක්ස් ලෙනින්වාදී විප්ලවවාදීන් බරපතළ අවධානයක් යොමුකළ යුතු අවස්ථාව පැමිණ තිබේ. අපි මේ විෂය ඉතා උනන්දුවෙන් හැදෑරිය යුතු වෙමු. පර්යේෂණ කළ යුතු වෙමු. මුළු මහත් ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ ඉතිහාසය ගත් විට එහි නොයෙක් වකවානුවලදී නොයෙක් තැන් හිදී නොයෙක් ආකාරයෙන් නානාප්‍රකාර අලාභහානි විනාශයන් කළ ද්‍රෝහීන් හමුවෙයි. මින් එක කොටසක් කෙලින්ම සතුරු පංති ඒජන්තවරු වශයෙන් කොමියුනිස්ට් ව්‍යාපාරවලට රිංගවන ලද්දවුන්ය. හැම රටකම මෙවැනි ඒජන්තවරුන් සිට පසු කලෙක හෙළිදරව් වී තිබේ. රුසියාවේ බෝල්ෂෙවික් පක්ෂය තුළට රිංගාගත් එහි මධ්‍යම කාරක සභාවටත් රිංගාගත් එහි ප්‍රචාරක අංශයේ ප්‍රමුඛයෙකුව සිටි මැලිනොව්ස්කි එවැන්නකි. බොල්ෂෙවික් පක්ෂය තුළ සිටියේ මැලිනොව්ස්කිලා එක්කෙනෙකු පමණක් නොවේ. ඔවුන් විශාල ගණනක් නොයෙක් අවස්ථාවලදී හෙළිදරව් වී තිබේ. පළමුවන ලෝක මහා සංග්‍රාමය ආරම්භ වන විට බෝල්ෂෙවික් පක්ෂය බලසම්පන්න පෙට්‍රෝග්‍රෑඩ් (දැන් ලෙනින් ග්‍රෑඩ් -අගනුවර) නාගරික කොමිටියේ සාමාජිකයින් 7 දෙනාගෙන් තිදෙනෙක් සාර් පොලිසියේ ඔත්තුකාරයින් බව පසුව ඔප්පු විය. ඇල්බේනියාව ජාතික විමුක්ති සටන (ෆැසිස්ට්වාදයට එරෙහිව) ඇල්බේනියානු කොමියුනිස්ට් පක්ෂය විසින් මෙහෙයවනු ලැබූ අවස්ථාවේදී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී ඒජන්තවරයෙකු වූ සෙන්පති බිල් මැක්ලිංගේ (Major Bill Maclin) ක්‍රියා කලාපය මෙයට කදිම නිදසුනකි. අබාස් කැපි සහ මුස්තාපා ජින්සි යන බ්‍රිතාන්‍ය ඔත්තුකරුවන් දෙදෙනා ඇල්බේනියානු ජාතික විමුක්ති පෙරමුණට රිංගවා එහි ඔත්තු සෙවීමත් එය ඇතුළතින් බිඳවීමටත් කටයුතු කරගෙන යනු ලැබුවා. බිල් මැක්ලිං පලස්තීනයේ සහ ඇබිසීනියාවේත් (දැන් ඉතියෝපියාව) යටත්විජිත ගරිල්ලා යුද්ධවල පළපුරුදු ඒජන්තවරයෙකු විය. මොවුන්ගේ අවශ්‍යතාවය වුණේ ඇල්බේනියානු ජාතික විමුක්ති

පෙරමුණෙන් කොමියුනිස්ට්වාදීන් නෙරපා හැර දුවවන නූල බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ අතට හසුකර ගැනීමයි. මේ පිළිබඳව කදිම විස්තරයක් ෆැඩිල් පක්රාමිගේ (Fadil Packramy) ''කුමන්ත්‍රණවල අසාර්ථකත්වය'' (Failure of Plots) නම් පොතේ සඳහන් වේ.

මෙලෙසම චින්පෙන් සහෝදරයාට ප්‍රථම මලයානු කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා වශයෙන් සිටි ලොයි- ටෙක් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ ඔත්තුකරුවකු වූ බව හෙළි වී ඇත. වියට්නාම් ජාතිකයෙකු වූ ලොයි-ටෙක් ප්‍රථමයෙන්ම ප්‍රංශ අධිරාජ්‍යවාදීන් විසින් ඉන්දු චීනයේ විමුක්ති අරගලයට එරෙහිව ඔත්තුකරුවෙකු වශයෙන් ප්‍රයෝජනයට ගනිමින් සිට එය හෙළිදරව් වීමේදී මේ පුද්ගලයා ගෙනැවිත් සිංගප්පූරුවේදී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්හට බාරදුන්නාලු. ''මොහු ඉතා ප්‍රයෝජනවත් පුද්ගලයෙක්. මොහු හපනෙක් බව ඔබට පෙනේවී'' යන සටහනකුත් සමග බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීහු අනතුරුව මොහු සිංගප්පූරුවේ කොමියුනිස්ට් ව්‍යාපාරයට රිංගවා තිබෙනවා. අනතුරුව දක්ෂ ලෙස හා කපටි ලෙස මලයානු කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයටම නැග තිබෙනවා. වසර ගණනාවක්ම මලයානු කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයේ සිටි මේ බ්‍රිතාන්‍ය ඔත්තුකරුවාගේ ක්‍රියාකලාපය හේතුවෙන් මලයානු කොමියුනිස්ට් ව්‍යාපාරය තදබල විනාශයකට ගොදුරු වූ බව පැහැදිලිය. ලොයි-ටෙක් කිසිදා කොමියුනිස්ට්වාදියෙකු නොවීය. ඔහු අධිරාජ්‍යවාදී ඔත්තුකරුවෙකු පමණක් වූයේය. මේ අබිරහසේ පුද්ගලයා නම් තුන්වන ජාත්‍යන්තරයෙන් එවන ලද පුද්ගලයෙකු ලෙස හඟවමින් ප්‍රයෝගකාරී ලෙස හා කූට ලෙස කරගෙන යන ලද ද්‍රෝහී ක්‍රියා කලාපය හෙළිවෙමින් පවතිද්දී පක්ෂ අරමුදල්ද ගෙන රහසින් පැනයන ලදී. මෙතෙක් ඔහු පිළිබඳ වෘතාන්තය ගුප්තය. අබිරහසකි. මේ ගැන පසුව හෙළිදරව් කරමින් චින්පෙන් සහෝදරයා ලොයි-ටෙක් සිද්ධිය පිළිබඳ ප්‍රකාශනය (MANIFESTO OF THE LOI-TEK INCIDENT) නමින් ප්‍රකාශයක් කළා. ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය ජාත්‍යන්තර ජාතික විමුක්ති ව්‍යාපාරයත් විනාශ කරලීම සඳහා අධිරාජ්‍යවාදීහු ධනේශ්වර පංතිය හෝ තම ඒජනත්තවරුන් එම ව්‍යාපාර තුළට රිංගවා එමගින් ඔත්තු සොයා එම ව්‍යාපාර නොමඟ යවා එම ව්‍යාපාර බේදභින්න කර පොදුජන පිළිකුලට පත්කර විනාශ කිරීමට කටයුතු යොදාගෙන ඇති ආකාරය ගැන බොහෝ දෑ හෙළිදරව් වී ඇත. ඊට අමතරව සතුරන් තම පංති ඒජන්තවරුන් එම විප්ලවවාදී ව්‍යාපාරය තුළට රිංගවීමට අමතරව එම ව්‍යාපාර තුළම සිටිමින් දුර්වලයින් හා අවස්ථාවාදීන්

පිරිහී ගිය පුද්ගලයින් නොයෙක් ක්‍රමවලින් විවිධ පොරොන්දු මිල මුදල් ස්ත්‍රීන් හා කාමුක ජීවිත හා නොයෙක් දේ ප්‍රදානය කිරීම් මගින් තම පසට දිනාගනු ලැබූ අවස්ථා එමටය. මෙවැනි පාවා දෙන්නන්ගෙන් හා ද්‍රෝහීන්ගෙන් තොර විප්ලවවාදී ව්‍යාපාරයක් සෙවීම පවා අපහසුයි.

චීන කොමියුනිස්ට් පක්ෂයේ නායකයෙකුව සිටි වාංකු ඕ තාඕ ගොවීන්ගේ විප්ලවවාදී හැකියාව අඩුවෙන් තක්සේරු කිරීමෙන් වාම අවස්ථාවාදී විය. ඔහුගේ ද්‍රෝහී ක්‍රියාකලාපය ගැන ප්‍රතිවිරෝධය නම් සිය කෘතියට 33 වන සටහන ලියමින් මාඕ මෙසේ කියයි. ''වාංකුඕ තාඕ චීන විප්ලවයෙන් පළාගිය ද්‍රෝහියෙක් විය. විප්ලවයෙන් තමාට වාසි ලැබීමට කල්පනා කරමින් සිටි ඔහු තම තරුණ කාලයේදී චීන කොමියුනිස්ට් පක්ෂයට බැඳුණේය. පක්ෂය තුළ ඔහු බොහෝ වැරැදි කළේය. අවසන් වූයේ බරපතළ අපරාධ කරමින්ය. හොඳටම ප්‍රසිද්ධ දේ වශයෙන් 1935 දී ඔහු රතු හමුදාව සෙච්චුආන් චින්කා දේශසීමාවට පසුබැසිය යුතු යැයි පරාජයවාදී විසුරුවා හැරීම්වාදී මතයක් ඉදිරිපත් කරමින් රතු හමුදාව උතුරු දෙසට ගමන් කරනවාට විරුද්ධ විය. ඔහු පක්ෂයටත් මධ්‍යම කාරක සභාවටත් විරුද්ධව එළිපිටම ද්‍රෝහී වැඩ කටයුතුවල යෙදුණේය. තමාගේම බොරු මධ්‍යම කාරක සභාවක් පිහිටුවිවේය. පක්ෂයේත් රතු හමුදාවේත් සමගිය අවුල්-පවුල් කළේය. එහි සිවුවැනි පෙරමුණු හමුදාවත් එහි බොහෝ වූ කාඩර්වරුත් මධ්‍යම කාරක සභාවේ නිවැරැදි නායකත්වයකට ආපසු අවුත් අනතුරුව කළ අරගලවලදී ගෞරවණීය කොටසක් ඉටු කළහ. කෙසේ හෝ වේවා. වාංකු ඕ තාඕ තමා හික්මිය නොහැකි පුද්ගලයකු බව ස්ඵුට කළේය. 1938 වසන්තයේදී සෙන් ෂු - කාන්ෂු - නින්සියා දේශසීමා ප්‍රාන්තයෙන් තනියම පැන ගොස් කුඕ මින්තා රහස් පොලීසියට බැදුණේය. (මාවෝ සේතුන්ගේ තොරාගත් ලිපි පිටු 115, 33 වන සටහන) මෙලෙස ද්‍රෝහී බිහි වූයේ චීන කොමියුනිස්ට් පක්ෂය තුළ පමණක් නොවේ.

කියුබානු විප්ලවයේ මතක සටහන් නම් කෘතියෙහි චේ ගුවේරා එක් තැනකදී බැටිස්ටාගේ රහස් ඒජන්තවරයකු වූ එයුටිමියෝ කැස්ට්‍රෝ මැරීම සඳහා ගෙරිල්ලා භටයකු ලෙස ගෙරිල්ලා කඳවුර තුළ සිටිමින් එක් රැයකදී කැස්ට්‍රෝ ළඟම නිදියමින් ගත් වෙහෙස ගැන සඳහන් කරයි. කියුබානු ගෙරිල්ලා භටයින්ට තිබුණු ලොකුම ගැටලුව ද්‍රෝහීන් හා පැනයන්නන් බව සඳහන් කරන චේ ගවේරා කෙනෙක් මොන අන්දමින් හෝ ගරිල්ලා කණ්ඩායම අතහැර ගියේ නම් ඔහු ද්‍රෝහියකු ලෙස සලකා කණ්ඩායමේ ඉසව්ව වෙනස් කරන්නට සිදුවූ බව කියයි.

පක්‍ෂය තුළින් බිහිවූ ද්‍රෝහීන් හා ද්‍රෝහීන්ගේ විනාශකාරී ක්‍රියා පිළිබඳව ඉතාමත්ම හොඳ අත්දැකීම් මලයානු කොමියුනිස්ට් පක්‍ෂය අපට සපයයි. අද ජනතා විමුක්ති පෙරමුණට එරෙහිව වර්තමාන ආණ්ඩුව ධනේශ්වර පාලක පංතිය කරගෙන යනු ලැබෙන මර්දනය සඳහා ප්‍රධාන වශයෙන්ම යොදනු ලබනුයේ මලයානු කොමියුනිස්ට් පක්‍ෂයටත්, මලයානු විමුක්ති සටනටත් එරෙහිව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් 1948 සිට 1960 දක්වාත් ඉන් අනතුරුව යොදවනු ලැබ අත්හදා බලන ලද ක්‍රියාමාර්ගයන් හා උපාය උපක්‍රම බැවින් අපි ටිකක් ඒ ගැන සලකා බලමු.

මලයානු කොමියුනිස්ට් පක්‍ෂයේ නායකත්වයෙන් මලයානු විමුක්ති අරගලය දියත් කෙරුණු විට එය මර්දනය කිරීම සඳහා ඉදිරිපත්වුණු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී නායකයෙකු වූ ජෙනරාල් හෙරල්ඩ් ටෙම්පර්ගේ මේ ප්‍රකාශය සලකා බලනු වටී. ''පිළිතුරු රැඳී ඇත්තේ වඩ වඩා භට කණ්ඩායම් වනාන්තරයට ඇතුල් කිරීමෙහි නොව ජනතාවගේ හදවත් සහ සිත් තුළය.'' මෙයින් අදහස් කරනුයේ කොමියුනිස්ට්වාදීනට විරුද්ධව විප්ලවවාදීන්ට එරෙහිව තීරණාත්මක ප්‍රහාරයන් දිය යුත්තේ යුදමය වශයෙන් නොව දේශපාලන වශයෙන් බවත් කොමියුනිස්ට්වාදීන් විනාශ කර දැමිය හැක්කේ යුද්ධමය ප්‍රතිප්‍රහාරයනට වඩා දේශපාලන ප්‍රතිප්‍රහාරයන් මගින් බවයි. ඔවුන් මේ සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කළා. එම වැඩපිළිවෙළේ එක් අංශයක් වූයේ වඩාත් ශක්තිමත් හා භක්තිමත්, කැපවුණු කොමියුනිස්ට් නායකයින් ඝාතනය කරන අතර දුර්වල පිරිහුණු පුද්ගලයින් ද්‍රෝහීන් බවට පත් කර ඒ ද්‍රෝහීන් මගින් පක්‍ෂයටත් කොමියුනිස්ට් දර්ශනයටත් නින්දා අවලාද, අපහාස නගමින් එමගින් කොමියුනිස්ට්වාදයත් කොමියුනිස්ට් පක්ෂයත්, කොමියුනිස්ට් නායකයිනුත් විනාශ කර දැමීමයි. මෙලෙස ද්‍රෝහීන් දිනා ගැනීම සඳහා ඉතාමත් සංකීර්ණ සහ සූක්‍ෂම වැඩපිළිවෙළක් ගෙන ගියා.

ජපන් යුදවාදීන් සහ චියැන් කායි ෂෙක් කල්ලිය චීන කොමියුනිස්ට්වාදීන් එදා හැඳින්වූයේ මංකොල්ලකරුවන් (Bandit) ලෙසිනි. නමුත් චීනයේ කොමියුනිස්ට්වාදීන් සාර්ථක වූ නිසා මලයාවේදී ඔවුන්ට කොමියුනිස්ට් ත්‍රස්තවාදීන් යැයි නම් තැබුවා. මේ නම තමයි ජනතා විමුක්ති පෙරමුණටත් එරෙහිව ලාංකීය ධනේශ්වර පාලක පංතිය ප්‍රයෝජනයට ගනිමින් සිටිනුයේ. අපවත් ත්‍රස්තවාදීන් වශයෙන් හඳුන්වනුයේ ඒ අනුවයි. මලයානු කොමියුනිස්ට් පක්‍ෂය විනාශ කර දැමීම සඳහා එක් පැත්තකින් දක්‍ෂ තහවුරු ශක්තිමත්

හා භක්තිමත් කැපවුණු විප්ලවවාදී මාක්ස් ලෙනින්වාදීන් මරාදැමීමේ ක්‍රියාදාමයේදී මරා දමන ලද නායකයන් වූයේ මලාවි-යෙවි සහෝදරයා. මොහු මලයානු කොමියුනිස්ට් පක්ෂයේ ගරිල්ලා සටන් පිළිබඳව විශේෂඥයා ලෙස සැලකේ. ජොහෝර් ප්‍රාන්තයේ කොමියුනිස්ට් නායක හෝ-පෙන්තුන් සහෝදරයා යෙඔන්ස්ක්වෝ සහෝදරයා. ඔහු මලයානු කොමියුනිස්ට් පක්ෂයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සහෝදරයාය. ඔනාජ්ද ජැවි සහෝදරයා, ඔහු මලයානු ජාතික විමුක්ති හමුදාවේ දහවන මැලේ රෙජිමේන්තුවේ ප්‍රධාන අණදෙන නිලධාරියා විය. ඔහුගේ හිස වෙනුවෙන් ඩොලර් 75,000ක් දෙන බව පවසා තිබුණි. කජාන් හි පක්ෂ නායකයා කජාන් සිට හැතැක්ම 15ක් ඇතුළත කැළයේ පැල්පතක දී ඔහුගේ බිරිඳ සමග මරාදමනු ලැබීය. ඔහු හැඳින්වූ ආරූඪ නම ''රැවුල්කාර භීෂණයයි'' (Bearded terror) පක්ෂ මධ්‍යම කාරක සභිකයකු වූ වයස 29ක් වු මලක්කා ජෝහෝර් ප්‍රදේශයේ ක්‍රියාකාරී වූ මිටිකුක් සහෝදරයා මරාදමන ලදී. ඔහු මරා දමන ලද්දේ ඔහු සඳහා නියම කර තිබූ ඩොලර් දෙලක්ෂය ලබාගැනීමට ද්‍රෝහීන් තිදෙනකු පෙළඹවීම මගිනි.

මලයානු කොමියුනිස්ට් පක්ෂයේ පෙරාක් ප්‍රාන්ත කොමිටියේ සාමාජිකාවක් වූ ලී වෙංග් සහෝදරිය ඉතාමත් අමානුෂික හා අසාධාරණ බොරු නඩු විභාග ගණනාවක් මගින් මරණ දණ්ඩනයට කැප කරන ලදී. එක් අතකින් මෙලෙස ශක්තිමත් හා භක්තිමත් කොමියුනිස්ට්වාදීන් ඝාතනය කරනු ලැබූ අතර අනෙක් අතින් දුර්වලයින් පරාභව ගතවූවන් පාවාදෙන්නන් හා ද්‍රෝහීන් ප්‍රයෝජනයට ගෙන උන්ට දහස් ගණනින් දසදහස් ගණන් මුදලින් තෑගි දී වෙනත් නොයෙක් තාන්න-මාන්න පිරිනමා ඒ ද්‍රෝහීන් උපයෝගී කරගෙන පක්ෂයේ කැපවුණු නායකයින් විනාශකර දැමීමටත් පක්ෂය දුර්වල කිරීමත් පක්ෂ සාමාජිකයින් අල්ලා ගැනීමටත් ඔවුන් මගින් අලුතින් ද්‍රෝහීන් හා පාවාදෙන්නන් බිහිකර ගැනීමටත් පක්ෂයටත් පක්ෂ නායකත්වයටත් නින්දා අපහාස හා අවලාද නැගීමටත් කටයුතු කළා. මෙලෙස මලයානු කොමියුනිස්ට් පක්ෂය තුළින් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් සොයා ගත් ද්‍රෝහීන් ගණනාවකි. ඉන් පළමු වැනියා ලෑම්ස් වී විය. මොහු මුලදී පෑන් මලයානු වෘත්තීය සමිති සම්මේලනයේ වැඩබලන ප්‍රධාන ලේකම්වරයා විය. විමුක්ති සටන දියත් කිරීමෙන් පසුව ඔහු විමුක්ති හමුදාවේ හතරවන ජොහෝර් ප්‍රාදේශීය කොමිටියේ සාමාජිකයෙකුද විය. (දකුණු ජෝහොර් කොමියුනිස්ට් පක්ෂය ඉතා බලවත් ප්‍රදේශයක් විය. මොහු 1950 ජුනි 27 වැනිදා පාහාන්ග් ප්‍රදේශයේ බෙන්ටොන්ග් පොලිස් ස්ථානයට තනියෙන් හොරෙන් ගොස්

භාර විය. භාරවීමට ප්‍රථම මොහුගේ සාවද්‍ය ක්‍රියාකලාපය හෙළිදරව් වීමේ හේතුවෙන් චින්-පෙන් සහෝදරයාගේ නායකත්වයෙන් යුත් පක්ෂ මධ්‍යම කාරක සභාව ඔහුගේ ළඟම තිබූ පිස්තෝලය සහ අත් බෝම්බ ඔහුට අහිමි කර දඬුවම් කරන ලදී. මේ ද්‍රෝහියා සතුරාට භාරවී පක්ෂයට විරෙහිවී කරන ලද අපරාධ හා ද්‍රෝහීකම් සුළුපටු නොවේ. මොහුගේ භාරවීම මාස හතරක් යනතුරු ධනේශ්වර ආණ්ඩුව විසින් රහසක් වශයෙන් තබාගන්නා ලදී. ඒ එතෙක් කල් ඔහුගේ පාවාදීම අනුව මිනිසුන් ඇල්ලීමටයි. මේ ද්‍රෝහියා විසින් අධිරාජ්‍යවාදීන් සමග එකතු වී පක්ෂයට විරෙහිව ලියන ලද අවලාද සහ අපහාස ලියවිල්ලක් වූ (My Accusation) නමින් දස දහස් ගණන් කොපි මුද්‍රණය කර රට පුරාත් කැළය පුරාත් අධිරාජ්‍යවාදී ආණ්ඩුව විසින් බෙදා හරින ලදී. නොවැම්බර් 8 වැනිදා අධිරාජ්‍යවාදීන් විසින් මේ ද්‍රෝහියා ලව්වා කොමියුනිස්ට් පක්ෂයටත් එහි නායකත්වයටත් විරෙහිව ප්‍රසිද්ධ පුවත්පත් සාකච්ඡාවක් පවත්වන ලදී.

එවකටත් පංති සතුරා හමුවේ පක්ෂය පිළිබඳ තමන් දැන සිටි රහස් සියල්ල එහි නායකයින්, සංවිධාන ක්‍රම උපාය උපක්‍රම හා පුද්ගලයන් ගැන සියලු තොරතුරු සපයා පක්ෂයට විරෙහිව පංති සතුරාගේ පංති අවශ්‍යතාවයට අනුව කැත නින්දිත අවලාද අපහාස නැගූ මේ ද්‍රෝහියා එම පුවත්පත් සාකච්ඡාවේදී (ධනේශ්වර පංතියේ ප්‍රචාරක කටයුත්තේදී) ''ස්ට්‍රේට් ටයිම්ස්'' පුවත්පතේ ලෙස්ලි හොෆ්මාන් ඔහු තවදුරටත් කොමියුනිස්ට්වාදියෙකු දැයි ඇසූ විට ''හැම මිනිසෙකුටම සමානත්වයක් තිබිය යුතු බවත් ආහාර හා කිරීමට රැකියාවක් තිබිය යුතු බවත් මම විශ්වාස කරමි.'' යයි විලිලැජ්ජා නැතිව පවසා තිබේ. අධිරාජ්‍යවාදීන්ගේ මානසික යුද්ධ ක්‍රම (Psychological Warfare) පිළිබඳ විශේෂඥයෙකු වූ සී සී ටු විසින් මේ ද්‍රෝහියාව කොමියුනිස්ට් දර්ශනයටත් මලයානු කොමියුනිස්ට් පක්ෂයටත් චින්පෙන් සහෝදරයා ඇතුළු මලයානු කොමියුනිස්ට් පක්ෂයේ නායකයන්ටත් විරෙහිව තදබල ලෙස උපයෝගි කරගන්නා ලදී. නිර්ධන පංතිකයෙකු වූ කම්කරුවෙකු වූ ලෑම්ස් වී ද්‍රෝහියෙකු වී සතුරාගේ පැත්ත ගෙන පක්ෂයට විරෙහිව අනන්ත අප්‍රමාණ බිහිසුණු අපරාධ කිරීමට ප්‍රථම ඔහුට විරුද්ධව පක්ෂය තුළ පක්ෂ අරමුදල් වංචා කිරීමේ චෝදනාවද විය. මේ ද්‍රෝහියාගේ නින්දිත ක්‍රියාවලියෙන් පංති සතුරා උපරිම ප්‍රයෝජන ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් මලයානු කොමියුනිස්ට් පක්ෂය විශාල පසුබෑසීමකට ගොදුරු වන්නට විය.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ලෑම්ස් වීගෙන් ලත් අත්දැකීම් ඉදිරියට ගෙනයාමේ ප්‍රතිඵලයක් වශයෙන් තවත් මෙවැනි ද්‍රෝහීන් ගණනාවක් බිහිකරගත හැකි විය. මලයානු කොමියුනිස්ට් පක්ෂයට එරෙහිව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ක්වාලාලාම් නුවර පිහිටි මානසික යුද්ධ ක්‍රම දෙපාර්තමේන්තුව ලෑම්ස් වී ද්‍රෝහියා සොයා ගැනීමෙන් පසුව සිය වැඩ කටයුතු ක්‍රමවත් සහ වේගවත් කරන ලදී. මෙලෙස මලයානු කොමියුනිස්ට් පක්ෂයට එරෙහිව ආරම්භ කරන ලද මානසික යුද්ධ ක්‍රමය නම් පක්ෂය ඇතුළතින් බිඳ දමා බේදභින්න කර දුර්වල කර පක්ෂ සාමාජිකයින් කලකිරවා ඔවුන්ගෙන් ඇතැමුන්ට පගාව දී ගැහැණුන් සපයා දූෂණවලට පොලඹවා ඔවුන්ට භාරවන ලෙස යටත්වන ලෙස කටයුතු කර ඔවුන්ගෙන් උපරිම ප්‍රයෝජනගෙන පුනරුත්ථාපනය කිරීමත් ද්‍රෝහීන් ලවා පක්ෂයටත් නායකත්වයටත් ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ගයන්ටත් එරෙහිව නින්දා අපහාස අවලාද නැගීමත් භක්තිමත් කොමියුනිස්ට්වාදීන් ඝාතනය කිරීමත්ය.

මේ වැඩපිළිවෙළ යටතේ පළමුවෙන්ම මලයානු වනාන්තරවල සිටින කොමියුනිස්ට්වාදීන්- විමුක්ති භටයින් අල්ලා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් අවශ්‍ය විය. මේ සඳහා එක්සත්ව සංවිධානාත්මකව දැඩි විනයකින් හා සහෝදරත්වයකින් හා කැපවීමකින් සිටි කොමියුනිස්ට්වාදීන් නායකත්වය කෙරෙහි කලකිරවීමත් මතභේද ඇතිකරවීමත් එමගින් පක්ෂය තුළ මානසික මට්ටම පහත හෙළා තම අරමුණු හා ප්‍රතිපත්ති අමතක කරවා පක්ෂ අභ්‍යන්තරය අවුල්-වියවුල් ජාලාවක් බවට පත් කිරීම එහි අරමුණයි. මේ අනුව කැපවුණ පක්ෂ නායකයින්ට විරුද්ධව මහ පරිමාණයේ අපහාස අවලාද නගන ලදී. එසේ නගන ලද අපහාස නම්:

01. දුගී දුප්පත් පක්ෂ සාමාජිකයින් නොකා නොබී හැකි ඉහළ මට්ටමේ පරිත්‍යාග කරද්දී ඉහළ පෙළේ පක්ෂ නායකයින් තුන්වේලම කමින් කාමසුඛල්ලිකානුයෝගීව සුඛෝපභෝගී ජීවිතයක් ගත කරනු ලබන බවයි.

02. භක්තිමත් හා ශක්තිමත් කොමියුනිස්ට් නායකයින්ගේ චරිත ඝාතනයයි.

03. පක්ෂය ඇතුළත න්‍යායික මත භේද වැපිරීමයි.

මලයානු කොමියුනිස්ට් ව්‍යාපාරයේ නායකයකු වූ ටොම්සන් පවසා ඇති පරිදි මානසික යුද්ධ කිරීමේ ව්‍යාපාරයේ සාර්ථකත්වයේ

මූලික පදනම පවතිනුයේ කැරලිකරුවන් යටත්කර දැමීමේ පැහැදිලි හා දක්ෂ ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් මතය. එවැනි ප්‍රතිපත්තියකට මූලික අරමුණු (3) තුනක් තිබේ.

1. කැරලිකරුවන් භාරවීමට උනන්දු කරවීම.

2. පක්ෂ සාමාජිකයින් සහ ඔවුන්ගේ කැපවුණ නායකයන් අතර මතභේද වර්ධනය කරලීම.

3. කැරලිකරුවන් කෙරෙහි හා ජනතාව කෙරෙහි ආණ්ඩුව පිළිබඳව තහවුරු සහ ක්‍රියාත්මක බලාපොරොත්තුවක් හා ගරුත්වයක් ඇති කරලීමයි.

මේ වැඩපිළිවෙළ ක්‍රියාවට නැගුවේ මෙසේයි. පළමුවෙන්ම ලෑම්ස් වී ද්‍රෝහියාගේ නින්දා සහගත අවලාද මලයානු ගුවන්විදුලියෙන් දිනපතාම භාෂා 12කින් ප්‍රචාරය කර හරින ලදී. ලක්ෂ ගණන් පත්‍රිකා කැළය පුරා ගුවන් මගින් පතුරුවන ලදී. ශබ්ද විකාශන යන්ත්‍ර සවිකරගත් ගුවන් යානා පහළින් පියාසර කරමින් පටිගත කරන ලද ප්‍රකාශන ප්‍රචාරය කරන ලදී. යටත් වූ ද්‍රෝහීන් තරුණියන් සමග පින්තූර ගෙන එම පින්තූර මුද්‍රණය කර එලෙස සැප පහසු ජීවිත ගත කිරීමට භාරවන ලෙස කියා ද්‍රෝහීන්ගේ ආයාචනය සමග බෙදා හරින ලදී. ඊළඟට ගැහැණුන් පිළිබඳ ප්‍රශ්න ඇති කොට දුර්වලයන් භාරකරවීමට විශාල ව්‍යාපාරයක් දියත් කරන ලදී. මේ ව්‍යාපාරය දියත් කොට ටික කලකින්ම ද්‍රෝහී කණ්ඩායම් අණදෙන්නෙකු ගෑනු හුටපටයක් උඩ භාරකරවා ගැනීමට හැකි විය. පසුව ලෑම්ස් වී ද්‍රෝහියා විසින් ලියන ලදුව භාර වූ පෙරාක් හි පස්වැනි විමුක්ති රෙජිමේන්තුවේ කලින් සටන්කළ චින්කුවින් ද්‍රෝහියාගේ අත්සනින් යුතුව පන්ලක්ෂයක් මුද්‍රණය කර බෙදාහරින ලද පත්‍රිකාවක වූ වාක්‍ය ඛණ්ඩයක් මෙසේය.

''සහෝදරවරුනි, මගේ අණදෙන නිලධාරියා මගේ පෙම්වතිය සොරා ගැනීමෙන් පසුව මම භාර වුනෙමි. නිලධාරියාට හොඳ කෑම බීම තිබුණා පමණක් නොව ඔහුට අවශ්‍ය හැම විටෙකම පෙම්වතියන්ද සිටියාය. ඔබට පෙම්වතියක් සිටීද? ඉහළ නිලධාරීන්ට ඔවුන්ගේ කුළුදුල් ආලය කළ හැකිය. නමුත් ඔබට පෙම්වතියක් සොයා ගැනීමට උවමනා වූ විට ඉහළ නිලධාරීන් අතහැර දමන තෙක් ඔබට බලාසිටීමට සිදුවේ.''

මේ නින්දා සහගත ප්‍රකාශය හේතු කොටගෙන ඇතැම් දුර්වලයින් සහ ද්‍රෝහීන් භාරවීම ගැන නොකිවමනාය. පෝගෝනි ලයාන්ග් ප්‍රදේශයේ පක්ෂ ශාඛා ලේකම්වරයකු වූ හිටපු පාසල් ගුරුවරයෙකු

වූ හෝ වියෝන්ග් ඔහුගේ බිරිඳ බැලීමට යාමේ අවශ්‍යතාවය උඩ භාර විය. කොමියුනිස්ට්වාදයට එරෙහිව මානසික යුද්ධ ක්‍රම පිළිබඳ විශේෂඥයකු වූ හා මලයානු යටත්විජිත ආණ්ඩුවේ ආරක්ෂක ලේකම් ''බ්‍රිගේඩ්වලට හෝ කෙල්ලන්ට සමහර කැරලිකාර නායකයින්ගේ ඇති කෑදරකම මානසික යුධ ක්‍රම විශේෂඥයන්ගේ හා ක්‍රියාකාරකයින්ගේ, ක්‍රියාකරවන්නන්ගේ විශාල වාසියට ඉවහල් වේ'' යැයි පවසා තිබේ. ඔහු භක්තිමත් කොමියුනිස්ට්වාදීන්ට අපහාස කිරීමේ චේතනාවෙන් ඉතාමත් කැත නින්දා සහගත කතා ප්‍රචලිත කරන ලදී. මෙසේ ප්‍රචාරය කළ එක් අවලාදයක් නම් ගැහැණුන්ගේ විමුක්තියට ඇති ඒකායන මාර්ගය ඔවුන්ගේ කලිසම් පටි බුරුල් කිරීමයයි මලයානු විමුක්ති හමුදාවේ එක් කොමියුනිස්ට් දේශපාලන කොමසාරිස්වරයකු පවසා ඇති බවයි. මෙවැනි පිළිකුල්සහගත ගපබින්න මහා පරිමාණයෙන් වපුරන ලදී.

මෙසේ නින්දා අපහාස පමුණුවමින් පක්ෂය තුළ විශාල මතභේද ඇති කරවමින් දුර්වලයින් යටත්කරවා ගනු ලැබූ විට ඒ යටත් වූ අයගෙන් ද්‍රෝහීන් වශයෙන් උපරිම ප්‍රයෝජන ගන්නා ලදී. මේ යටත් වූවන් සඳහා පුනරුත්ථාපන කඳවුරු පටන්ගන්නා ලදී. පළමුවෙන්ම ජෝහෝර් ප්‍රදේශයේය. සාමයේ සහ නිසලතාවය ඇකඩමිය නමින් පුනරුත්ථාපන කඳවුරක් තායිපිටරෙන්කෝස් පිටියේ පිහිටෙවුවා. මෙහි 600ක් පමණ විප්ලවවාදීහු පුනරුත්ථාපනය කරනු ලැබුවා. ග්‍රිසියා මැක්ක්‍රෙන්සුන්හි ලැබූ අත්දැකීම් උපයෝගී කරගෙන පසුව මෙවැනි පුනරුත්ථාපන කඳවුරු දුසිම් භාගයක් මලයාව පුරා පිහිටෙවුණා. මේ පුනරුත්ථාපන කඳවුරු මගින් මිනිසුන් කොමියුනිස්ට්වාදයෙන් බිඳවැට්ටවීමට හැකි හැමදෙයක්ම කරනු ලැබුවා. කැළයට හෙළන ලද මුළු කොමියුනිස්ට් විරෝධී පත්‍රිකා ගණන කෝටි පනස් දෙකහමාරක් වනවාලු. කොමියුනිස්ට් ව්‍යාපාරය විනාශ කිරීමට උපයෝගී කරගත්තේ පක්ෂය තුළින් බිහිවූ ද්‍රෝහීන්මයි. කොමියුනිස්ට් පක්ෂයේ පණිවුඩ හුවමාරු අංශයේ ප්‍රධානියා වූ ලි වෙන්ග් සහෝදරයා අල්ලාගත හැකි වූයේ පණිවුඩ හුවමාරු අංශයේ අයට අල්ලස් දී ඔවුන් ගණනාවක්ම ද්‍රෝහීන් කරගෙන ඩබල් ඒජන්තවරුන් කරගෙනයි. කොමියුනිස්ට් පක්ෂයේ වෘත්තීය සමිති නායකයකු වූද දේශපාලන කොමසාරිස්වරයකුව සිටි, සතුරන් අතරට පැන ගිය ද්‍රෝහී ලෑම්ස් වී අද මලයානු රහස් පොලිසියේ නායකයකු වශයෙන් වැඩ කරයි.

කොමියුනිස්ට් පක්ෂයේත් මලයානු විමුක්ති හමුදාවේත් ප්‍රචාරක කටයුතුවල නායකයකු වශයෙන් සිටි ඔස්වාන් මයිනා

මීළඟ ප්‍රධාන ද්‍රෝහියා විය. එවකට අවුරුදු 20 ක් වූ මොහු මුලින් විප්ලවයේ අවසානයේ ජයග්‍රහණය බලාපොරොත්තු අවස්ථාවේ මෙන් උද්‍යෝගයෙන් වැඩ කළාලු. පසුව අධිරාජ්‍යවාදයේ දරුණු මානසික යුද්ධ උපක්‍රම හමුවේ ඇදවැටී අන්ත ද්‍රෝහියකු වූ මොහු මලයානු රහස් පොලිසියේ නිලධාරියාට භාර විය. 1954 දෙසැම්බර් අගදී මෙලෙස සතුරාට භාර වීමෙන් පසුව මේ ද්‍රෝහියා මලයානු කොමියුනිස්ට් පක්ෂයත් එහි නායකත්වයත් මුළුමනින්ම පාවා දුන්නා. සතුරාගෙන් ලැබුණ සුවපහසුකම්වලටත් සතුරාගෙන් ලැබුණු සමාව හා දයාවටත් සතුරාගෙන් ලැබුණු මුදල්වලටත් වහල් වූ මේ ද්‍රෝහියා තමා දැන සිටි හැම කොමියුනිස්ට්වාදියෙකුම පාවාදුන්නා පමණක් නොව හැම කෙනෙකුටම පුද්ගලිකව කැළේට ලියුම් ලියමින් භාරවීමට කටයුතු සැලසුවා. ඔස්වාන් මයිනා සතුරු පස ගෙන ද්‍රෝහියකු වන විට මලයානු කොමියුනිස්ට් පක්ෂයේ ජෙහාන් ප්‍රාන්තයේ නායකයෙකුවයි සිටියේ. ඔහු එම ප්‍රාන්ත කොමිටියේ  තවත් නායකයෙකු වූ හෝ ලෙයුන්ග්ට පණිවුඩ යවා ඔහුවත් සතුරාට යටත්කරනු ලැබුවා. මෙලෙස ද්‍රෝහියෙකු වූ හෝ ලෙයුන්ග් විසින් ද පණිවුඩ යවා ඩේම්සිසෙටාරියස් වෙතට තවතවත් කොමියුනිස්ට්වාදීන් ගෙන්වා භාර කරන ලදි. මේ සඳහා ඔස්වාන් මයිනාට ඩොලර් 80,000 ක ත්‍යාගයකුත් හෝ ලෙයුන්ග්ට ඊට ටිකක් අඩුමුදල් ත්‍යාගයකුත් ලැබුණා. පසුව ඔහු අධිරාජ්‍යවාදී ආණ්ඩුවේ අවශ්‍යතාවය පරිදි රට පුරා කොමියුනිස්ට් විරෝධී රැලි පවත්වමින් කොමියුනිස්ට් පක්ෂයටත් එහි නායකත්වයටත් ප්‍රතිපත්තිවලටත් තදබද ලෙස අපහාස කරමින් බැන වැදුණා. ද්‍රෝහියෙකු වී සතුරා අතට පැනගොස් පක්ෂය පාවාදුන් ඔස්වාන් මයිනා සතුරාගෙන් ලැබුණු ජීවිත දානය සහ මුදල් සම්භාරය හේතුකොටගෙන මහත් ධනවතෙක් වී තායිලන්තයට ගොස් එහි විශාල ව්‍යාපාරයක් වෙනත් නමකින් පවත්වාගෙන යනු ලැබුවා.

මීළඟට අති භයානක ද්‍රෝහියා වූයේ කලක් කැපවුණු දක්ෂතම කොමියුනිස්ට්වාදියෙකු වශයෙන් සිටි හෝ පෙන්තුම් සහෝදරයාගේ මරණයෙන් පසු ජෝහෝර් ප්‍රාන්තයේ ප්‍රධාන අණදෙන නිලධාරියා බවට පත් මලයානු කොමියුනිස්ට් පක්ෂයේ බලවත් ප්‍රදේශය වූ ජෝහෝර් ප්‍රාන්තීය කොමිටියේ නායකයා වූ 1958 දක්වාම සතුරාට එරෙහිව සටන මෙහෙයවූ 42 දී හො-ලුන්ග් ය. මොහු සතුරා අතරට පැනගොස් ද්‍රෝහියෙකුවූවාට පසු මලයානු කොමියුනිස්ට් පක්ෂයට කරන ලද හානිය සුළුපටු නොවේ. 1958 අප්‍රේල් 5 වැනිදා සවස 4ට පසුව කොම්පෙන්ටෙන්ගා ගමේදී අහමඩ් බින්වසීර් නම් වයස 20ක කොස්තාපල් කෙනෙකුට මේ

ද්‍රෝහියා ගොස් භාර විය. ඔහුගේ ජීවිතය බේරාගැනීමේ අටියෙන් මෙය කරන ලදී. එතෙක් මෙතෙක් භාරවූ ඉහළතම කොමියුනිස්ට් නායකයා ලෙස මොහු සැලකේ. මේ ද්‍රෝහියාගේ භාරවීම මාස 4ක් ගතවන තුරු රහසක් වශයෙන් තබා ගත්තා. අධිරාජ්‍ය ගැති ආණ්ඩුව එය රහසක් වශයෙන් තබාගෙන මේ ද්‍රෝහියා නැවතත් කැළයට යැව්වා. මොහු ද්‍රෝහියෙකු වී ඇති බවත් සතුරාට බය වී ඇති බවත් සතුරාට සියල්ල පාවා දී ඇති බවත් සතුරාගේ උවමනාව පිට නැවත පැමිණ ඇති බවත් නොදත් කැපවුණු ප්‍රබල කොමියුනිස්ට්වාදීන් වෙතට ගොස් කැළේ එක් එක් තැන්හි පිහිටි කොමියුනිස්ට් ශාඛා කැඳවා දැන් නිදහස ලැබී ඇති බැවින් අලුත් උපක්‍රමයක් වශයෙන් ප්ලෑන වෙනස් කර ඇති බැවින් සන්නද්ධ විරෝධතාවය දැක්වීම අත්හිටුවන බව පවසා කැළයෙන් එළියට යායුතු බව දැන්වූවා. සත්‍යය නොදත් කොමියුනිස්ට්වාදීන් තම නායකයා විශ්වාස කර සතුරු උගුලට අසු වුණා.

මෙලෙස ප්‍රදේශයෙන් ප්‍රදේශය කණ්ඩායමෙන් කණ්ඩායම විනාශ කළා. අවසානයේදී හෝ ලුන්ග් ද්‍රෝහියා විසින් ඉතාමත් ශක්තිමත් හා භක්තිමත් කොමියුනිස්ට් ඒකක අණදෙන්නන් 28 දෙනෙක් ද කොමියුනිස්ට් විප්ලවවාදීන් ස්ත්‍රී පුරුෂ 132ක් ද අල්ලා දුන්නා. එය මුළු යුද්ධයේම සිදුවූ විශාලතම යටත් වීමයි. අගෝස්තු මාසය අවසන් වන විට රතු බලය වැඩී තිබුණ ජෝහෝර් ප්‍රාන්තය මුළුමනින්ම ධවල බලයට යටවුණා. හෝ ලුන්ග් ද්‍රෝහීයාට ධනපති රාජ්‍යයේ ඩොලර් භාරලක්ෂයක් තෑගි ලැබුණා. මේ සාපරාධී ද්‍රෝහී ක්‍රියාවලට වන්දි වශයෙන් එවකට අධිරාජ්‍යගැති ආණ්ඩුවේ අගමැති තුන්කු අබ්දුල් රහමන් පැවැසුවා. ''ඔහු දැන් අපටත් වඩා ධනවත්ය'' කියලා. හෝ ලුන්ග් ද්‍රොහියාට මෙතරම් මුදලක් දීම ගැන කතා කරමින් ඔහු වැඩිදුරටත් කීවා, ''අපි ප්‍රතිඵල ලබාගත යුතුයි. අපට ප්‍රතිපත්තිවල තදින් ඇලී සිටිය නොහැකියි. අවසානය මිලදී ගැනීම මුදලට පුළුවන්නම් අපි ප්‍රයෝජනයට ගත යුතුයි. ප්‍රතිපත්ති වශයෙන් නම් සත්තකින්ම හෝ ලුන්ග්ව එල්ලිය යුතුයි'' යනුවෙන්. අද මේ ද්‍රෝහියා පක්ෂයට විශාල ව්‍යසනයක් කර ධනපති රජයේ මුදල් පරිත්‍යාග හා සමාව යටතේ වෙනත් නමකින් විශාල දැව කොම්පැනියක ධනපති ස්වාමියා වශයෙන් ජීවත් වෙයි.

මා මෙහි ඉතාමත් සැකෙවින් කරුණු ඉදිරිපත් කළේ මලයානු කොමියුනිස්ට් ව්‍යාපාරය තුළ බිහි වූ ද්‍රෝහීන් කිහිප දෙනෙක් ගැන. අද එම උපක්‍රමයම උපයෝගි කරගනිමින් ලංකාවේ ජනතා විමුක්ති

පෙරමුණ විනාශ කිරීමට පංති සතුරා කටයුතු කරගෙන යන හෙයිනුයි. දෙවැනි ලෝක මහා යුද්ධයෙන් අනතුරුව මුළු මහත් ගිනිකොණදිග ආසියාවම පුරා පැනනැගි විප්ලවවාදී වඩදිය රැල්ලෙහි කැපී පෙනෙන ප්‍රමුඛස්ථානයක් ගත් තැනක් තමයි මලයාව. මලයානු කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයෙන් කෙරුණු මලයානු විමුක්ති සටන මර්දනය කිරීමට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ටත් දේශීය ප්‍රතිගාමීත්වයටත් විශාල ලෙස කරදර වන්නට සිදු වුණා. මෙන්න මේ දුෂ්කර ක්‍රියාදාමයේදී උපයෝගී කරගත් විවිධාකාර වූත් පිළිකුල් සහගත වූත් උපක්‍රම මාලාව තමයි තවදුරටත් වැඩි දියුණු කර අපේ රටේ විප්ලවවාදී ව්‍යාපාරය - ජනතා විමුක්ති පෙරමුණ - විනාශ කිරීම සඳහා ලාංකීය ප්‍රතිගාමී පාලක පක්ෂය අද උපයෝගී කරගනිමින් සිටිනුයේ.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීහු මලයානු කොමියුනිස්ට් පක්ෂයට එරෙහිව ප්‍රහාරය යුදමය වශයෙන් මෙන්ම දේශපාලන හා ආධ්‍යාත්මික වශයෙන්ද කරගෙන ගියා. මානුෂික යුද උපක්‍රම උපයෝගී කරගත්තා. මේ අනුව පක්ෂය ඇතුළතින් බිඳවීමත් අල්ලස් දී ද්‍රෝහීන් දිනාගැනීමත් අවලාද නැගීමත් කැප වුණු අය ඝාතනයත් සෙස්සන්ට භාරවීමට සැලැස්වීමත් භාරවුණ අය පුනරුත්ථාපනය කිරීමත් ද්‍රෝහීන් ලවා එක් පැත්තකින් පක්ෂයට එරෙහිව එහි නායකත්වයට එරෙහිව අවලාද අපහාස ව්‍යාපාරයක් දියත් කිරීමත් ද්‍රෝහීන් උපයෝගී කරගෙන පක්ෂයේ අනිත් අය අල්ලවා ගැනීමත් ද්‍රෝහීනට සමාව හා විශාල මුදල් ත්‍යාග කිරීමත් වැනි මානුෂික යුද්ධ උපක්‍රමත් හැඳිනීම්පත් නිකුත් කිරීමත් මුඩුක්කු සංහාරය වැනි උපක්‍රමත් සියල්ල මලයාවේ මෙන්ම අද ලංකාවේත් ඒ පරිදිම උපයෝගී කරගන්නවා. වෙඩි උණ්ඩවලින් කළ නොහැකි විනාශය ඔවුන් මුදල් බලයෙන් කළා. මලයාවේ කොමියුනිස්ට් විරෝධී ප්‍රහාරය භාරව සිටි ජෙනරාල් ජෙරල්ඩ් ටෙම්ප්ලර් 1945 දෙවන ලෝක මහා යුද්ධයෙන් අනතුරුව ජර්මනියේ බ්‍රිතාන්‍ය කලාපයේ යුද්ධ ආණ්ඩුකාරයා විය. යුද්ධයෙන් වැහැරී ගිය හෙම්බත් වුණු විනාශ වුණු සාගින්නෙන් පෙළුණු ජර්මනිය කොමියුනිස්ට් විප්ලවයකින් ගලවා ගැනීමේ කර්තව්‍යය ඔහු හමුවේ තිබුණා. ඔහුගේ දර්ශනය මේ පිළිබඳව මෙසේය. ''අමාරුවේ වැටුණු මිනිසුන්ට ලොකු ඇමක් දීමට ඔබට සිදුවෙයි.'' ඔහු ජර්මන් ජනතාවට යැංකි ඩොලර් පොරොන්දු වුණා. එලෙසින්ම මලයානු කොමියුනිස්ට් පක්ෂය තුළ සිටි ද්‍රෝහීන්ට මුදල් පසුම්බි පොරොන්දු වුණා. කොමියුනිස්ට් ක්‍රමය විනාශ කිරීම අරභයා මුදල් දී ද්‍රෝහීන් දිනාගැනීමේ ක්‍රමය කෙතෙක්දුරට උපයෝගී

කරගත්තාද යනු බ්‍රිතාන්‍යය කම්කරු ආණ්ඩුවේ යටත්විජිත ලේකම් ජේම්ස් ග්‍රීෆේක් මලයාවේ සංචාරයට පැමිණි විට මෙන්ට කැබිස් අසල සෙමෙන්ටන් වතුයායේ වතුහිමියා මෙසේ කියා තිබේ. ''මරනු ලැබූ සෑම මංකොල්ලකරුවකු සඳහාම ඩොලර් දශලක්ෂයක් වියදම් වීමෙන් එම ව්‍යාපාරයේ කුමන හෝ වරදක් තිබිය යුතුය. මට ඩොලර් දශලක්ෂයක් දෙන්න, මම ඔබට ස්ටාලින් ගෙනැත් දෙන්නම්'' මෙයින් හැඟෙනුයේ මිනිසුන්ට මුදල් පගාව වශයෙන් දී සතුරු පසට දිනාගෙන ද්‍රෝහීන් බවට පත් කරගෙන එමගින් ව්‍යාපාරය විනාශ කරලීමට ඇති අරමුණයි.

මලයානු විමුක්ති සටනේදී උදාර ලෙස දිවිපිදු 6,698ක් වූ කොමියුනිස්ට් විප්ලවවාදීන්ගේත් 2,810 ක් වූ තුවාල ලැබූ කොමියුනිස්ට්වාදීන්ගේත් 1,286ක් අල්ලාගනු ලැබ සිරගත වූවන්ගේත් ව්‍යාපාරය නිෂ්ඵල කිරීමට පක්ෂය තුළින්ම බිහිකරගත් හෝ - ලූන්ග්, ලෑම්ස් වී , හෝ ලෙයුන්ග් , ඔස්මන් මයිනා වැනි ද්‍රෝහීන් පංති සතුරා විසින් උපයෝගී කරගනු ලැබුවා. මේ තත්වයන්මයි, මේ ක්‍රියාමාර්ග යන්මයි, මේ උපාය උපක්‍රමයන්මයි අපට එරෙහිවත් පංති සතුරා විසින් උපයෝගී කරගත්තේ.

මලයාව පිළිබඳ ධනේශ්වර පාලක පංතිය හෝ සලකනුයේ ලෝකයේ පළමු වැනි වරටකොමියුනිස්ට් ගරිල්ලා භටයින්ට එරෙහිව සාර්ථකව අරගල කර කොමියුනිස්ට් ගරිල්ලා භටයින් පරාජයට පත්කළ ස්ථානය වශයෙනුයි. මෙන්න මේ නිසා එරටත්, මෙරටත් අතර ඇති ඇතැම් සමානත්වයන් නිසාත්, අසල්වැසි රටක්වීමත්, දෙගොල්ලගෙන්ම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය සමග ඇති සබඳතාවය නිසාත්, මලයානු අත්දැකීම් මෙහිදී වඩාත් සංවර්ධනය කර උපයෝගි කරගැනීමට පංති සතුරාට අවස්ථාව ලැබී තිබේ. මේ අනුව මලයාවෙන් ඔවුන් පසුගිය කාලයේ විශාල වශයෙන් උපදෙස් ලබාගෙන ඇත. ලංකාවේ රහස් පොලිසියේ නිලධාරීන් (පැටිකිරි කෝරාළ) මලයාවට යවා පුහුණුව ලබාදී ඇත. මලයානු ප්‍රතිවිප්ලවවාදීන් ලැබූ අත්දැකීම් ඉගෙන ගෙන ඇත. මලයාවේ කොමියුනිස්ට් ගරිල්ලන්ට එරෙහිව මානසික යුද්ධ ක්‍රම ක්‍රියාවට නැගීම භාරව සී සී ටූ හිටියා මෙන්ම මෙහිත් ඉයන් වික්‍රමනායක එම අංශය මෙහෙයවන බව පෙනී යයි. එහි රහස් පොලිසියේ විශේෂ අංශය ක්‍රියාත්මක වු අයුරින්ම මෙහිත් රහස් පොලිසියේ විශේෂ අංශ ක්‍රියාත්මක වන බව පෙනේ. එහිදී මෙන්ම මෙහිදීත් කොමියුනිස්ට්වාදීන් ත්‍රස්තවාදීන් ලෙස හංවඩු ගැසිණි. එහිදී මෙන්ම මෙහිදී කැපවුණු භක්තිමත් කොමියුනිස්ට්වාදීන් ඝාතනය

කෙරිණි.

එහිදී මෙන්ම මෙහිදී කැපවුණු පක්ෂ නායකයන්ට නින්දා අපහාස නගති. චරිත ඝාතනය කරති. බොරු අවලාද නගති. එහි දී මෙන්ම මෙහිදීත් පක්ෂයේ ප්‍රතිපත්ති අරමුණු ක්‍රියාමාර්ග හා උපාය උපක්‍රම විකෘති කොට මුසාවාද දේශනා කරති. එහි දී මෙන්ම මෙහිදී ද කැළයට ගුවනින් පත්‍රිකා බෙදාහැරීම මගින් යටත්වන ලෙස ඉල්ලුවා. එහි දී මෙන්ම මෙහිදීත් පුනුරුත්ථාපන කඳවුරු පිහිටෙව්වා. එහිදී මෙන්ම මෙහිදීද දුර්වලයින් සහ ද්‍රෝහීන් අල්ලා ගත්තා. උන්ට ජීවිත දානය මුදල් පසුම්බි වෙනත් තාන්න මාන්න පහසුකම් හා නොයෙකුත් පොරොන්දු මගින් උන් ලවා පක්ෂයටත්, පක්ෂ නායකයන්ටත් අපහස කරවීමටත් එමගින් ජනතාව රැවටීමටත් පක්ෂය විනාශ කිරීමටත් කටයුතු කරගෙන යනවා. එහි දී මෙන්ම මෙහිදීත් හැඳිනීම්පත් නිකුත් කිරීම හා පැල්පත් කඩාබිද දැමීම වැනි ක්‍රියා කරගෙන යනවා. එහිදී මෙන්ම මෙහිදීත් ඩබල් ඒජන්තවරුන් පක්ෂය විනාශ කිරීමට, පක්ෂයට එරෙහිව ප්‍රයෝජනයට ගන්නවා. මේ සියලු තත්වයන් මෙසේ තිබියදීත් ලොකු අතුලලා, ටී.ඩී. සිල්වලා, කුමානායකලා, පියතිලකලා, පොඩි අතුලලා, සුනන්දලා, කුලරත්න බණ්ඩලා★ වැනි කී නොකී විවෘත හා ආවෘත වෛවාරණ්‍ය වෙස්මුහුණු පැළඳගත් ද්‍රෝහීන් පක්ෂයට එරෙහිව පංති සතුරා සමග එළිපිට හෝ රහසින් මිතුරු වී කොතෙකුත් සාපරාධී අපරාධයන් කළත්, මලයාවේ කළායැයි ධනේශ්වර පංතිය උදම් අනන දෙය ඔවුන්ට මේ රටෙහි ඉටුකර ගත් බවට උදම් ඇනීමට කිසිදාක ඉඩ නොලැබෙනු ඇතැයි මම තරයේම විශ්වාස කරමි. අපේ ඒ උදාර විශ්වාසය පැතුම ඉටුකිරීමට මුළු ශක්තිය යොදා මුළු හැකියාවම යොදා, මුළු දක්ෂතාවයන්ම යොදා උපරිම විප්ලවීය ජීව ගුණයෙන් අවංක සහ ඇපකැප වුණු වර්ධනය වුණු ප්‍රශ්න තේරුම් ගත් සහෝදරවරු ක්‍රියාකරනු ඇතැයි මම උදක්ම බලාපොරොත්තු වෙමි. ඔව්! සතුරා අපට අනුකම්පා විරහිතව දේශපාලන පහර දෙයි. අප අතර සිටි ද්‍රෝහීන් හවුල් කරගෙන, බියගුල්ලන් හා සැඟවුණු අවස්ථාවාදීන් දිනාගෙන අප විනාශ කර දැමීමේ අධිෂ්ඨානයෙන් අපට නින්දිත ලෙස හා අවිචාරවත් ලෙස පහර පිට පහරදෙයි. අපේ සහෝදරවරු උදාසීන කරවීමටත්, කළකිරවීමටත්, ඇතුළතින් පක්ෂය බිඳදැමීමටත්, සාමාජිකත්වය හා නායකත්වය අතර බිඳීමක් ඇතිකිරීමටත් අවංක මිනිසුන් හා මිතුරන් එකිනෙකා අතර කෙටවීමටත් ව්‍යාපාරය කැබලිවලට කඩා දුබල කර දැමීමටත් ව්‍යාපාරය දියකර හැරීමටත් සතුරාගේ සැඟවුණු


ප්‍රකාශක සටහන්:
★. පියසිරි කුලරත්න

ඒජන්තවරුන් අතට ව්‍යාපාරයේ කැබලි කඩා ගැනීමටත් ජනතාව අතර ව්‍යාපාරයට හිමි තැන අහිමි කිරීමටත් සෑම සියලු නින්දිත සටකපටකමක්ම උපක්‍රමයක්ම ප්‍රයෝජනයට ගනිමින් කටයුතු කරයි.

සතුරාගේ මේ තිරස්චීන හා අවිචාරවත් දේශපාලන ප්‍රහාරය හමුවේ අප ඇද වැටෙමුද? නැතිනම් නැගී සිටිමුද? සතුරාගේ දුෂ්ට මානසික යුද්ධ උපක්‍රම හමුවේ අපි පරාජය වෙමුද? නැතිනම් ජයග්‍රහණය පතා ප්‍රතිප්‍රහාරය දෙමුද? සතුරාගේ මානසික යුද්ධ උපක්‍රමවලට එරෙහිව තීරණාත්මක අධිෂ්ඨාන සහගත මුළු වෙර යොදා අප නැගී සිටිය යුතු යැයිද නැගී සිටිය හැකි යැයිද අපි තරයේම කියන්නෙමු. ඔව්! ඒ හැර අන් මගක් අපට නැත. පුනරුත්ථාපන කඳවුරුවලත්, පිටතත්, ජනතාව අතරත්, පන්ති සතුරාගේ මේ මානසික යුද්ධක්‍රම අවලාද අපහාස සහ සියලු ද්‍රෝහී ක්‍රියා එළිදරව් කරමින් ඒවාට තීරණාත්මකව ප්‍රතිප්‍රහාර දෙමින් එයට එරෙහිව මතවාදීමය අරගලයක් මහා පරිමාණයෙන් දියත් කිරීමේ අවශ්‍යතාවය අද උදාවී තිබේ. කට වචනයෙනුත් ලිපි ලේඛන මගිනුත් මේ ප්‍රතිප්‍රහාරය මහා පරිමාණයෙන් කළ යුතුව ඇත. එමගින් පමණි, ජනතාවට සත්‍යය එළිදරව් කරලිය හැක්කේ. අපට එරෙහිව කුරිරු ධනපති පාලක පංතිය කරගෙන යන මේ නින්දාසහගත මානසික යුද්ධයේදී විප්ලව සළුපළි පොරවාගත් සෑම සියලු අවස්ථාවාදී කණ්ඩායමක්ම පාලක කල්ලිය හා එක් වී අත්වැල් බැඳගෙන සිටී. පසුගිය කාලයේ හා මෑතකදී රහස් පොලිසිය හා ඉයන් වික්‍රමනායක හරහා පැමිණි අයගෙන් ගණනාවක්ම සතුරා ඉදිරියේ දණින් වැටී කෙළින්ම සතුරු පක්ෂය ගත් අතර තවත් පිරිසක් සතුරා ඉදිරියේ දණින් වැටී සතුරු පක්ෂය රහසින් ගෙන තවදුරටත් සැඟවී වෙස් වලාගෙන සිටිමින් සතුරාට සේවය කිරීමටත් පක්ෂයට ද්‍රෝහීකම් කිරීමටත් වලිකනවා. පිරිසක් ඩබල් ඒජන්තවරුන් වශයෙන් සැඟවී සිටිනවා. මේ සියලු දෙනාම එකෙක් නෑරම සේවය කරනුයේ පංති සතුරාටයි. ධනේශ්වර ක්‍රමයටයි. මේ සඳහා උන් විවිධ ක්‍රම පමණක් උපයෝගීකර ගන්නවා. මේ සියලු ද්‍රෝහීන් හා උන්ගේ ක්‍රියා කලාපයන් ජනතාව අතර අප විසින් හෙළිකළ යුතුව තිබෙනවා. රහස් පොලීසියේ පියන්ලා බෝයිලා කෝකියන් වී සිටිය අය අපට එරෙහිව අවලාද නැගීම නරක දෙයක් යයි මම කිසිසේත්ම නොසිතමි. පුදුමය උන් විප්ලවය ගැන නැවතත් කතා කිරීමයි. දැන් උන්ගේ ''මාක්ස්වාදය'' නම් හතරවන තට්ටුවෙන් උගත් ''හතරවෙනි තට්ටුවේ මාක්ස්වාදයයි. හතරවන තට්ටුවෙන් උගත් මාක්ස්වාදය අනුවයි, මේ ද්‍රෝහීන් අපට

අවලාද නගනුයේත් පරිභව කරනුයේත්. ඒ ගැන ප්‍රථමයෙන්ම හොඳින් තේරුම් ගෙන ජනතාවටත් හොඳින් තේරුම් කර දියයුතුව තිබේ.

අපට එරෙහිව පන්ති සතුරා සමග එකතුවී පංති සතුරා වෙනුවෙන් අවලාද නගන්නෝ කවරහුද? එක්කෝ නොයෙකුත් පුද්ගලික බලාපොරොත්තු ලාභාපේක්ෂාවෙන් පක්ෂය තුළට පැමිණ බලාපොරොත්තු සුන් කරගත් අයයි. නැතහොත් පක්ෂයට මහත් ද්‍රෝහීකම් කර ඇති පක්ෂ අරමුදල් වංචාකර ඇති පක්ෂයේ නාමයෙන් අයුතු ප්‍රයෝජන ගෙන ඇති අයයි. එසේ නැතහොත් තම ජීවිත ගලවා ගැනීමට තම කිට්ටුවරයින් හා ඥාතිවරයින් බේරා ගැනීමට (සිරගෙයින් නිදහස් කරවා හරින පොරොන්දුව පිට) ධනේශ්වර රාජ්‍ය යාන්ත්‍රණය ඉදිරියේ පක්ෂය මුළුමනින්ම පාවා දුන්නවුණුයි. එසේත් නැත්නම් සතුරු කණ්ඩායම් අතරට පලාගිය අයයි. මොවුන් එකෙක් නෑරම අද ධනේශ්වර රාජ්‍ය යන්ත්‍රයේ පංති සතුරාගේ සුවච කීකරු ශ්‍රාවකයින් වී ඇත. අද උන්ගේ එකම අරමුණ එකම අභිප්‍රාය නිර්ධන පංති ව්‍යායාමය විනාශ කරලීමයි. ජනතා විමුක්ති පෙරමුණ පාවාදුන් එහි කැපවුණු සහෝදරවරුන් දහස් ගණනින් පන්ති සතුරාට බිලිකරදුන් මේ ද්‍රෝහීන් රොත්ත අද ධනේශ්වර රාජ්‍ය යාන්ත්‍රණයේ විවිධ ආයතන සමග නොයෙකුත් සබඳකම් පවත්වමින් ලාංකීය විප්ලවයට එරෙහිව විශාල කුමන්ත්‍රණයක යෙදී සිටිනවා. මේ මහා කුමන්ත්‍රණයේ විවිධ පියවරයන් වශයෙන්ය, ද්‍රෝහීන් විසින් ජනතා විමුක්ති පෙරමුණටත් එහි නායකත්වයටත් පෞද්ගලිකව මටත් එරෙහිව අනන්ත අප්‍රමාණ බොරු බේගල් නින්දා අපහාස අවලාද හා අවමාන කරනුයේත් ලොකු අතුලලා වැනි ද්‍රෝහීන් බොරු සාක්ෂි දෙනුයේත්. පොඩි අතුලලා සුනන්දලා පියතිලකලා පියසිරිලා.... හා තවත් එවැනි ද්‍රෝහීන් බොරු සාක්ෂි මෙහෙයවනුයේත් එළියේ සිටින සහෝදරවරුන් සහ කඳවුරු තුළ වැඩකරන සහෝදරවරුන් පාවාදෙනුයේත් පක්ෂය තළ සිටි ද්‍රෝහීන් සහ ඒජන්තවරුන් සියලු දෙනාමත් සකලවිධ අවස්ථාවාදීන් සියලු දෙනාමත් ධනේශ්වර රාජ්‍ය යාන්ත්‍රණයත් යන සියලු දෙනාමත් අද ජනතා විමුක්ති පෙරමුණට එරෙහිව මහා කුමන්ත්‍රණයක් සඳහා එකට එක්සත්වී සිටියි. ද්‍රෝහීන්ගේත් සතුරන්ගේත් මේ එක්සත් පෙරමුණට කුමන්ත්‍රණ කිරීමට ඒවා සාර්ථක කරගැනීමටත් ඉඩදෙමුද? ජනතා විමුක්ති පෙරමුණ විනාශ කිරීමට ඉඩ දෙමුද? නොඑසේ නම් පන්ති සතුරා හමුවේ, උන්ගේ ව්යරු ප්‍රහාරය හමුවේ අභීතව නැගී සිට නිර්ධන පංතික ව්‍යායාමය සුරකිමුද? ජනතා විමුක්ති පෙරමුණ නැවත

ගොඩනගමුද? ජනතා විමුක්ති පෙරමුණත් විප්ලවවාදී ව්‍යාපාරයත් සමූල ඝාතනය කිරීමේ කුරිරු චේතනාවෙන් විදේශීය අධිරාජ්‍යවාදීන්ගේ ආධාර අනුබලය හා උපදෙස් සහිතව ලාංකීය ධනේශ්වර පාලක පංති විසින් සිදුකරන ලද ප්‍රතිවිප්ලවයේ දී ජනතා විමුක්ති පෙරමුණ තුළට රිංගාගෙන සිටි සතුරු ඒජන්තලා සියලු දෙනාමත් දෙනාමත් පක්ෂය තුළ බිහිවී සිටි ද්‍රෝහීනුත් ධනේශ්වර ප්‍රතිවිප්ලවයට කෙළින්ම හා වක්‍රව දැනුවත්ව හා නොදැනුවත්ව උදව් කර තිබේ. මේ ද්‍රෝහීන් විසින් සතුරු ඒජන්තවරුන් විසින් දස දහස් ගණනක් විප්ලවවාදීන් රවටා තිබේ. වංචා කර තිබේ.

සතුරා අවි අමෝරාගෙන විශාල බිහිසුණු මිනිස් ඝාතනයකට සූදානම් වී ප්‍රකෝපකාරී ක්‍රියා කරන විට ව්‍යාපාරය තුළ සිටි ද්‍රෝහීන් හා සතුරු ඒජන්තවරුන් අවංක සහෝදරවරුන් රවටා ව්‍යාපාරයේ තීරණයක් යයි විජේවීර සහෝදරයාගේ දැනුමපිට කෙරෙන්නේ යැයි (මා යාපනයේ බන්ධනාගාරයේ සිට පහරදීමට යයි දන්වා එවූ බව සහමුලින්ම සාවද්‍ය ඔප්පුකළ නොහැකි අවලාදයක් ද්‍රෝහීන් විසින් නගමින් සිටී) මහා බොරුබේගල් ඇදබා දස දහස් ගණන් වටිනා විප්ලවවාදීන් වංචනික ලෙස සතුරාගේ මරුකටට දක්කවා තිබේ. ඇතැම් අවංක සහෝදරවරු අවසාන මොහොතේදී හෝ මෙය තේරුම් ගෙන ඇත. එහෙත් දහස් ගණන් ව්‍යාපාරයට භක්තිමත් වූ විප්ලවයට කැපවූ අවංක අව්‍යාජ විප්ලවවාදී සහෝදර සහෝදරියන් ද්‍රෝහීන් විසින් තමන් රවටනු ලැබූ බව තමන් පාවා දෙනු ලැබ ඇති බව නොදැන ධනේශ්වර ප්‍රතිවිප්ලවයේ මරුකටට ගොදුරු වුණා. ධනේශ්වර ප්‍රතිවිප්ලවයේ මරුකටින් යන්තම් බේරී ජීවිත රැකගත් විප්ලවවාදී සගයිනි! ධනේශ්වර ප්‍රතිවිප්ලවය මගින් ගිලගත් ඒ ශ්‍රේෂ්ඨ විප්ලවවාදීන්ගේ අමරණීය නාමය කල්පයක් පවතින්නට ඔවුන් වෙනුවෙන් සදා නොනැසෙන ස්මාරකයක් ලෙසින් සැබෑ සමාජවාදී සමාජයක් මේ පොළොව මත බිහි කරන්නට දිවිදුන් සගයින්ගේ අරමුණු ඉටු කරන්නටත් අප ධෛර්යයෙන් කටයුතු කළ යුතුයි. ඒ සඳහා ප්‍රතිවිප්ලවකාරී පාවාදෙන්නන්, ද්‍රෝහීන් හා ඔවුන්ගේ ද්‍රෝහීකම් හොඳින් වටහාගෙන ඒවා පරාජය කළ යුතුයි.